# ආසියානු සංවර්ධන බැංකුව

**ආසියානු සංවර්ධන බැංකුවේ මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය**

*තොරතුරු අනාවරණය කිරීම හා හුවමාරු කිරීම*

2005

මාර්තු

## සංක්ෂේපණ

| | |
|---|---|
| අ. ඇ. සං. බැං. | - අන්තර් ඇමෙරිකානු සංවර්ධන බැංකුව |
| අ. ස. ම. | - අනුකූලතාව සමාලෝචනය කිරීමේ මණ්ඩලය |
| ආ. සං. අ. | - ආසියානු සංවර්ධන අරමුදල |
| ආ. සං. බැං. | - ආසියානු සංවර්ධන බැංකුව |
| ජා. මූ. සං. | - ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව |
| ම. අ. උ. ක. | - මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව |
| ප්‍ර. සං. යු. බැං. | - ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වන යුරෝපීය බැංකුව |
| බ. ආ. ආ. ඒ. | - බහු පාර්ශ්වික ආයෝජන ආරක්ෂණ ඒජන්සිය |
| බ. පා. සං. බැං. | - බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුව |
| බා. ස. කා. | - බාහිර සබඳතා කාර්යාලය |
| යු. ආ. බැං. | - යුරෝපීය ආයෝජන බැංකුව |
| වි. ව්‍යා. ප. ස. | - විශේෂ ව්‍යාපෘති පහසුකම් සලසන්නා |

# අර්ථ දැක්වීම් (Definitions)

"බලපෑමට පාත්‍ර වූ ජනයා" යන්නෙන් අදහස් කරනුයේ ආසියානු සංවර්ධන බැංකුවේ (ආ. සං. බැං.) සහාය ලද ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් මඟින් අර්ථදායී හෝ පීඩාකාරී බලපෑමට පාත්‍ර විය හැකි ව තිබෙන පුද්ගලයන් ය.

"ඇගයීම" යන්නෙන් අදහස් කරනුයේ (i) රාජ්‍ය අංශයේ ව්‍යාපෘති හෝ වැඩසටහන් සම්බන්ධයෙන් නම්, ඇගයීම් මෙහෙවර හෝ ඇගයුම් මෙහෙවර අත්හැර දමනු ලබන්නේ නම් එවැනි අත්හැරීම් අනුමත කරනු ලබන සමාලෝචන රැස්වීම හා (ii) පුද්ගලික අංශයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් නම් පුද්ගලික අංශ ණය කමිටුව විසින් කරනු ලබන ව්‍යාපෘති සමාලෝචනය අනුයන මෙහෙවර ය.

"බලපෑමට පාත්‍ර වූ ජනයාට ලබා ගත හැකි" යන්නෙන් අදහස් කරනුයේ බලපෑමට පාත්‍ර වූ ජනයාට තේරුම් ගත හැකි උචිත රූපයෙන්, ආකාරයෙන් හා භාෂාවකින් හා ළඟා විය හැකි ස්ථානයක දී ලබා ගත හැකි ය යන්න ය.

"මණ්ඩලය" යන්නෙන් වෙනත් යමක් විශේෂ කොට දක්වන්නේ නැත්නම්, එයින් අදහස් කරනුයේ ආ. සං. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය යි.

"ලේඛනයක්" සම්පූර්ණ කිරීම යන්නෙන් අදහස් කරනුයේ ලේඛනය සූදානම් කිරීම දක්වා සහ එය සූදානම් කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ආ. සං. බැංකු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලන අවධිය ඇතුළත් යන්න ය.

"රහස්‍ය ව්‍යාපාරික තොරතුරු" යන්නෙන් අදහස් කරනුයේ ආ. සං. බැං. එහි සේවා දායකයන්, උපදේශකයන්, සමුපදේශකයන් හා වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇති කර ගන්නා රහස්‍ය භාවය රැකීමේ ගිවිසුමක් නැත හොත් තොරතුරු අනාවරණය නො කිරීමේ ගිවිසුමක් මඟින් ආවරණය කෙරෙන තොරතුරු ය.

"අවසාන වාර්තාව" යන්නෙන් අදහස් කරනුයේ (i) අවසාන වාර්තාවක් ලෙස විධිමත් ව ආ. සං. බැං. වෙත ඉදිරිපත් කරනු ලබන; (ii) ආ. සං. බැංකුවේ සහාය ලද ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සූදානම් කිරීමේ දී ප්‍රමාණවත් ගුණාත්මක මට්ටමක් උපයෝගී කර ගත යුතු බවට ආ. සං. බැං. නිර්ණය කර තිබෙන; හා (iii) තව දුරටත් වෙනස් කිරීම් අනවශ්‍ය වාර්තාවකි.

"ඓතිහාසික තොරතුරු" යන්නෙන් අදහස් කරනුයේ තව දුරටත් "සක්‍රිය" නො වන ආ. සං. බැංකුවේ සහාය ලද ව්‍යාපෘති, වැඩසටහන්, ප්‍රතිපත්ති හා පොදු මෙහෙයුම් සම්බන්ධ තොරතුරු ය.

"ප්‍රසිද්ධියේ ලබා ගත හැකි" යන්නෙන් අදහස් කරනුයේ ආ. සං. බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි යන්න ය.

"යළි පදිංචි කර වීමේ සැලැස්ම" යන්නෙන් අදහස් කරනුයේ කලින් කලට සංශෝධනය කෙරෙන පරිදි අස්වේච්ඡාවෙන් යළි පදිංචි කර වීම් පිළිබඳ ආ. සං. බැංකු ප්‍රතිපත්තියට අනුකූල ව සකසනු ලබන කවර හෝ සම්පූර්ණ/කෙටි යළි පදිංචි කර වීමේ සැලැස්මක් හා අස්වේච්ඡාවෙන් යළි පදිංචි කර වීම් සම්බන්ධ මෙහෙයුම් අත්පොතෙහි (Operations Manual) එෆ් 2/ඕපී වගන්තිය යි.

"යළි පදිංචි කර වීමේ රාමුව" යන්නෙන් අදහස් කරනුයේ අස්වේච්ඡාවෙන් යළි පදිංචි කර වීම සම්බන්ධ මෙහෙයුම් අත්පොතෙහි ඕප් 2/ඕපී වගන්තියට අනුකූල ව සූදානම් කෙරෙන කවර හෝ යළි පදිංචි කර වීමේ රාමුවකි.

"මූලෝපාය හා වැඩසටහන ඇගයීම්" යන්නෙන් දිළිඳුකම පිළිබඳ විශ්ලේෂණ; ආර්ථික විශ්ලේෂණ; ස්ත්‍රී/පුරුෂ භාවය, රාජ්‍ය පාලනය, පරිසරය හා පුද්ගලික අංශයේ තේමාගත විශ්ලේෂණ; සහ මූලෝපායක් හා වැඩසටහනක් සූදානම් කිරීමේ දී භාර ගනු ලබන අංශ ඇගයීම් ගැන සඳහන් කෙරේ. එයට එවැනි ඇගයීම්වලට කෙරෙන යාවත්කාල කිරීම් ද ඇතුළත් වේ.

"මූලෝපාය හා වැඩසටහන" එසේත් නැත හොත් "මූලෝපායන් හා වැඩසටහන්" යන්නෙන් අදහස් කරනුයේ කවර හෝ රාෂ්ට්‍රීය (country) මූලෝපායක් හා වැඩසටහනක්, රාෂ්ට්‍රීය මූලෝපායක් හා වැඩසටහන් යාවත්කාල කිරීමක්, කලාපීය සහයෝගිතා මූලෝපායක් හා වැඩසටහනක් එසේත් නැත හොත්, කවර හෝ සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටක් සඳහා සූදානම් කරන ලද කලාපීය සහයෝගිතා මූලෝපායක් හා වැඩසටහන් යාවත්කාල කිරීමක් ය.

අනුමත කරන ලද, බෙදා හරින ලද, සම්පූර්ණ කරන ලද, තහවුරු කරන ලද, සාකච්ඡා කරන ලද, නිකුත් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද "කල්හි" යන්නෙන් අදහස් කරනුයේ අනුමත කරනු ලැබීමෙන්, බෙදා හරිනු ලැබීමෙන්, සම්පූර්ණ කරනු ලැබීමෙන්, තහවුරු කරනු ලැබීමෙන්, සාකච්ඡා කරනු ලැබීමෙන්, නිකුත් කරනු ලැබීමෙන් හෝ ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරු ව සාමාන්‍යයෙන් ප්‍රායෝගික විය හැකි හා සති 2කට (කැලැන්ඩර දින 14ක්) වඩා කල් ගත වීමට මත්තෙන් හැකි තරම් ඉක්මනින් යන්න ය.

## සටහන්

මේ වාර්තාව තුළ "$" යන්නෙන් සඳහන් වන්නේ එක්සත් ජනපද ඩොලර් බව සලකන්න.

මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය ("වනු ඇත") යන අනාගත කාල රූපය භාවිත කරනුයේ සමහර කර්තව්‍යයන් හෝ ක්‍රියාකාරකම් ඉටු කිරීමට ආ. සං. බැංකුවට පවතින අභිප්‍රාය ප්‍රකාශ කිරීම සඳහා ය. අනිවාර්ය ("යුත්තේ ය") යන අනාගත කාල රූපය භාවිත කරනුයේ සමාලෝචනාත්මක වගකීම්වලට ආ. සං. බැං. දක්වන අනුකූලත්වය ප්‍රකාශ කිරීම සඳහා ය.

# පටුන


පිටුව

නියාමක සාරාංශය i

i. හැඳින්වීම 1

ii. මහජන සන්නිවේදනයන් හා සංවර්ධන කාර්ය සාධකත්වය 3

iii. මහජන සන්නිවේදනයන්හි ලා ආ. සං. බැංකුවේ අත්දැකීම 4

(අ) තොරතුරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 4

1. තොරතුරු ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ 4
2. ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීම 4

(ආ) තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීම 6

1. තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ලක්ෂණ 6
2. ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීම 6

(ඇ) නිගමනය 7

iv. ප්‍රතිපත්තිය 8

v. මූලෝපාය 9

(අ) බාහිර සබඳතා 10

1. පූර්ව අවශ්‍යතාවෝ 10
2. නායකත්වය හා අභිප්‍රේරණයෝ 10
3. ඉලක්ක කර ගැනුණු ප්‍රේක්ෂක පිරිස් 11
4. ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් කරා ළඟා වීම සඳහා ප්‍රවේශයෝ 12
5. ප්‍රධාන සන්නිවේදකයෝ 12

(ආ) තොරතුරු අනාවරණය කිරීම 13

1. පරිවර්තන 13
2. ආ. සං. බැංකුවේ මෙහෙයුම්වලට අදාළ තොරතුරු 14

3. වෙනත් තොරතුරු 24

4. පූර්වානුමිත අනාවරණය කිරීම්වලට ව්‍යාතිරේක 28

vi. ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන 31

(අ) භූමිකාවන් හා වගකීම් 31

1. පාලක මණ්ඩලය 32

2. සියලු දෙපාර්තමේන්තු හා කාර්යාල 32

3. බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය 32

4. නියෝජිත කාර්යාල හා දූත මණ්ඩල 34

5. ණය ගැනුම්කරුවෝ හා ව්‍යාපෘති අනුග්‍රාහකයෝ 35

6. මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව 35

(ආ) තොරතුරු ලබා ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටීන් 36

1. ප්‍රගාමී අනාවරණ කිරීම් 36

2. ව්‍යාතිරේක පදනම් කොට ගත් තොරතුරු සඳහා වන ඉල්ලීම් 36

3. ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු භාෂාව 37

4. ප්‍රචලිත තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා වන කාල සීමාවන් 37

5. පැමිණිලි 37

6. ඓතිහාසික තොරතුරු සඳහා ඉල්ලීම් 38

(ඇ) ක්‍රියාත්මක වන දිනය හා සංක්‍රමණීය කාල පරිච්ඡේදය 38

(ඈ) අධීක්ෂණය හා වාර්තාකරණය 38

(ඉ) සමාලෝචනය හා සංශෝධන 39

vii. කාර්ය මණ්ඩල සම්පාදනය හා සම්පත් පිළිබඳ ගම්‍යයෝ ( implications) 39

(අ) බාහිර සබඳතා 39

(ආ) තොරතුරු අනාවරණය කිරීම 40

viii. අනුකූලතා සමාලෝචනය 41

ix. නිර්දේශ කිරීම 41

පාදීය සටහන් 42

1 වන උප ග්‍රන්ථය 45

වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල සන්නිවේදන හා තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රවණතා 45

(අ) බාහිර සබඳතා හා වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකු 45

(ආ) වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල තොරතුරු අනාවරණය කිරීම් 45

2 වැනි උප ග්‍රන්ථය 53

ක්‍රියාකාරිත්ව ඇගයීම් ආකෘතිය 53

*අනුපූරක උප ග්‍රන්ථය* (ඉල්ලුම් කළ විට ලබා ගත හැකි ය) 1

බාහිර උපදේශන ක්‍රියාදාමය හා ප්‍රතිඵල 2

# නියාමක සාරාංශය (EXECUTIVE SUMMARY)

ආසියානු සංවර්ධන බැංකුව කාර්යසාධක ආයතනයක් බවට පත් වීම සඳහා එය පුළුල් පරාසයක ජනයා හා සංවිධාන සමඟ කටයුතු කළ යුතු ය. එය ශක්තිමත් හා කාර්යසාධක සහභාගිකත්වයන් නිර්මාණය කරන්ට අදහස් කරන්නේ නම් ආ. සං. බැං. පුළුල් ලෙස ප්‍රචලිත විය යුතු ව තිබේ; එහි අභිප්‍රායන් හා අරමුණු පැහැදිලි විය යුතු අතර මනාව වටහා ගත යුතු ව තිබේ; තව ද, එය වෘත්තිමය, ප්‍රතිඵල දිශානත හා ප්‍රායෝගික ආයතනයක් ලෙස ගෞරවයට පාත්‍ර විය යුතු ව තිබේ. විශ්වාසය දිනා ගැනීමට හා සහභාගිකත්ව සංවර්ධනයට සහයෝගය පළ කිරීමට ආ. සං. බැං. විවෘත භාවය හා වගඋත්තර සැපයීමට ඇති සූදානම ප්‍රදර්ශනය කළ යුතු ය. මෙය කළ යුතු වන්නේ එහි සියලු ම කොටස් හිමියන් සමඟ ප්‍රගාමී ව තොරතුරු බෙදා ගැනීම හා ඔවුන්ගෙන් පෙරළා ප්‍රතිපෝෂණය වීමට උත්සාහ දැරීම මඟිනි. තව ද, ආ. සං. බැං. එහි පාර්ශ්වකරුවන්ගෙන් තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්විය යුතු ය.

ඵලදායී බාහිර සබඳතා හා තොරතුරු අනාවරණය කිරීම - එනම්, වඩාත් විවෘත හා ප්‍රගාමී මහජන සන්නිවේදනයන් - මේ සහභාගිකත්වයන් ගොඩ නැඟීමේ ලා ප්‍රධාන මූලිකාංග වෙයි.

ගත වූ දශකය තුළ පෘථුල විවෘත භාවය හා තොරතුරු කරා ප්‍රවේශ වීමේ මාර්ග සලසා ගැනීමේ දිශාවට පැහැදිලි ගෝලීය නැඹුරුතාවක් පැවතී තිබේ. තොරතුරු බෙදා හදා ගැනීම සහභාගිකත්ව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බැව් දැන් පළල් ලෙස පිළිගනු ලැබේ. ගෝලීය සන්නිවේදන විප්ලවයත් සමඟ බැඳුණු පාරදෘශ්‍යතාව දෙසට වන මේ නැඹුරුව රාජ්‍ය, පෞද්ගලික හා ලාභ නො ලබන අංශවල පවත්නා ආයතන මඟින් සපයනු ලබන තොරතුරුවල ස්වභාවය, පරාසය හා ඒවා බෙදා හැරීම ගැන මහජන අපේක්ෂාවන් ඉහළ නංවා ඇත. ආ. සං. බැං. එහි සංසන්දක ආයතන ද බොහෝ ආණ්ඩුවල හා සාමාජික රටවල් තුළ පුද්ගලික අංශයේ භාවිතයන් හා මහජන අපේක්ෂාවන් සමඟ අනුරූප ව පැවතීමට වඩාත් පෘථුල විවෘත භාවයෙන් යුත් නව යුගයට අනුවර්තනය විය යුතු ය.

ආ. සං. බැංකුවේ මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය (Policy) ආ. සං. බැංකුවට වඩාත් කාර්ය සාධක අන්දමින් සන්නිවේදනය කිරීමට හැකි කර වන රාමුවක් සපයා දෙයි. එය 1994 දී සම්මත කර ගැනුණු *තොරතුරු ප්‍රතිපත්තිය හා තොරතුරුවල රහස්‍ය භාවය හා අනාවරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය* යන ප්‍රතිපත්ති දෙක විස්ථාපනය කරයි. එය ආ. සං. බැං. මහජනයාට ලබා ගැනීමට සලස්වන තොරතුරුවල විෂය පථය හා මාදිලිය ප්‍රසාරණය කරයි.

මේ ප්‍රතිපත්තියෙන් ආ. සං. බැං. කෙරෙහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය හා ආ. සං. බැං. සමඟ කාර්ය නිරත වීමට ඇති හැකියාව සවිමත් කිරීම අරමුණු කෙරේ. ආ. සං. බැංකුවේ මෙහෙයුම්වල වඩා පෘථුල සංවර්ධන බලපෑමක් පවත්නා බව සහතික කිරීමට ප්‍රතිපත්තිය පහත දැක්වෙන අංශ ප්‍රවර්ධනය කරයි.

* ආ. සං. බැංකුවේ ක්‍රියාකාරකම්, ප්‍රතිපත්ති, මූලෝපායන්, අරමුණු හා ප්‍රතිඵල ගැන දැනුවත්කම හා අවබෝධය;

* සංවර්ධන ගැටලු සම්බන්ධ නැවුම් හා නවීකාරක පර්යාලෝකයන් සැපයීම පිණිස සංවර්ධන දැනුම හා උගත් පාඩම් බෙදා හදා ගැනීම හා හුවමාරු කර ගැනීම;

* සහභාගිකත්ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වන ජනයා ඇතුළත් ආ. සං. බැං. හා එහි පාර්ශ්වකරුවන් අතර තොරතුරු පිළිබඳ වඩා පුළුල් ගලා යාමක්; සහ

* ආ. සං. බැංකුවේ මෙහෙයුම් පිළිබඳ පාරදෘශ්‍යතාව හා වගඋත්තර සැපයීමට බැඳී සිටීම.

මේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ආ. සං. බැං. එහි දැනුම හා පාර්ශ්වකරුවන් හා පොදු ජනයා සමඟ එය ඉටු කරන කාර්යන් පිළිබඳ තොරතුරු බෙදා හදා ගනු ඇත. රහස්‍ය භාවය රැකීම සඳහා බල කෙරෙන හේතුවක් නො මැති තතු තුළ ආ. සං. බැං. තොරතුරු අනාවරණය කළ හැකි බවට පූර්වානුමාන කරනු ඇත; ප්‍රතිපත්තිය යටතේ ආ. සං. බැං. ප්‍රසිද්ධියේ ලබා ගත හැකි බවට පත් කරන තොරතුරු ලබා ගැනීමට ජනතාවට සමාන අවස්ථා තිබිය යුතු ය.

## ආ. සං. බැං. පිළිබඳ දැනුවත් භාවය හා අවබෝධය වැඩි දියුණු කිරීම

දිළිඳුකම, ගෝලීය අනාරක්ෂිත භාවය, පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කර ගැනීම හා ආර්ථික අනිශ්චිතතාව ඇතුළු අප ජීවත් වන යුගයේ අතිශය තීරණාත්මක අභියෝග අතුරින් සමහරකට ප්‍රතිචාර දක්වන ලෙස ඉල්ලා නැඟෙන එන්ට එන්ට ම ඉහළ යන පීඩනයකට ආ. සං. බැං. මුහුණ දෙයි. ආසියානු හා පැසිෆික් කලාපයේ ගාමක බලය ආ. සං. බැං. ක්‍රියාත්මක වන රටවල් ගෝලීය ප්‍රතිඵල ඇති කරමින් පරිවර්තනයකට ලක් කරමින් සිටියි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කලාපයේ සංවර්ධන අභියෝගයන්ට විශේෂඥ දැනුම හා අන්තර් ඥානය සපයන ලෙස ආණ්ඩුවලින් ද ව්‍යාපාරික ආයතනවලින් හා සිවිල් සමාජයෙන් ද ආ. සං. බැංකුවට කෙරෙන ඉල්ලීම් නො නවත්වා ම වැඩි වෙමින් පවතී.

ආ. සං. බැං. එහි බුද්ධිමය නායකත්වය සවිමත් කළ යුතු අතර කලාපය ගැන එය සතු සැලකිය යුතු දැනුම වඩා කාර්ය සාධක ලෙස පැහැදිලි ව දැක්වීමට හා සන්නිවේදනය කිරීමට පියවර ගත යුතු ය. සාමාජික රටවල ආණ්ඩු ද පුවත්පත් කලාවේදීන් ද සිවිල් සමාජ සංවිධාන හා ආ. සං. බැංකුවේ කාර්ය මණ්ඩලය ද ලොව ඉතා ම ජනාකීර්ණ කලාපය මුහුණ දෙන තීරණාත්මක ආර්ථික හා සමාජ ගැටලු ගැන ආ. සං. බැං. කථා කිරීමේ හා ඒවාට සවන් දීමේ අවශ්‍යතාව ප්‍රකාශ කර තිබේ.

ආ. සං. බැංකුවේ මෙහෙයුම් ගැන වඩාත් ප්‍රගාමී සන්නිවේදනයක් සඳහා ද ආ. සං. බැං. ගැන වඩාත් පුළුල් තොරතුරු ව්‍යාප්ත කර හැරීම සඳහා ද ආ. සං. බැංකුවේ මෙහෙයුම් ගැන තොරතුරු වඩා හොඳින් ලබා ගැනීම සඳහා ද ආයතනමය යන්ත්‍රණයන් සැපයීම මඟින් ප්‍රතිපත්තිය මේ උත්සුකතාවන්ට ආමන්ත්‍රණය කරයි.

මේ ප්‍රතිපත්තිය තුළින් ආ. සං. බැං. එහි සාමාජිකයන් ද සිවිල් සමාජ සංවිධාන ද ව්‍යාපාරික ආයතන ද මාධ්‍යයන් ද අධ්‍යාපන ආයතන ද සංවර්ධන හවුල්කරුවන් හා පොදු මහ ජනතාව ද ආ. සං. බැං. ආසියානු පැසිෆික් කලාපය තුළ දිළිඳුකම පහත හෙළීමෙහි ලා එහි භූමිකාව සම්බන්ධ අවබෝධය සවිමත් කිරීමට උත්සාහ දරයි.

## සංවර්ධන දැනුම බෙදා හදා ගැනීම හා එහි ප්‍රතිඵල

ආ. සං. බැංකුවට එහි කටයුතු පිළිබඳ ව ජනතාවට පැහැදිලි සමතුලිත චිත්‍රයක් සැපයීමේ වගකීමක් තිබේ. එමතු නො ව, සහස්‍රක සංවර්ධන ඉලක්කයන් මුදුන් පත් කර ගැනීම සඳහා රටකට ආධාර බෙදා හැරීමේ දී හා එහි සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවලට උපකාර කිරීමේ දී ආ. සං. බැං. දැන් ප්‍රතිඵල පදනම් කර ගත් කළමනාකරණ ප්‍රවේශයක් මුළුමනින් ම අනුමත කරන හෙයින් ඒවායේ ප්‍රතිඵල වාර්තා කිරීමට මහජනයා වෙනුවෙන් එයට වඩා පෘථුල වගකීමක් ද පවතී.

ආධාර සපයන රටවල හීන වෙමින් පවතින සම්පත් සඳහා වන තරඟය ඉහළ යාමත් සමඟ සංවර්ධන වැඩසටහන්වල පිරිවැය - ඵලදායිත්වය පිළිබඳ ව වඩා පුළුල් මහජන

සුපරීක්ෂාකාරිත්වයක් දක්නට ලැබේ. ආ. සං. බැං. වටිනා අධ්‍යයනයන් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කරන අතර ඒවායේ සොයා ගැනීම් හා ප්‍රකාශිත අන්තර් ඥානය පුළුල් ලෙස ව්‍යාප්ත කළ යුතු ව තිබේ.

ප්‍රතිපත්තිය මේ අභියෝගවලට මුහුණ දෙයි. අත්දැකීමෙන් ඉගෙනීම මඟින් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කර ගැනීමට දැරෙන ප්‍රයත්නයන් තුළ දී ප්‍රතිපත්තිය ජයග්‍රහණ මෙන් ම අසාර්ථකත්වයන් හා අපේක්ෂා භංගත්වයන් ද වාර්තා කිරීමට ආ. සං. බැංකුවට ඉඩ දෙයි. හුදෙක් නිශේධාත්මක වීම හේතු කොට ගෙන තොරතුරු නිකුත් නො කර රඳවා නො තබනු ඇත. එවන් විවෘත භාවයක් ප්‍රතිපත්ති හා මෙහෙයුම් ගැන නිර්මාණාත්මක සංවාදයක් දිරි ගන්වනු ඇත. මහජන ආයතනයක් හැටියට ආ. සං. බැං. එහි කටයුතු සම්බන්ධයෙන් වගඋත්තර සැපයිය යුතු වන්නේ ය.

## සන්නිවේදනය ශක්තිමත් කිරීම

ආ. සං. බැං. සංවර්ධන කටයුතුවල කාර්ය සාධක භාවය සහතික කිරීමට ආ. සං. බැංකුවේ සහාය ලද මෙහෙයුම්වල බලපෑමට පාත්‍ර වූ ජනතාව සඳහා ඔවුන්ගේ ජීවිත කෙරෙහි බලපාන තීරණ ගැන ඔවුන් දැනුවත් කරනු ලැබීමට හා ඔවුන්ට එකී තීරණ කෙරෙහි බලපෑම් ඇති කිරීමට ඇති අවස්ථා ව්‍යාප්ත කළ යුතු ය. තීරණ ගැනීමේ දී වඩා පුළුල් ප්‍රජාගණ මට්ටමේ සහභාගිකත්වයකට පහසුකම් සැලසීම සඳහා ආ. සං. බැං. සාමාජික රටවල ආණ්ඩු හා පුද්ගලික අංශයේ ව්‍යාපෘති අනුග්‍රාහකයන් පාර්ශ්වකරුවන්ට ඒවා දැනුම් දීම සඳහා ක්‍රියාදාමයන් හැඩ ගස්වා ගැනීමත් ඔවුන්ට සිය ප්‍රතිපෝෂණ ඉදිරිපත් කිරීමටත් ඉඩ ලබා දීම අවශ්‍ය ය.

ව්‍යාපෘතිවල සාර්ථකත්වය බොහෝ විට රඳා පවත්නේ මහජනතාව ප්‍රජාගණයන් හා සංවිධාන ද සමඟ විශ්වාසය ගොඩ නඟා ගැනීමත් ව්‍යාපෘතිවල අරමුණු පැහැදිලි කරලීමත් දේශීය ආදානයන් (inputs) ලබා ගැනීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශ තුළ ජීවත් වන ජනයාගේ කැප වීම සුරක්ෂිත කර ගැනීමත් මත ය.

ආ. සං. බැංකුවට ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබන්නන් හා එහි බලපෑමට ලක් වන වෙනත් ජනයා සමඟ සිය සම්බන්ධය සවිමත් කර ගැනීමට අවශ්‍ය නම් එය එහි සන්නිවේදන ප්‍රතිපත්ති, ක්‍රියා පිළිවෙත් හා හැකියාවන් ඉහළ මට්ටමකට නැංවිය යුතු ය.

ප්‍රතිපත්තිය ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් ගැන තොරතුරු හා අදහස් ලබා ගැනීමට උත්සාහ දැරීමට ද ඒවා ලබා ගැනීමට හා තවත් අයට දන්වා සිටීමට ද ජනතාවට ඇති අයිතියට සහාය දක්වයි. ප්‍රතිපත්තිය තුළින් නිසි කලට, පැහැදිලි ව හා අදාළ ආකාරයට තොරතුරු සැපයීමට හා ව්‍යාපෘති සැලසුම්වලට අර්ථවත් ආදානයන් සැපයීමට ඔවුන්ට ප්‍රමාණවත් තරම් කල් ඇති ව ඉඩ ලැබෙන පරිදි ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වන ජනයා සමඟ තොරතුරු බෙදා හදා ගැනීමට ආ. සං. බැං. උත්සාහ දරයි.

## පාරදෘශ්‍යතාව ප්‍රවර්ධනය කිරීම

පාරදෘශ්‍යතාව සංවර්ධන කාර්ය සාධකත්වය සවිමත් කරනවා පමණක් නො ව ආයතනය කෙරෙහි මහජනයා තුළ පවත්නා විශ්වාසය ද වර්ධනය කරන බව ආ. සං. බැං. පිළිගනියි. ආ. සං. බැං. පාරදෘශ්‍යතාව පිළිබඳ සාධනීය ආදර්ශයක් බවට පත් වීමට හා පාරදෘශ්‍යතාව පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් එය සිය සාමාජිකයන්ට සපයන උපදේශය අනුව අඛණ්ඩ ව ක්‍රියා කිරීමට උත්සාහ දරයි.

නෛතික හා ප්‍රායෝගික කරුණු හේතු කොට ගෙන සම්පූර්ණ අනාවරණය කිරීම් හැම විට ම කළ නො හැකි බව ද ආ. සං. බැං. වටහා ගනියි. ආ. සං. බැං. අදහස් ගවේෂණය කිරීම,

තොරතුරු බෙදා හදා ගැනීම හා අභ්‍යන්තරික ව හා එහි සාමාජිකයන් සමඟ විවෘත සාකච්ඡා පැවැත්වීම අවශ්‍ය වෙයි. එසේ කිරීම මඟින් ආ. සං. බැං. එහි කාර්ය මණ්ඩලයේ පෞද්ගලික භාවය සුරක්ෂිත කළ යුතු අතර පුද්ගලික ව්‍යාපෘති අනුග්‍රාහකයන්ගේ හා සේවා දායකයන්ගේ රහස්‍ය ව්‍යාපාරික තොරතුරු ආරක්ෂා කළ යුතු ය. කෙසේ වෙතත්, ව්‍යතිරේකයන් (exceptions) සීමා සහිත වෙයි.

## ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ආ. සං. බැං. එහි පොදු මූලධර්ම ක්‍රියාත්මක කිරීමට භාවිත කරන මූලෝපායක් ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත වෙයි. මූලෝපාය ආ. සං. බැං. එහි බාහිර සබඳතා වඩාත් ප්‍රගාමී බවට පත් කිරීමට හා ආ. සං. බැංකුවේ මෙහෙයුම් ගැන තොරතුරු ලබා ගැනීමට ඇති මාර්ග ප්‍රවර්ධනය කිරීමට තෝරා ගන්නා ප්‍රවේශයන් විස්තර කරයි. මූලෝපාය තොරතුරු ප්‍රචලිත කිරීම, තොරතුරු බෙදා හදා ගැනීම හා බැඳුම්කර දරන්නන්ගෙන් ප්‍රතිපෝෂණ (feedback) ලැබීම, ආ. සං. බැං. ළඟා වීමට අරමුණු කරන ප්‍රධාන ප්‍රේක්ෂක පිරිස්, පරිවර්තන කටයුතු හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයන්ගේ භූමිකාවන් විස්තර කර දක්වයි.

කේන්ද්‍රගත කෙරුණු බාහිර සබඳතා මූලෝපායක් අර්ථ දැක්වීම මඟින් ආ. සං. බැං. එහි ප්‍රවේශයන් සවිමත් ද පිරිපහදු ද කරනු ඇත. ආ. සං. බැං. එහි සාමාජිකයන්ට වැදගත් වන ගැටලු සම්බන්ධයෙන් පැහැදිලි ආස්ථානයන් වර්ධනය ද මෙකී ආස්ථානයන් පැහැදිලි කරලීමට එහි තොරතුරු නිපැයුම් ප්‍රවර්ධනය ද වඩා පුළුල් ලෙස ව්‍යාප්ත ද කරනු ඇත. සංවිධානය ඇතුළත ම බාහිර සබඳතාවන්ගේ වැදගත්කම පැහැදිලි කරලීම සඳහා ආ. සං. බැං. එහි සංවිධානාත්මක විධි විධාන පෙළ ගස්වනු ඇති අතර ඊට අනුකූල ව එහි කාර්ය මණ්ඩලයේ නිපුණතා සම්මිශ්‍රණය (skillsmix) වෙනස් කරනු ඇත.

වඩාත් පුළුල් පාරදෘශ්‍යතාවක් සහතික කිරීමට ආ. සං. බැං. එහි රාජ්‍ය හා පුද්ගලික අංශයේ මෙහෙයුම් ආවරණය කෙරෙන පොදුවේ ලබා ගත හැකි තොරතුරුවල වාසිය ව්‍යාප්ත කරමින් සිටියි. ආ. සං. බැං. ඉදිරිපත් කරන නිශ්චිත ලේඛන හා වෙනත් තොරතුරු විස්තර කර දක්වන මූලෝපාය පොදුවේ ලබා ගත හැකි ලේඛන හා තොරතුරු මොනවා ද යන්න පෙන්නුම් කරන අතර සත්‍ය යැයි හඟින අනාවරණය කිරීම්වලට ව්‍යතිරේක ව පවතින දෑ ලැයිස්තුගත කරයි.

සහභාගිකත්ව සංවර්ධන කටයුතුවලට සහාය දැක්වීමට ආ. සං. බැං. ව්‍යාපෘතිවල බලපෑමට ලක් වන ජනයාට තොරතුරු සපයනු ඇත. මූලෝපාය ආ. සං. බැංකුවේ කාර්ය මණ්ඩලය අදහස්, උපදේශ, විවේචන හා ආ. සං. බැංකුවේ කටයුතු සම්බන්ධ අනෙක් ප්‍රතිපෝෂණයන්ට නිසි සැලකිල්ල යොමු කෙරෙන බව සහතික කරයි. එය ප්‍රතිපෝෂණ සපයන පාර්ශ්වකරුවන්ට ආ. සං. බැං. ප්‍රතිචාරය පැහැදිලි ව සන්නිවේදනය කරනු ලබන්නේ කෙසේ ද යන්න ද විස්තර කර දක්වයි.

පොදු අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුවක් ප්‍රතිපත්තියෙහි අනාවරණාත්මක අවශ්‍යතා අර්ථකථනය කිරීම, අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වග කියනු ඇත. ආ. සං. බැංකුවේ බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය සියලු ම පොදු තොරතුරු ක්‍රියාකාරකම් සම්බන්ධ කේන්ද්‍රීය ලක්ෂ්‍යය වනු ඇති අතර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා එය අඛණ්ඩ ව උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම උසුලනු ඇත. බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය ප්‍රතිපත්තිය පිළිබඳ පුහුණු කිරීම් මෙහෙය වනු ඇත. බාහිර සබඳතා පිළිබඳ කාර්යාලයෙහි පිහිටුවා ඇති නව පොදු තොරතුරු හා අනාවරණ ඒකකය ප්‍රතිපත්තියෙහි අනාවරණාත්මක අවශ්‍යතාවන් අධීක්ෂණය ද සන්නිවේදන සැලසුම් වර්ධනය කිරීමෙහි ලා මෙහෙයුම් දෙපාර්තමේන්තුවලට උපකාර ද පොදු තොරතුරු මධ්‍යස්ථානයන්ගේ

ජාලයක් නිර්මාණය කිරීම හා පරිවර්තන කටයුතු පිළිබඳ රාමුවක් ද ස්ථාපනය කිරීම ද කරනු ඇත.

ප්‍රතිපත්තිය වූ කලී ආ. සං. බැං. පිළිබඳ ව හා කලාපයේ සංවර්ධන අභියෝගයන් පිළිබඳ දැනුවත් භාවය හා අවබෝධය වැඩි දියුණු කිරීමේ දිශාවට තබන ප්‍රථම පියවර වේ. ආ. සං. බැං. ආසියානු පැසිෆික් කලාපය තුළ එහි කාර්යන් හා ප්‍රතිඵල පිළිබඳ පැහැදිලි, සමතුලිත චිත්‍රයක් පොදු ජනතාවට සපයා දීම අරමුණු කරයි. දැනුම කාර්ය සාධක අන්දමින් ව්‍යාප්ත කරලීම තුළින් ආ. සං. බැංකුවට වඩා පෘථුල සංවර්ධන කාර්ය සාධකත්වයක් අත් පත් කර ගත හැකි ය.

# ආ. සං. බැංකුවේ මහජන සබඳතා ප්‍රතිපත්තිය

## *තොරතුරු අනාවරණය කිරීම හා හුවමාරුව*

## 1. හැඳින්වීම

1. ආ. සං. බැං. අප ජීවත් වන යුගයේ වැදගත් පරිශ්‍රමයන් අතුරින් එකක නිරත ව සිටියි - එනම්, දිළිඳුකමට එරෙහි සටනෙහි ය. දිනකට එක් ඩොලරයකටත් අඩු ආදායමකින් දිවි ගැට ගසා ගන්නා මිලියන 700ක් තරම් ම වන ජනතාවක් ද දිනකට ඩොලර් 2කට අඩු ආදායමකින් දිවි ගැට ගසා ගන්නා හතරෙන් පංගුවකට අධික බිලියන 1.9ක් තරම් ම වන ජනතාවක් ද ජීවත් වන කලාපය තුළ එය එහි කටයුතු කර ගෙන යයි.

2. ආ. සං. බැං. දිළිඳුකම පහත හෙළීමට දෙයාකාරයකින් කටයුතු කරයි.[1] එය දිළිඳුකම පහත හෙළීමට හා ආර්ථික වර්ධනය ඉහළ දැමීමට මූල්‍යමය සහාය ලබා දෙන අතර සාමාජික රටවල ආණ්ඩු ජනතාවට ඔවුන්ගේ ජීවන තත්වයන් වැඩි දියුණු කර ගැනීමට උපකාර කරන ප්‍රතිපත්ති හා ආයතන හැඩ ගස්වා ගැනීමත් සමඟ ඒවාට අරමුණු හා අන්තර් ඥානයක් සපයා දෙයි.

3. කාර්ය සාධක භාවය අත් කර ගැනීමට නම් ආ. සං. බැං. පුළුල් පරාසයක ජනතාවක් හා සංවිධාන සමඟ කටයුතු කළ යුතු ය. ශක්තිමත් හා ඵලදායී හවුල්කාරිත්වයන් බිහි කරන්ට නම් ආ. සං. බැං. පුළුල් ප්‍රසිද්ධියක් ලබා ගත යුතු අතර එහි අභිප්‍රේරණයන් හා අරමුණු පැහැදිලි ව හා මනාව වටහා ගත යුතු ය. එමතු නො ව, එයට වෘත්තිමය, ප්‍රතිඵල දිශානත හා ප්‍රායෝගික ආයතනයක් ලෙස සැලකිලි දැක්විය යුතු ය. විශ්වාසය දිනා ගැනීමට හා සහභාගිකත්ව සංවර්ධනයට සහයෝගය ලබා දීමට ආ. සං. බැං. විවෘත භාවය හා වග උත්තර සැපයීමට බැඳී සිටින බව ප්‍රදර්ශනය කළ යුතු ය. මෙය සිදු කළ හැක්කේ එහි පාර්ශ්වකරුවන් සමඟ ප්‍රගාමී ව තොරතුරු බෙදා හදා ගැනීම හා ඔවුන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගැනීමට වෑයම් කිරීම මඟිනි.[2] ආ. සං. බැං. එහි පාර්ශ්වකරුවන්ගෙන් තොරතුරු සඳහා ඉදිරිපත් වන ඉල්ලීම්වලට ප්‍රතිචාර ද දැක්විය යුතු ය.

4. ඵලදායක බාහිර සබඳතා සහ තොරතුරු අනාවරණය - එනම්, වඩා විවෘත හා ප්‍රගාමී පොදු සන්නිවේදනයන් - මේ හවුල්කාරිත්වය ගොඩ නැඟීමේ ප්‍රධාන මූලිකාංගයෝ වෙත්. ආ. සං. බැං. මෙය එහි *දීර්ඝ කාලීන මූලෝපායාත්මක රාමුව (Long-Term Strategic Framework, 2001-2005)*[3] හා දැනුම් කළමනාකරණ රාමුව තුළ පිළිගෙන තිබේ.[4]

5. ගත වූ දශකය තුළ වඩා පෘථුල විවෘත භාවයක් හා තොරතුරු ලබා ගැනීමේ මාර්ග කරා ප්‍රවේශ වීමක් දෙසට පැහැදිලි ගෝලීය උපනතියක් පැවතී තිබෙන අතර[5] සහභාගිකත්ව සංවර්ධනයට තොරතුරු බෙදා හදා ගැනීම අත්‍යවශ්‍ය බව දැන් පෘථුල ලෙස පිළිගනු ලැබේ. පාරදෘශ්‍ය භාවය හා ගෝලීය සන්නිවේදන විප්ලවය කරා වන මේ උපනතිය රාජ්‍ය, පුද්ගලික හා ලාභ නො ලබන ක්ෂේත්‍රවලට අයත් ආයතන මඟින් සපයනු ලබන තොරතුරුවල මාදිලිය, පරාසය හා බෙදා හැරීම ගැන පොදු අපේක්ෂාවන් ඉහළ නංවා තිබේ. ආ. සං. බැං. එහි සංසන්දක ආයතන ද සාමාජික රටවල් බොහොමයක ආණ්ඩු හා පුද්ගලික අංශයේ ක්‍රියා පිළිවෙත් හා මහජන අපේක්ෂාවන් ද සමඟ එක තලයක සිටීම සඳහා වඩා පුළුල් විවෘත භාවයෙන් යුත් නව යුගයට අනුවර්තනය විය යුතු ය.[6]

6. මේ ක්ෂේත්‍රය තුළ ආ. සං. බැංකුවේ දැනට පවත්නා ප්‍රතිපත්ති[7] 1990 ගණන් දක්වා අතීතයට දිවෙන අතර ඒවා යාවත්කාල (update) කිරීම යෝග්‍ය ව පවතී. 2003 මැයි මාසයේ දී ආ. සං. බැං. සභාපතිවරයා බාහිර සබඳතා පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන

අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුත් මෙහෙයුම් කමිටුවක් පත් කළේ ය. *තොරතුරුවල රහස්‍ය භාවය හා අනාවරණය පිළිබඳ ප්‍රතිපත්තිය (Disclosure Policy) හා තොරතුරු ප්‍රතිපත්තිය හා මූලෝපාය (Information Policy)* සමාලෝචනය කිරීමට හා නව ඒකාබද්ධ ප්‍රතිපත්තියක් වර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය, පුද්ගලික හා ලාභ නො ලබන අංශ තුළ පාර්ශ්වකරුවන්ගෙන් ප්‍රගාමී ලෙස අදහස් විමසීම මේ කමිටුවට භාර විය.

7. ලිඛිත ප්‍රකාශ ඉල්ලා සිටීමට අතිරේක ව, ආ. සං. බැංකුව කලාපය ඇතුළත හා පිටත උනන්දුවත් පාර්ශ්වයන්ගේ පුළුල් පරාසයක අදහස්වලට සවන් දීමට සාමාජික රටවල් බොහෝ සංඛ්‍යාවක් තුළ උපදේශන මණ්ඩල 15ක් පැවැත්වී ය. සම්පූර්ණ වශයෙන් වැඩමුලුවලට හා ඇසිදිසි සබැඳි සමුලුවලට (Viedeo Conferences) 430කට අධික පුද්ගලයෝ සහභාගී වූහ. සමාලෝචන ක්‍රියාදාමය පිළිබඳ වැඩි දුර විස්තර හා බාහිර මතයන් පිළිබඳ සාරාංශයක් අතිරේක උප ග්‍රන්ථය තුළ දක්වා ඇත (මෙය ඉල්ලුම් කළ විට ලබා ගත හැකි ය).

8. මේ ලියවිල්ල මේ සමාලෝචනයේ ප්‍රතිඵල වාර්තා කරන අතර මහජනයා සමඟ පවත්වන සන්නිවේදනය පිළිබඳ ආ. සං. බැංකුවේ නව පිළිවෙත ඉදිරිපත් කරයි. එය දැනට පවත්නා ප්‍රතිපත්ති නව ප්‍රතිපත්තිවලින් විස්ථාපනය කරනු ඇත.

### 1 වැනි කොටුව

### බාහිර සබඳතා යනු කවරේ ද?

බාහිර සබඳතා යන පදය බාහිර ගනුදෙනුකරුවන් හා ප්‍රේක්ෂක පිරිස් සමඟ සබඳතාවන්ට එළඹ සිටින කිසි යම් සංවිධානයක කටයුතුවල සියලු අංශ ආවරණය කරයි. මීට බොහෝ මට්ටම්වල - තීරකයන්, බලපෑමට පාත්‍ර වූවන්, රාජ්‍ය නො වන සංවිධාන, උපදේශකයන්, අධ්‍යාපනඥයන්, පුද්ගලික අංශයේ හවුල්කරුවන් හා සේවා සපයන්නන්, මාධ්‍ය සමඟ - හා බොහෝ හේතු කරණ කොට ගෙන - සැලසුම්වලට මුල පිරීමට ද ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද තොරතුරු සැපයීමට ද භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වන ගිවිසුම්වලට එකඟ වීමට හා ඒවා සපුරාලීමට ද සහයෝගී සබඳතා ජාලයන් හා වැඩ කිරීමේ විධි විධාන ස්ථාපනය කිරීමට හා ආ. සං. බැංකුවේ වැඩ හා අරමුණු පැහැදිලි කර දීමට හා ප්‍රතිපෝෂණ ලබා ගැනීමට සිදු කෙරෙන අන්තර් ක්‍රියාකාරිත්වයන් ඇතුළත් වෙයි. පැහැදිලි ව ම ආ. සං. බැංකුවේ සේවය කරන සියල්ලෝ ම එහි පාර්ශ්ව චිත්‍රය (Profile) හා කීර්තිය සවිමත් කිරීමට ද පවත්වා ගැනීමට හා ආරක්ෂා කිරීමට ද එහි බාහිර සබඳතා ගොඩ නැංවීමේ වගකීමට පොදුවේ උර දෙති.

ආ. සං. බැංකුවේ ගනුදෙනුකරුවෝ හා ප්‍රේක්ෂක පිරිස්



## ii. මහජන සන්නිවේදනය හා සංවර්ධන කාර්ය සාධකත්වය

9. ආ. සං. බැං. වඩාත් ප්‍රචලිත කිරීම, තේරුම් ගැනීම හා ගරු කටයුතු ආයතනයක් බවට පත් කිරීම අරමුණු කරන කාර්ය සාධක බාහිර සබඳතා (1 වැනි කොටුව) ක්ෂේත්‍ර ගණනාවක් තුළ ආ. සං. බැංකුවේ සංවර්ධන කාර්ය සාධකත්වයට සහාය දක්වනු ඇත. ආ. සං. බැංකුවේ කොටස් හිමියන්ට සංවර්ධන කාර්යයෙහි ලා එය කාර්ය සාධක භූමිකාවක් ඉටු කරමින් සිටින බවත් එහි භූමිකාව අධ්‍යාපනඥයන් සිවිල් වැසියන් හා මාධ්‍ය විසින් පිළිගනු ලබන බවත් සම්බන්ධයෙන් යළි සහතික වීමක් අවශ්‍ය කෙරෙයි. මේ සියලු කොටස් තම තමන්ගේ රටවල් තුළ වඩාත් පුළුල් ජනතාවක් මත අනුහස පතුරුවති. ආ. සං. බැං. විසින් පක්ෂ ව කථා කරනු ලබන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සංවර්ධන විශේෂඥයන්, මාධ්‍ය හා සිවිල් සමාජය විසින් වඩා හොඳින් තේරුම් ගනු ලබන්නේ නම් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් තුළ ඒවාට වැඩි සහයෝගයක් ලැබෙනු ඇත.

10. ආධාර දෙන රටවල් තුළ නිල සංවර්ධන සහායක අයවැය ලේඛන සඳහා හීන වෙමින් පවතින අරමුදල් ලබා ගැනීම සඳහා වර්ධනය වන තරඟයක් පවතින අතර ආණ්ඩු තමන්ගේ ද්විපාර්ශ්වික වැඩසටහන්වලට ද ගෝලීය බහුපාර්ශ්වික ආයතනවලට හා ආ. සං. බැං. බඳු කලාපීය ආයතනවලට ද වෙන් කරනු ලබන සම්පත්වලින් ලැබෙන ප්‍රතිලාභවල අගය සලකා බැලිය යුතු ය. මූල්‍ය හා ආධාර අමාත්‍යාංශ නිලධාරීන්ට ද දේශපාලන නායකයන්ට ද තමන්ගේ බදු ගෙවන්නන්ගේ මුදල් ඵලදායී අන්දමින් වියදම් කරන බවට යළි සහතික වීමක් අවශ්‍ය වනවා පමණක් නො ව මහජනයා මෙය එසේ වන බව පසක් කර ගනිති.

11. කාර්ය සාධක බාහිර සබඳතාවන්ට වැදගත්කමක් පැවරීමට තවත් හේතු පවතී. සංවිධානය පිළිබඳ වඩා පුළුල් වැටහීමක් හා ඒ කෙරෙහි ගරුත්වයක් පැවතීම ආධාර දෙන හා සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවල්වල මත පළ කරන නායකයන් සමඟ හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරනු ඇත. වෙනත් ප්‍රතිලාභ අතර මෙය ඉහළ ගුණාත්මක අගයකින් යුත් ආ. සං. බැංකු කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට හා එවැන්නක සේවය ලබා ගැනීමට උපකාරී වනු ඇත. බලපෑමට පාත්‍ර වන ජනතාව සමඟ වඩාත් ප්‍රගාමී සන්නිවේදනයක් ඇති කර ගැනීම ව්‍යාපෘති සැලසුම්වල හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මක භාවය වැඩි දියුණු කර ඇත.

12. කාර්ය සාධක සන්නිවේදනයක් සඳහාත් පුළුල් පරාසයක පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සබඳතා ගොඩ නඟා ගැනීම සඳහාත් ප්‍රගාමී තොරතුරු අනාවරණය කිරීම් පූර්ව අවශ්‍යතාවක් වෙයි. නිසි කලට, අදාළ, ළඟා විය හැකි තොරතුරු සැපයීමකින් තොර ව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට භාර ගනු ලබන ප්‍රජාවන්ගෙන් අදහස් විමසීමේ හෝ උපදෙස් ලබා ගැනීමේ කාර්ය සාධකත්වය බරපතළ ලෙස හීන වී යනු ඇත. තොරතුරු ආ. සං. බැංකුවේ සහාය ලබන ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වන ජනතාවට ව්‍යාපෘතියක වාසි හා අවාසි නිසි පරිදි විශ්ලේෂණය කිරීමට ද සැලැස්ම හා එය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාවට වඩා ඵලදායී ව දායක වීමට ද ඉඩ ලබා දෙනු ඇත. අවසානයේ මේ ක්‍රියාදාමය වැඩි වාසි සහගත හා දැරිය හැකි ව්‍යාපෘතීන් කරා මඟ පාදනු ඇත.

13. පාරදෘශ්‍යතාව ආර්ථික වර්ධනයේ ද මූල්‍යමය ස්ථාවරත්වයේ හා කාර්ය සාධක පාලනයේ ද වැදගත් මූලිකාංගයක් වෙයි.[8] තොරතුරු ලබා ගැනීමට ඇති අවස්ථා වැඩි කිරීම මඟින් සපයනු ලබන වඩා පුළුල් පාරදෘශ්‍යතාව රාජ්‍ය ආයතන හා පුද්ගලික සංවිධාන තුළ ඒකාබද්ධතාව සවිමත් කරනු ඇත.

14. අවසාන වශයෙන්, රාජ්‍ය ආයතන මඟින් තොරතුරු අනාවරණය කිරීමට පක්ෂ ව සදාචාරමය තර්කයක් පවතී. එක්කෝ තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය පිළිබඳ නීතිය තුළින් හෝ එසේත් නැති නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන තුළින් ආණ්ඩුව

සතු ව පවතින තොරතුරු ප්‍රසිද්ධියට පත් කළ යුතු බව දැන් බොහොමයක් ආ. සං. බැංකු සාමාජිකයෝ පිළිගනිති. පොදු ආයතනයක් වශයෙන් ආ. සං. බැං. ප්‍රසිද්ධියේ වග උත්තර සැපයීමට බැඳී සිටියි. තොරතුරු ලබා ගැනීමේ අවස්ථාවන්ගෙන් තොර ව වග උත්තර සැපයීමේ තත්වයක් අත් පත් කර ගත නො හැකි ය.

## iii. මහජන සන්නිවේදනයන්හි ලා ආ. සං. බැංකුවේ අත්දැකීම

*(අ) තොරතුරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම*

*1. තොරතුරු ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ*

15. *තොරතුරු ප්‍රතිපත්තිය (Information Policy)* ආ. සං. බැංකුවේ මූලෝපායාත්මක න්‍යාය පත්‍රයට හා එහි අරමුණුවලට සහාය දක්වයි. එය සමර්පණය කිරීමට ඇති පණිවුඩය, ළඟා විය යුතු ව තිබෙන ඉලක්කය හා උපයෝගී කර ගත යුතු ව තිබෙන බෙදා හැරීමේ ක්‍රමවේදයන් හඳුනා ගනියි. එයට ප්‍රධාන පණිවුඩ හතරක් තිබේ: (i) ආ. සං. බැං. ආසියානු හා පැසිෆික් කලාපය තුළ කල් පවත්නා ආර්ථික වර්ධනය පෝෂණය කරයි. මෙය සියලු සාමාජික රටවල ප්‍රයෝජනය සඳහා වෙයි; (ii) ආ. සං. බැං. අත්‍යවශ්‍ය සංවර්ධන භූමිකාවක් සපුරාලයි; (iii) ආ. සං. බැං. ආර්ථික හා සමාජීය වෙනස සඳහා උත්ප්‍රේරකයක් වෙයි; (iv) ආ. සං. බැං. කලාපීය හා උප කලාපීය සහයෝගිතාව පෝෂණය කරයි. එය මේ පණිවුඩ සඳහා ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් හා පණිවුඩය ඔවුන් වෙත සම්ප්‍රේෂණය කර හැරීමේ විවිධ මාර්ග නිශ්චය කර ගනියි.

*2. තොරතුරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීම*

16. *තොරතුරු ප්‍රතිපත්තිය* තෝරා ගත් තැන් පටන් ගත වූ දශකයන් තුළ ආ. සං. බැං. සිවිල් සමාජ කණ්ඩායම් ද සංවර්ධන සංවිධාන හා ජාත්‍යන්තර හා දේශීය මාධ්‍ය ද ඇතුළත් ඉලක්ක ප්‍රේක්ෂක පිරිස් විශාල සංඛ්‍යාවක් සමඟ එහි සබඳතාවන් ව්‍යාප්ත කර ශක්තිමත් කර තිබේ. එය පුළුල් ප්‍රේක්ෂක ජනතාවකට ප්‍රවෘත්ති හා අදහස් බෙදා හැර තිබේ. එය ප්‍රතිචාරාත්මක තොරතුරු පතුරුවා හැරීමේ සිට ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් සමඟ ප්‍රගාමී ව්‍යාවෘත වීම් කරා මාරු වීමට පටන් ගෙන තිබේ.

17. යොමු සලකුණු (benchmarks) හෝ අධීක්ෂණ රාමුවක් නො මැති තත්වයක් යටතේ මේ දක්වා ප්‍රගතිය තොරතුරු ප්‍රතිපත්තියේ (Information Policy) අරමුණු මුදුන් පත් කර ගැනීමට ප්‍රමාණවත් වේ ද යන්න තක්සේරු කර ගැනීම දුෂ්කර ය. කෙසේ වෙතත්, ප්‍රතිපත්තිය තෝරා ගන්නා ලද තැන් පටන් ගත වූ දශකයන් තුළ ආ. සං. බැං. එහි මෙහෙයුම්වල විවිධ අංශ පිළිබඳ ව සමාලෝචන විශාල සංඛ්‍යාවක් මෙහෙයවා තිබේ. *දිගු කාලීන මූලෝපායාත්මක රාමුව - Long-Term Strategic Framework (2001-2005), දූත මණ්ඩල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය - Review of Progress in implementation of the Resident Mission Policy (2000) සහ ආ. සං. බැං. ප්‍රතිසංවිධානය කිරීම - Reorganization of the Asian Development Bank (2001)* යන මේ සියල්ල වඩා ශක්තිමත් බාහිර සබඳතාවන්ගේ අවශ්‍යතාව ඉස්මතු කොට පෙන්වී ය. මූලස්ථාන හා ක්ෂේත්‍ර යන මට්ටම් දෙකෙහි දී ම ආ. සං. බැංකුවේ බාහිර සබඳතා පිළිබඳ බාහිර සමාලෝචන එක ම නිගමනයට ළඟා වූ අතර බාහිර සබඳතා සවිමත් කිරීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කළේ ය (ප්‍රධාන පාඩම් සඳහා 2 වැනි කොටුව බලන්න). මේ නිර්දේශ අතුරින් ක්‍රියාවට නඟන ලද්දේ ස්වල්පයක් පමණි.

18. එළඹිය හැකි ව තිබෙන නිගමනය වන්නේ බාහිර ප්‍රේක්ෂක පිරිස් අතර ආ. සං. බැං. පිළිබඳ ව පවත්නා දැනුවත්කම වැඩි දියුණු කිරීමෙහි ලා ලබා ඇති ප්‍රගතිය නො තකා ආ. සං. බැං. ආසියාවේ හා පැසිෆික් කලාපයේ සංවර්ධන කාර්යයෙහි ලා එය ඉටු කරන භූමිකාව සමඟ සමානුපාතික වන පොදු ආංශික දසුනක් තව මත් අතර කර

ගෙන නො මැත යන්න ය. *තොරතුරු ප්‍රතිපත්තිය* ලියන ලද්දේ සංවර්ධනය සඳහා ආ. සං. බැංකුවේ දායකත්වයට එය ම සාක්ෂි දරණ බවත් එකී දායකත්වය පැහැදිලි කිරීමට හා උසස් කොට දැක්වීම අනවශ්‍ය කටයුත්තක් ව පැවති බවත් ආ. සං. බැං. විසින් සලකනු ලැබූ කාල පරිච්ඡේදයේ දී ය. ඒ නිසා ආ. සං. බැං. ඉතා ම ස්වල්ප සම්පත් ප්‍රමාණයක් කැප කළ අතර බාහිර සබඳතාවලට අඩු ප්‍රමුඛත්වයක් පැවරී ය. කෙටියෙන් දක්වතොත්, *තොරතුරු ප්‍රතිපත්තිය* වූ කලි එය සූත්‍රගත කෙරුණු කාල පරිච්ඡේදයේ නිපැයුමක් විය. කාලය වෙනස් වී තිබේ. *දිගු කාලීන මූලෝපායික රාමුව (2001-2005)* තුළ ප්‍රකාශිත "එහි බාහිර පාර්ශ්වීය චිත්‍රය ඉහළ නැංවීමට හා සවිමත් කිරීමට" හෝ ආ. සං. බැං. ආසියාව හා පැසිෆික් කලාපය තුළ දැනුම ලබා ගන්නා හා සංවර්ධනයේ මූලාශ්‍රයක් බවට පත් වීම සඳහා එහි බැඳීම ඇතුළත් වන ඒකාබද්ධ අභිලාෂයන් අත් පත් කර ගැනීමට ප්‍රතිපත්තිය තව දුරටත් නො සෑහෙයි.

### 2 වැනි කොටුව

### ආ. සං. බැංකුවේ බාහිර සබඳතා පිළිබඳ සමාලෝචනය ප්‍රධාන පාඩම්

ආ. සං. බැංකුව එහි බාහිර සබඳතා ව්‍යාප්ත කර ගැනීමට හා එහි පොදු පාර්ශ්වික දර්ශනය (profile) ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එය වඩාත් අධිෂ්ඨාන සහගත හා කේන්ද්‍රගත බාහිර සබඳතා මූලෝපායක් වර්ධනය කළ යුතු ය. එබඳු මූලෝපායක් පහත සඳහන් කරුණු මත පදනම් විය යුතු ව තිබේ.

* *ශක්තිමත් නායකත්වය හා කාර්ය මණ්ඩල දිරිගැන්වීම්*
  පාලක මණ්ඩලය මහජන සන්නිවේදන කටයුතුවල සෘජු ව ම නිරත වීම මඟින් නායකත්වය ප්‍රදර්ශනය කළ යුතු අතර හැකි සෑම කල්හි ම බාහිර ප්‍රේක්ෂක පිරිස් සමඟ කාර්ය නියුක්ත වීමට කාර්ය මණ්ඩලය දිරි ගැන්විය යුතු ය. බාහිර සබඳතා ක්‍රියාකාරකම් තුළ වඩා ප්‍රගාමී කාර්ය මණ්ඩල නිරතත්වය හිතකර වන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ශක්තිමත් කළමනාකරණ නායකත්වයක් අත්‍යවශ්‍ය වෙයි.

* *ආ. සං. බැංකුවේ ප්‍රමුඛතා පිළිබඳ වඩාත් පුළුල් පැහැදිලිකම*
  ආ. සං. බැං. ප්‍රමුඛතා කවරේ ද යන්නත් ඒ හා සම්බන්ධිත ගැටලුවල දී එය කුමන ආස්ථානයක රැඳී සිටින්නේ ද යන්නත් ඊට හේතු කවරේ ද යන්නත් දැන සිටිය යුතු ය. මෙය එකී තොරතුරු වඩා පුළුල් ප්‍රේක්ෂක පිරිසකට කාර්යක්ෂම ව සන්නිවේදනය කිරීමෙහි ලා එයට ඇති හැකියාව සම්බන්ධයෙන් කේන්ද්‍රීය වෙයි.

* *ස්වීය චින්තනය*
  ආ. සං. බැං. පර්යේෂණ කටයුතු මෙහෙය විය යුතු අතර ආයතනයේ සීමාවන්ගෙන් ඔබ්බෙහි පවත්නා වැදගත් වාද විෂයන් සම්බන්ධයෙන් ආස්ථානයන් බාහිර ප්‍රේක්ෂක පිරිස් අතර සක්‍රිය ව ප්‍රචලිත කළ යුතු ය.

* *තොරතුරු ව්‍යාප්ත කිරීමේ කාර්ය සාධක මූලෝපාය*
  ආ. සං. බැං. එහි මෙහෙයුම් පළපුරුද්ද හා පර්යේෂණ ඉලක්ක කර ගැනුණු ප්‍රේක්ෂක පිරිස්වලට අලෙවි කෙරෙන යෝග්‍ය හා ලබා ගත හැකි ප්‍රකාශන නිර්මාණය කිරීමෙහි ලා බලය සපයන බැව් සහතික කළ යුතු ය.

* *සක්‍රිය අභ්‍යන්තර සන්නිවේදනය*
  අදහස්/මත කාර්ය සාධක අයුරින් බාහිර ප්‍රේක්ෂක පිරිස් වෙත සන්නිවේදනය කිරීමට කාර්ය මණ්ඩලය අපේක්ෂා කරන්නේ නම් ඔවුහු ප්‍රථමයෙන් ම ආ. සං. බැංකුවේ අදහස්/මත දැන සිටිය යුතු ය. මේ සඳහා ආ. සං. බැං. ඇතුළත වඩා සක්‍රිය අභ්‍යන්තර සබඳතා අවශ්‍ය කරයි.

*(ආ) තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟීම*

*1. තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ලක්ෂණ*

19. තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය ආ. සං. බැං. "තොරතුරු අනාවරණය කිරීමට පක්ෂ පූර්වානුමිතියකට (Presumption)" බැඳ තබයි. සමහර නෛතික හා ප්‍රායෝගික නිරෝධක නො මැති තත්වයන් තුළ පූර්වානුමිතිය අදාළ වෙයි. *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* ආ. සං. බැංකුවේ මෙහෙයුම් සිදු කෙරෙන සියලු ක්ෂේත්‍ර තුළ හැකි ඉහළ ම මට්ටමේ පාරදෘශ්‍යතාවක් සලසා දීම අරමුණු කරයි. එහි දූත මෙහෙවරවල සාර්ථකත්වය සහතික කර ගැනීමට ද ආයතනය කෙරෙහි පවත්නා මහජන සහයෝගය චිරස්ථායී කර ගැනීමට හා එය උපකාර කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් සඳහා ආදර්ශයක් ලෙස සේවය කිරීමට එයට හැකි කර වනු පිණිස ද පාරදෘශ්‍යතාව අවශ්‍ය වෙයි. *තොරතුරු අනාවරණය* කිරීමේ ප්‍රතිපත්තිය වර්ගීකරණ ප්‍රභේද තුනක් සකසයි:"රහස්‍යයි", "කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි" හා "වර්ග නො කළ" යනුවෙනි.

20. ව්‍යාපෘති හෝ වැඩසටහන් ආකෘති ප්‍රථමයෙන් ආ. සං. බැංකුවේ ව්‍යාපාරික අවස්ථා - ADB Business Opportunities තුළ ලැයිස්තුගත කරන ලද කල්හි ඒවා සියලු ම ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සූදානම් කර තිබීමක් අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය මඟින් ඉල්ලා සිටිනු ලබයි. ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් පාලක මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු රාජ්‍ය අංශයේ ව්‍යාපෘති හෝ වැඩසටහන් ආකෘති නිතිපතා යාවත්කාල කිරීම අවශ්‍ය වෙයි. එහෙත් පුද්ගලික අංශයේ ව්‍යාපෘති ආකෘතිවල දී මේ සම්බන්ධයෙන් නිහඬ පිළිවෙතක් පවත්වා ගෙන යනු ලැබේ. අනාවරණය කිරීම සිදු විය හැක්කේ කවර කොන්දේසි යටතේ දැයි යන්න සමහර ලේඛන සඳහා පැහැදිලි කරනු ලැබේ. මේ ලේඛන අතරට සභාපතිවරයාගේ වාර්තා හා නිර්දේශ ද තාක්ෂණික සහායක වාර්තා ද ක්ෂේත්‍ර ලේඛන ද ශක්‍යතා අධ්‍යයන හා පාරිසරික වාර්තා ද ඇතුළත් වේ. ව්‍යාපෘති පිළිබඳ තාක්ෂණික තොරතුරු හෝ *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* තුළ ගෙන හැර දක්වා නැති ලේඛන සඳහා කෙරෙන ඉල්ලීම් අදාළ දෙපාර්තමේන්තුව හා කාර්යාලය මෙන් ම අදාළ ආණ්ඩුව විසින් ද අනුමත කළ යුතු ව තිබේ. අවසාන වශයෙන්, තොරතුරු ඉල්ලා සිටින්නන්ට වැඩ කරන දින 22ක් ඇතුළත ආ. සං. බැංකුවෙන් ප්‍රතිචාරයක් ලැබිය යුතු බව *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* විශේෂ කොට සඳහන් කරයි.

*2. ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීම*

21. *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* තෝරා ගනු ලැබූ තැන් පටන් ආ. සං. බැංකුවේ බාහිර ප්‍රේක්ෂක පිරිස්වලට වැඩිමනත් තොරතුරු ලබා ගැනීමට හැකි තත්වයක් නිර්මාණය කර තිබේ; මේ ක්‍රියාදාමය තුළ දී එය ආ. සං. බැංකුවේ භූමිකාව, අරමුණු හා මෙහෙයුම් පිළිබඳ ව මහජනතාවගේ දැනුවත්කම ඉහළ දැමීමට දායක වී තිබේ. පාරදෘශ්‍යතාවෙන් අත් වන බොහොමයක් ප්‍රතිලාභ හඳුනා ගනු ලැබ ඇති නමුදු ක්‍රියාත්මක කිරීමේ මුලෝපායක් නො මැතිකම ඒවා සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගනු ලැබීමෙන් වළක්වා තිබේ.

22. අනාවරණය කිරීම නිතර ම සත්‍ය යැයි නො හඟින බවත් රහස්‍ය භාවය සම්බන්ධයෙන් පැහැදිලි නිර්ණායකයක් අවශ්‍ය බවත් බොහොමයක් බාහිර බැඳුම්කර දරන්නෝ සඳහන් කර ඇත්තාහ. භාවිතයේ දී තොරතුරු "රහස්‍ය" වේ ද නැද්ද යන්න ආ. සං. බැංකුවේ හා සාමාජික ආණ්ඩුවල අභිමතයට යටත් වේ. ආ. සං. බැං. බොහෝ විට ණයගැතියාගේ තොරතුරු පිළිබඳ විස්තර රහස්‍ය ලෙස පිළිගන්නේ යැයි පැවසේ. මේ නිසා අනාවරණය කිරීමට පක්ෂ ව පවත්නා පූර්වානුමිතිය ප්‍රශ්න කිරීමට ලක් වෙයි. අනාවරණය කිරීම් බොහෝ විට සිදු වන්නේ සාකච්ඡා නිම කිරීමෙන් හා නිශ්චිත

මූලෝපායක්, ප්‍රතිපත්තියක් හෝ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් තීරණ ගනු ලැබීමෙන් පසු ව පමණක් යැයි බාහිර පාර්ශ්වකරුවෝ ප්‍රකාශ කර සිටිති.

23. දැනට පවත්නා *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* වැඩි දියුණු කිරීමට අවශ්‍ය කෙරෙන තවත් ක්ෂේත්‍ර පවතියි. සමහර ක්ෂේත්‍ර තුළ *අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය* අපැහැදිලි හා ව්‍යාකූල සහගත තත්වයක පවතින අතර දැනට පවත්නා බොහෝ ලේඛන මූලික ලේඛනය (text) තුළ දක්වා නැත. ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශවල පදිංචි ව සිටින පුද්ගලයන්ට හා ඔවුන් වෙනුවෙන් ගැටලු ඉස්මතු කරන සංවිධානවලට සමහර වැදගත් ලේඛන අනාවරණය කිරීමට ආ. සං. බැංකුවෙන් හා සාමාජික රටවල ආණ්ඩුවලින් අනුමතිය ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම්වලට හා උත්සාහයන්ට ප්‍රතිචාර දැක්වීමට තමන් වැය කරන කාලය ගැන බොහෝ කාර්ය මණ්ඩල කනස්සල්ල පළ කර තිබේ. සමහර කාර්ය මණ්ඩල කවර තොරතුරු නිකුත් කළ හැකි ව තිබේ ද අනාවරණය කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම්වලට වග කිව යුත්තේ කවර කාර්යාලයන් ද එකී ඉල්ලීම් සම්බන්ධීකරණය කළ යුත්තේ කෙසේ ද යන්න ගැන අනිශ්චිතතාව පළ කර තිබේ. ඔවුන්ට පැහැදිලිකම හා පුහුණුව අවශ්‍ය කෙරේ. එමතු නො ව, ව්‍යාපෘති ආකෘතීන්හි අනිවාර්ය නවීකරණය කිරීම් ආ. සං. බැංකුවේ පරිපාලන පද්ධතිය මඟින් බාධා කරනු ලබන බවත් ඊට අඩු ප්‍රමුඛත්වයක් දෙනු ලබන බවත් කාර්ය මණ්ඩලය ප්‍රකාශ කරයි.

24. අත්දැකීම් පෙන්නුම් කර තිබෙන්නේ වඩා පුළුල් විවෘත භාවය හා තොරතුරු බෙදා හදා ගැනීම මෙහෙයුම්වල ගුණාත්මක භාවය වැඩි දියුණු කර තිබෙන බව ය.[9] ව්‍යාපෘති සැලසුම් කිරීමේ හා ක්‍රියාවට නැඟීමේ කාල පරිච්ඡේදය තුළ ප්‍රමාණවත් තොරතුරු ලබා ගත හැකි තත්වයක් හා ප්‍රමාණවත් තරම් කල් වේලා ඇති ව තොරතුරු ලබා ගත හැකි තත්වයක් නිර්මාණය නො කරන ලද කල්හි ව්‍යාපෘති දේශීය ගනුදෙනුකාර කණ්ඩායම්වලින් පැමිණිලි උත්පාදනය කරන බව ද අත්දැකීම්වලින් පෙන්නුම් කර තිබේ.[10] අර්ථවත් උපදේශනයට හා සහභාගිකත්ව සංවර්ධනයට වැඩි සහයෝගයක් පළ කරන සංශෝධිත ප්‍රතිපත්තියක අවශ්‍යතාවක් පවතින බව බොහෝ කාර්ය මණ්ඩල හඟියි.

25. ඒ සමඟ ම, කාර්ය මණ්ඩලය අභ්‍යන්තර සාකච්ඡාමය ක්‍රියාදාමය ආරක්ෂා කිරීමේ ද සාමාජික රටවල ආණ්ඩුවල විශ්වාසය පවත්වා ගැනීමේ හා සේවාදායකයන් වෙත ප්‍රබල නැඹුරුවක් පවත්වා ගැනීමේ ද අවශ්‍යතාව සමඟ පාරදෘශ්‍යතාව තුලනය කළ යුතු ව තිබෙන බව පිළිගනියි. රහස්‍ය භාවය වඩාත් ම අදාළ වන්නේ සාකච්ඡා හෝ වාද විවාදවල මුල් අවධීන්හි දී බව පොදුවේ සලකනු ලැබේ. මේ අවධීන්හි දී නිරතුරු ව සංවේදී ක්ෂේත්‍ර තුළ ආණ්ඩුවලට අවංක උපදෙසක් සපයනු ලැබේ. අති විශාල වැඩ සම්භාරයක් ගෙන හැර දක්වමින් මෙහෙයුම් කාර්ය මණ්ඩල අසාධාරණ වගකීම් එකතු කෙරෙන නව අනාවරණය කිරීමේ අවශ්‍යතා පැනවීමට එරෙහි ව ද අනතුරු අඟවයි.

***(ඇ) නිගමනය***

26. 1994 *තොරතුරු ප්‍රතිපත්තිය* හා අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය යාවත්කාල කිරීම අවශ්‍ය ව තිබේ. එහි වගකීම් වඩාත් පුළුල් පාරදෘශ්‍යතාවකින් යුතු ව ඉටු කිරීමට හා එහි පාර්ශ්වකරුවන්ගේ ගෞරවය හා විශ්වාසය දිනා ගැනීමට බාහිර සබඳතා සම්බන්ධයෙන් ආ. සං. බැං. වඩාත් ඍජු හා කේන්ද්‍රගත ප්‍රවේශයක් වර්ධනය කළ යුතු ය. සවිමත් නායකත්වයකින් ද ප්‍රමාණවත් සම්පත්වලින් ද ආයතනය ඇතුළත ම බාහිර සබඳතාවල භූමිකාව ගැන සිතන ආකාරයෙහි වෙනසක් ද මඟින් මීට සහාය ලැබිය යුතු ව තිබේ. එබඳු ප්‍රවේශයක් ආ. සං. බැංකුවේ කටයුතු තුළ පාර්ශ්වකරුවන්ගේ අර්ථවත් සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිසි කලට හා ප්‍රමාණවත් ව සිදු කෙරෙන තොරතුරු අනාවරණය කිරීම්වලට අනුග්‍රහය දක්වන ඒකාබද්ධ සංස්කෘතියක් මත පදනම් කළ යුතු ව තිබේ.

## iv. ප්‍රතිපත්තිය

27. මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය (ප්‍රතිපත්තිය - the Policy) ආ. සං. බැං. කෙරෙහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය හා ආ. සං. බැං. සමඟ කාර්ය නියුක්ත වීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි. ආ. සං. බැංකුවේ මෙහෙයුම් තුළ වඩාත් පුළුල් සංවර්ධනාත්මක බලපෑමක් පවත්නා බැව් සහතික කිරීමට ප්‍රතිපත්තිය පහත පෙනෙන තතු ප්‍රවර්ධනය කරයි:

* ආ. සං. බැංකුවේ ක්‍රියාකාරකම්, ප්‍රතිපත්ති, මූලෝපායන්, අරමුණු හා ප්‍රතිඵල පිළිබඳ ව ආ. සං. බැංකුවේ ගනුදෙනුකාර කණ්ඩායම් ද වෙනත් පාර්ශ්වකරුවන් හා පොදු ජනතාව ද අතර දැනුවත්කම හා අවබෝධය;

* සංවර්ධන ගැටලු සම්බන්ධයෙන් නැවුම් හා නවීකාරක පර්යාවලෝකයන් සැපයීම පිණිස සංවර්ධන දැනුම හා උගත් පාඩම් බෙදා හදා ගැනීම හා හුවමාරුව;

* ආ. සං. බැං. හා එහි ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වන මහජනයා ඇතුළු එහි පාර්ශ්වකරුවන් අතර වඩාත් පුළුල් ද්විමාර්ගික තොරතුරු ගලා යාමක් සහතික කෙරෙන සහභාගිකත්ව සංවර්ධනය;

* ආ. සං. බැං. තුළ පාරදෘශ්‍යතාව හා වග උත්තර සැපයීමට බැඳී සිටීම (accountability).

28. මේ අරමුණු ඉටු කර ගැනීමට ආ. සං. බැං. එහි කටයුතු ගැන එය සතු දැනුම හා තොරතුරු ද එහි අදහස් හා මතයන් ද පාර්ශ්වකරුවන් හා පොදු මහජනතාව සමඟ ප්‍රගාමී ව බෙදා හදා ගනු ඇත; තොරතුරු සඳහා කෙරෙන පුද්ගල ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් ද ආ. සං. බැං. තොරතුරු අනාවරණය කරනු ඇත. රහස්‍ය භාවය ආරක්ෂා කිරීමට බල කෙරෙන හේතුවක් නො මැති තත්වයන් තුළ තොරතුරු අනාවරණය කිරීමට පක්ෂ ව පූර්වානුමිතියක් පවතිනු ඇත.

29. පාරදෘශ්‍යතාව සංවර්ධනය විපුලිත කරනවා පමණක් නො ව ආයතනය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය වර්ධනය කරනු ඇති බව ද ආ. සං. බැං. පිළිගනියි. ආ. සං. බැං. පාරදෘශ්‍යතාව පිළිබඳ සාධනීය ආදර්ශයක් බවට පත් වීමටත් පාරදෘශ්‍යතා ගැටලුව සම්බන්ධයෙන් එය සාමාජිකයන්ට සපයන උපදේශය සමඟ ගැලපෙන ආකාරයකින් ක්‍රියා කිරීමට උත්සාහ දරයි.

30. ආ. සං. බැං. සාමාජික රටවල් සංවර්ධනය කිරීමෙහි ලා එය සහයෝගය දෙන ක්‍රියාකාරකම්වල රාෂ්ට්‍රීය හිමිකමෙහි ඉමහත් වැදගත්කම ද පිළිගනියි. ඒ නිසා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟූ කල්හි සංවර්ධනය වෙමින් පවතින මේ සාමාජික රටවල්වල දර්ශනයන් හා අයිතිවාසීන්ට ගරු කරනු ලබනු ඇත.

31. ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් ගැන තොරතුරු හා අදහස් ඉල්ලා සිටීමට, ලබා ගැනීමට හා බෙදා දීමට ඇති අයිතියට ආ. සං. බැං. සහාය දෙයි. ආ. සං. බැං. නිසි කල්හි, පැහැදිලි ව හා උචිත ආකාරයට තොරතුරු සපයනු ඇත. එබැවින් එයට පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනයෙහි යෙදීමට, ඔවුන්ට සවන් දීමට හා ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර සලකා බැලීමට හැකි වෙයි. ආ. සං. බැංකුවේ ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වන ජනයාට ව්‍යාපෘති සැලසුම්වලට හා ඒවා ක්‍රියාත්මක කිරීම්වලට අර්ථවත් ආදානයන් සැපයීමට ප්‍රමාණවත් තරම් කල් වේලා ඇති ව ඔවුන් සමඟ තොරතුරු බෙදා හදා ගනු ඇත.

32. තම අතීත අත්දැකීම්වලින් පාඩම් ඉගෙන ගැනීම මඟින් ක්‍රියාකාරිත්වයන් වැඩි දියුණු කර ගැනීමට ආ. සං. බැං. ජයග්‍රහණයන් මෙන් ම අසාර්ථකත්වයන් හා

බලාපොරොත්තු සුන් වීම් ද වාර්තා කරනු ඇත. ආ. සං. බැංකුව තොරතුරු නිශේධාත්මක වූ පමණින් ම ඒවා නිකුත් නො කර රඳවා නො තබනු ඇත. ආ. සං. බැංකුව ප්‍රතිපත්ති හා මෙහෙයුම් පිළිබඳ නිර්මාණශීලී විවාදයක් හා සංවාදයක් සඳහා උනන්දු කර වනු ඇත. පොදු ආයතනයක් හැටියට ආ. සං. බැංකුව එහි කටයුතු පිළිබඳ ව ප්‍රසිද්ධියේ වග උත්තර සැපයිය යුතු ව තිබේ.

33. ආ. සං. බැං. තෝරා ගත් පදනමක් යටතේ තොරතුරු අනාවරණය නො කරනු ඇත; ප්‍රතිපත්තියෙහි කොන්දේසිවලට මූලෝපායට හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අනුකූල ව ප්‍රතිපත්තිය යටතේ ආ. සං. බැං. ලබා ගැනීමට සලස්වන තොරතුරු කරා ප්‍රවේශ වීමට මහජනයාට සමාන අයිතිය හිමි වනු ඇත.

34. ආ. සං. බැං. ආසියාව තුළ දිළිඳුකම පහත හෙළීමෙහි ලා එහි භූමිකාව ගැන එහි සාමාජිකයන්ගේ ද සිවිල් සමාජ සංවිධානයන්ගේ ද ව්‍යාපාරවල ද මාධ්‍යවල ද අධ්‍යාපන ආයතනයන්ගේ ද සංවර්ධන හවුල්කරුවන්ගේ හා පොදු මහජනතාවගේ ද වැටහීම වැඩි දියුණු කිරීමට උත්සාහ දරනු ඇත.

35. නෛතික හා ප්‍රායෝගික හේතු නිසා පූර්ණ අනාවරණය කිරීම් සෑම විට ම සිදු කළ නො හැකි ය. උදාහරණයක් වශයෙන්, ආ. සං. බැං. සංකල්ප ගවේෂණය, තොරතුරු බෙදා හදා ගැනීම, අභ්‍යන්තරික ව හා එහි සාමාජිකයන් සමඟ විවෘත සාකච්ඡා පැවැත්වීම හා පුද්ගලික අංශය තුළ එහි මෙහෙයුම්වල විශේෂ අවශ්‍යතා සලකා බැලීම අවශ්‍ය වෙයි. ආ. සං. බැං. එහි කාර්ය මණ්ඩලයේ රහස්‍ය භාවය සුරක්ෂිත කළ යුතු අතර රාජ්‍ය නො වන ව්‍යාපාරික තොරතුරු ද පුද්ගලික අංශයේ අනුග්‍රාහකයන් හා සේවාදායකයන් ද ආරක්ෂා කළ යුත්තේ ය. කෙසේ වෙතත්, ව්‍යාතිරේකයන් සීමා සහිත වන අතර ආ. සං. බැං. එය නිපදවන සියලු තොරතුරු අනාවරණය කළ යුත්තේ ය. එසේ කළ යුත්තේ එබඳු තොරතුරු ප්‍රතිපත්තියේ 126, 127 හා 130 යන ඡේද තුළ පැහැදිලි ව දක්වා ඇති ව්‍යාතිරේකයන්ට ඇතුළත් නො වන්නේ නම් පමණි.

36. ප්‍රතිපත්තිය තුළ දැක්වෙන වෙනත් ප්‍රතිපාදන මඟින් සීමා කරනු නො ලබන්නේ නම් තොරතුරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයට බෙදා දෙන ලද අවස්ථාවේ ම අනාවරණය කළ යුතු අතර සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ලේඛන ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවස්ථාවේ ම අනාවරණය කළ යුත්තේ ය.

37. ආ. සං. බැං. ප්‍රතිපත්තිය තුළ දක්වා ඇති පොදු මූලධර්ම පහත සැකෙවින් දැක්වෙන මූලෝපාය තුළින් ක්‍රියාත්මක කළ යුත්තේ ය. මූලෝපාය ආ. සං. බැං. ප්‍රගාමී ව ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තත්වයට පත් කළ යුතු තොරතුරු කවරේ දැයි පෙන්නුම් කරන අතර ඉල්ලීමක් මත තොරතුරු ලබා ගැනීමට හැකි තත්වයක් සැලැස්විය යුතු හෝ ආ. සං. බැංකුවේ අනුමතියෙන් තොර ව තොරතුරු ලබා නො දීමට ක්‍රියා කළ යුතු සමහර අවස්ථා ද පෙන්නුම් කරයි.

38. ප්‍රතිපත්තියෙහි අඩංගු අනාවරණය කිරීමේ ප්‍රතිපාදන (වෙනත් ප්‍රතිපාදන නො වේ) හා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ වෙනත් ඕනෑ ම ප්‍රතිපත්තියක් අතර කවර හෝ ගැටුමක් උද්ගත වන අවස්ථාවක ප්‍රතිපත්තිය තුළ අඩංගු අනාවරණය කිරීමේ ප්‍රතිපාදන ආධිපත්‍යය දරනු ඇත්තේ ය.

## v. මූලෝපාය

39. ප්‍රතිපත්තියෙහි අරමුණු මුදුන් පත් කර ගැනීමට විශේෂිත ප්‍රතිදාන දෙකක් නිකුත් කිරීම සඳහා මේ මූලෝපාය සැලසුම් කර තිබේ.

    1. ප්‍රගාමී බාහිර සබඳතා; සහ

2. ආ. සං. බැංකුවේ මෙහෙයුම් ගැන තොරතුරු ලබා ගැනීමේ වැඩි දියුණු කරන ලද මාර්ග.

40. මූලෝපාය එකිනෙකින් වෙන් වූ එහෙත් ඌනපූරක සංරචකයන්ගෙන් සමන්විත වෙයි: බාහිර සබඳතා හා තොරතුරු අනාවරණය කිරීම යනුවෙනි. ආ. සං. බැං. ප්‍රචලිත කිරීම මඟින් හා එහි ප්‍රධාන ගනුදෙනුකාර කණ්ඩායම් විසින් එය වටහා ගනු ලබන තත්වයක් නිර්මාණය කිරීම මඟින් බාහිර සම්බන්ධකම් මූලික වශයෙන් ශක්තිමත් බාහිර සබඳතා ගොඩ නැංවීම කෙරෙහි යොමු වෙනු ඇත - ප්‍රතිදාන (i). තොරතුරු අනාවරණය කිරීම සහභාගිකත්වයන් - විශේෂයෙන් ම, ආ. සං. බැං. සමඟ ඍජු ක්‍රියාකාරී හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන් හා සංවිධාන සමඟ - ශක්තිමත් කිරීම අරමුණු කරනු ඇත - ප්‍රතිදානය (ii).

### (අ) බාහිර සබඳතා

41. කේන්ද්‍රගත කළ බාහිර සබඳතා මූලෝපායක් මඟින් ආ. සං. බැං. බාහිර සබඳතාවලට එහි ප්‍රවේශය වඩා සවිමත් ද පිරිපහදු ද කරනු ඇත. ආ. සං. බැං. එහි සාමාජිකයන්ට වැදගත් ගැටලු සම්බන්ධයෙන් පැහැදිලි ආස්ථානයන් වර්ධනය ද මේ ආස්ථානයන් පැහැදිලි කිරීමට එහි තොරතුරු නිෂ්පාදනයන් වැඩි දියුණු ද මේ නිෂ්පාදන වඩාත් පෘථුල ලෙස ව්‍යාප්ත ද කරනු ඇත. බාහිර සබඳතාවන්ගේ වැදගත්කම සංවිධානය තුළ පැහැදිලි කිරීම සඳහා ආ. සං. බැං. එහි සංවිධානාත්මක විධිවිධාන පෙළ ගස්වනු ඇති අතර යථා පරිදි එහි කාර්ය මණ්ඩලවල නිපුණතා සංකලනය වෙනස් කරනු ඇත.

### 1 පූර්ව අවශ්‍යතාවෝ

42. ආ. සං. බැං. එහි පාර්ශ්ව දර්ශනය (Profile) උසස් මට්ටමකට නැංවීම සඳහා:

(i) එය සංවර්ධන ගැටලු පිළිබඳ නැවුම් (ස්වීය) සංකල්ප හා ප්‍රතිවේදී (විනිවිද දක්නා) පණිවුඩ නිපදවන බව ද

(ii) එය එහි ක්‍රියාකාරී අත්දැකීම් හා පර්යේෂණ යන දෙඅංශයෙන් ම හට ගැනෙන මේ ගැටලු පිළිබඳ ව ජාත්‍යන්තර සාකච්ඡාවන්හි සක්‍රිය ව නිරත වන බව ද

(iii) එය මාධ්‍ය හා අනෙකුත් බාහිර ප්‍රේක්ෂක පිරිස් හමු වීමට අඛණ්ඩ ව උත්සාහ කරන බව ද

(iv) කාර්ය මණ්ඩල ගැටලු පිළිබඳ එහි මතයන් හා ආස්ථානයන් ගැන දැනුවත් වීම පිණිස එය සක්‍රිය හා විවෘත අභ්‍යන්තර සන්නිවේදනයන් පවත්වා ගෙන යන බව ද

(v) එය යහපත් මෙහෙයුම් වාර්තා පවත්වා ගෙන යන බව; හා

(vi) මෙහෙයුම් කාර්ය මණ්ඩල ආ. සං. බැංකුවට ඍජු ක්‍රියාකාරී හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන් හා සංවිධාන සමඟ සවිමත් සබඳතා පවත්වා ගන්නා බව ද සහතික කළ යුත්තේ ය.

### 2. නායකත්වය හා අභිප්‍රේරණයෝ (motivations)

43. ආ. සං. බැංකු පාලක මඬුල්ලෙහි සෑම සාමාජිකයකු විසින් ම බාහිර සබඳතා සවිමත් කිරීමට ප්‍රබල ලෙස ද අතිශය විශද ආකාරයෙන් ද කැප වීම තීරණාත්මක වෙයි. ආ. සං. බැංකුවේ බාහිර සබඳතා මූලෝපාය අර්ථ දැක්වීමෙහි, යාවත්කාල කිරීමෙහි හා ක්‍රියාත්මක කිරීමෙහි ලා පාලක මඬුල්ල ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරනු ඇත. එපරිදි ම, ආ. සං. බැංකුවේ ප්‍රමුඛ සන්නිවේදකයෝ ද පාලක මණ්ඩල සාමාජිකයෝ ද බාහිර

සබඳතා ක්‍රියාකාරකම්වල සක්‍රිය ව සහභාගි වනු ඇති අතර ආධාර දෙන රටවල හා ආධාර ලබා ගන්නා රටවල තීරකයන් හා මත පළ කරන නායකයන් ඇතුළු ආ. සං. බැංකුවේ මූලික ප්‍රේක්ෂක පිරිස් සමඟ ශක්තිමත් සබඳතා තහවුරු කර ගනු ඇත.

44. බාහිර ප්‍රේක්ෂක පිරිස් සමඟ ප්‍රගාමී ව කාර්ය නියුක්ත වීමට ආ. සං. බැංකුවේ බොහොමයක් කාර්ය මණ්ඩල තුළ පසු බෑමක් පවතින්නා වූ ද බාහිර සබඳතා අඩු ප්‍රමුඛතාවක් ලැබෙන ක්‍රියාකාරකමක් පමණක් නො ව අවදානම් සහගත කාර්යයක් වන්නේ ය යන්න ආ. සං. බැං. තුළ පුළුල් ලෙස විශ්වාස කරන මතයක් බවට පත් ව තිබෙන්නා වූ ද තතු යටතේ පාලක මණ්ඩලය සියලු කාර්ය මණ්ඩල බාහිර සබඳතාවන්හි සක්‍රිය ව සහභාගි කරවා ගැනීමෙහි ලා උනන්දු කර වීම අත්‍යවශ්‍ය වෙයි. තම වැඩකටයුතු පිළිබඳ ව ප්‍රසිද්ධියේ කරුණු දැක්වීම දැන් ප්‍රමුඛ කාර්යයක් විය යුතු ව තිබෙන බව සියලු කාර්ය මණ්ඩල වටහා ගන්නා බව පාලක මණ්ඩලය විසින් සහතික කෙරෙනු ඇත. පාලක මණ්ඩලය තම පාර්ශ්වයෙන්, කාර්ය මණ්ඩල සමඟ සිය සන්නිවේදනයන් ශක්තිමත් කරනු ඇති අතර අදහස් බෙදා හදා ගැනීම හා සියලු ම මට්ටම්වල දී කාර්ය මණ්ඩල කෙරෙන් ප්‍රතිපෝෂණ ලබා ගැනීමට උත්සාහ දරනු ඇත.

## 3. ඉලක්ක කර ගැනුණු ප්‍රේක්ෂක පිරිස්

45. ආ. සං. බැං. පුළුල් පරාසයක ප්‍රේක්ෂක පිරිස් සමඟ කටයුතු කරන අතර ඔවුන් මත අනුහස පැතිර වීමට බලාපොරොත්තු වෙයි (1 වැනි කොටුව බලන්න). මේ සෑම ප්‍රේක්ෂක පිරිසක් ම ආ. සං. බැංකුවට වැදගත් වන අතර ඔවුන්ට එහි කාර්ය සාධකත්වයට දායක ද විය හැකි ය. ආ. සං. බැංකුවේ සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල් - එය එහි වැඩ කටයුතුවලින් විශාල ම කොටසක් සිදු කරන්නේ මේ රටවල් තුළ ය - එදිනෙදා මෙහෙයුම් තුළ එහි ඉතා ම වැදගත් හවුල්කරුවන් වේ. ආ. සං. බැං. දිගු කාලීන ඉලක්ක අත් පත් කර ගැනීමට අදහස් කරන්නේ නම් මේ රටවල තීරකයන් හා මත පළ කරන නායකයන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩ නඟා ගැනීම තීරණාත්මක වෙයි. මේ සබඳතා වර්ධනය කර ගැනීමෙහි හා පවත්වා ගැනීමෙහි ලා දූත මණ්ඩල ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරනු ඇත. ආධාර දෙන රටවල තීරකයන් හා මත පළ කරන නායකයන් ද අනෙකුත් සංවර්ධන සංවිධාන හා සිවිල් සමාජය ඇතුළු වෙනත් ප්‍රේක්ෂක පිරිස් සමඟ ද විශ්වාසවන්ත සබඳතා ගොඩ නඟා ගැනීම ආ. සං. බැංකුවේ මෙහෙයුම් හා ඒවායේ කාර්ය සාධකත්වය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අවියෝජනීය අංග වෙයි (9-14 දක්වා පරිච්ඡේද බලන්න).

46. සම්පත් සෑම විට ම සීමා සහිත වන හෙයින් ආ. සං. බැං. එහි ප්‍රේක්ෂක පිරිස්වලට ප්‍රමුඛත්වය දිය යුතු ය. සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවල් තුළ පුළුල් පරාසයක තීරකයන් හා මත පළ කරන නායකයන් සමඟ දැනටමත් පවත්නා වැඩ කිරීමේ සමීප සබඳතා යටතේ මේ මූලෝපාය මූලික වශයෙන් ආධාර දෙන රටවල් තුළ නව ප්‍රේක්ෂක පිරිස් කරා ළඟා වීම අවධාරණය කරයි. ප්‍රේක්ෂක පිරිස්වලට ප්‍රමුඛත්වය දීම පහත දැක්වෙන නිර්ණායක මත පදනම් වනු ඇත:

(i) *තීරකයන් මත ඇති කරන බලපෑමේ මට්ටම*
ආ. සං. බැංකුවේ මෙහෙයුම් විවිධාකාර තීරකයන්ගේ මූලික වශයෙන්, ඇමතිවරුන්ගේ ද පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ හා ජාතික විධායකයන්ගේ ද බලපෑමට පාත්‍ර වේ. ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් තෝරා ගනු ලබන්නේ මේ තීරකයන්ගේ අදහස් මත ඔවුන් ඇති කරන බලපෑමේ පදනම මත ය.

(ii) *වක්‍රාකාරයෙන් ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් වෙත "යොමු වන මාර්ග"* (Channels) ලෙස ඉටු කෙරෙන භූමිකාව. බොහෝ ක්‍රියාධරයන් විසින් ආ. සං. බැං. පිළිබඳ තොරතුරු හා මත පළ කරනු ලබන අතර ඉක්බිති ඒවා වඩා පුළුල් ප්‍රේක්ෂක පිරිස් වෙත යොමු කරනු ලැබේ. ආ. සං. බැං. එහි පණිවුඩවලට මූලෝපාය මඟින් සෘජු ව ඉලක්ක කරනු නො ලබන ප්‍රේක්ෂක පිරිස් කරා ළඟා වීමට හැකි කර වන සබඳතා ගොඩ නඟනු ඇත.

47. සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවල් තුළ ප්‍රේක්ෂක පිරිස් සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම ආ. සං. බැංකුවේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවල වගකීමක් ලෙස පවතිනු ඇත. මේවා ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වූ ජනයා සමඟ ආ. සං. බැංකුවේ සබඳතා පවත්වා ගැනීමේ ලක්ෂ්‍යයන් වනු ඇති අතර විශේෂිත මෙහෙයුම් සමඟ සෘජු ව සම්බන්ධ වී සිටින හා උත්සුක වන සිවිල් සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ගොඩ නැඟීමට වගකිව යුතු වනු ඇත. රාජ්‍ය නො වන සංවිධාන මධ්‍යස්ථානය පොදුවේ සිවිල් සමාජය සමඟ සබඳතා තහවුරු කිරීම හා පවත්වා ගැනීම පිළිබඳ වගකීම භාර ගන්නවා ඇත.

48. පොදු ජනතාව කරා ළඟා වීම ආ. සං. බැංකුවට වැදගත් වන අතර මේ මූලෝපාය ආධාර දෙන රටවල් තුළ හෝ සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවල් තුළ හෝ පුද්ගලික අංශය තුළ සිටි ජනතාව සෘජු ව ඉලක්ක නො කරයි. පොදු ජනතාව සමඟ ආ. සං. බැංකුවේ කාර්ය නියුක්තිය අනියම් එකක් ව පවතිනු ඇත.[11]

## 4 ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් කරා ළඟා වීම සඳහා ප්‍රවේශයෝ

49. ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් සමඟ ශක්තිමත් හා කල් පවත්නා සබඳතාවන් ගොඩ නැඟීම සඳහා ස්ථාවර පෞද්ගලික අන්තර් ක්‍රියාකාරිත්වයන් හා සෑහෙන තරම් තොරතුරු (හුදු මහජන සබඳතා පිළිබඳ තොරතුරු නො වේ) නිතිපතා හුවමාරු වීමක් අවශ්‍ය කෙරෙනු ඇත. විශේෂයෙන් ම, ජාත්‍යන්තර මාධ්‍යයක් වත් පර්යේෂණ මධ්‍යස්ථානයක් වත් නො වන ආ. සං. බැංකු මූලස්ථානය මැනිලා නුවර පිහිටා තිබෙන හෙයින් එබඳු සබඳතා තහවුරු කිරීම සඳහා කාලය ද මුදල් ද වැය වනු ඇත. දූත මෙහෙවර සිදු වන කාල පරිච්ඡේදයන් හි පාලක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් ද නියෝජිත කාර්යාල විසින් ද සබඳතා තහවුරු කොට පෝෂණය කරනු ඇත.

50. ආ. සං. බැං. ඉහළ ම ශ්‍රේණියේ මාධ්‍ය සමඟ එහි සබඳතා දැඩි කර ගනු ඇත. පාලක මණ්ඩලය හා කාර්ය මණ්ඩලය විකාශන මාධ්‍ය තුළ පෙනී සිටීමේ අවස්ථා ඉහළ යනු ඇති අතර ආ. සං. බැංකුවේ පර්යේෂණ හා මෙහෙයුම් ගැන ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස්වලට බලපාන පුවත්පත්, සඟරා හා රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහන් තුළ කෙරෙන සඳහන් කිරීම් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට ප්‍රයත්න ද දැරෙනු ඇත. ආ. සං. බැං. ගැන තොරතුරු ලබා ගැනීම සඳහා මත පළ කරන නායකයන් උපයෝගී කර ගන්නා මූලාශ්‍ර සම්බන්ධයෙන් නිරතුරු සමීක්ෂණ පවත්වනු ලබන ආ. සං. බැං. ඉලක්ක කෙරුණු මාධ්‍ය තේරීම් යථා පරිදි පිරිපහදු කරනු ඇත.

51. බාහිර සබඳතා තහවුරු කිරීම යුරෝපය, ජපානය හා දකුණු ඇමෙරිකාව තුළ නියෝජිත කාර්යාලවල මූලික කාර්යය බවට පත් වනු ඇත. මේ කාර්යාල මාධ්‍ය හා මත පළ කරන නායකයන් අතර සබඳතා ප්‍රවර්ධනය කිරීමට ද සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ආ. සං. බැංකුවේ මත හා තොරතුරු පතුරුවා හැරීමට ද සංවර්ධනය පිළිබඳ ව ප්‍රසිද්ධ සාකච්ඡා හා වාද විවාදවල නිරත වීමට ද කටයුතු කරනු ඇත.

52. පාලක මණ්ඩලය හා කාර්ය මණ්ඩල ආ. සං. බැංකුවේ පණිවුඩ හා එහි වැඩ කටයුතු සම්මේලන, සම්මන්ත්‍රණ හා වෙනත් බාහිර හා අභ්‍යන්තර ක්‍රියාකාරකම් තුළ දී උසස් කොට දැක්වීමට අඛණ්ඩ ව ක්‍රියා කරනු ඇත.[12] අර්ථභාරී බලපෑමක් අත් කර ගැනීමට වඩාත් කේන්ද්‍රගත කරන ලද පුළුල් ලෙස ව්‍යාප්ත වන මූලෝපායක් ක්‍රමානුකූල ව හඳුන්වා දෙනු ඇත.

## 5. ප්‍රධාන සන්නිවේදකයෝ

53. බාහිර වශයෙන් වඩාත් පුළුල් ලෙස ව්‍යාප්ත වීම සඳහා ලබා ගත හැකි සීමා සහිත සම්පත් සහිත දෙන ලද තත්වයක් යටතේ ආ. සං. බැං. එහි ප්‍රධාන සන්නිවේදකයන්

හා ඔවුන් ඉලක්ක කරනු ලබන සුවිශේෂී ප්‍රේක්ෂක පිරිස් පැහැදිලි ව අනන්‍ය කර ගත යුතු ය. සභාපතිවරයා හා උප සභාපතිවරු ආ. සං. බැංකුවේ ඉතා ම විශද සන්නිවේදකයෝ වෙති. ඔවුහු පෞද්ගලික සබඳතා, ඉහළ පෙළේ සමුලුවල පවත්වනු ලබන දේශන හා ඉහළ මට්ටමේ මාධ්‍ය සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡා හා ඒවායේ පළ කෙරෙන මත දැක්වීමේ ලිපි තුළින් ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස් අතර ආ. සං. බැංකුවේ ආංශික දර්ශනය ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්ට නායකත්වය දෙනු ඇත. ප්‍රධාන ආර්ථික විද්‍යාඥයා හා දූත මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල හා නියෝජිත කාර්යාල ඇතුළු අනෙකුත් දෙපාර්තමේන්තු හා කාර්යාල ප්‍රධානීහු බාහිර ප්‍රේක්ෂක පිරිස් සමඟ සක්‍රිය ව සන්නිවේදනයෙහි යෙදෙනු ඇත.

54. ඊට අතිරේක ව, ආ. සං. බැංකු කාර්ය මණ්ඩල අතර සිටි විශේෂඥවරු විශේෂයෙන් ම, ඔවුන් සුවිශේෂී අලෙවි කළ හැකි පර්යේෂණ මෙහෙයවා ඇත්නම් පෞද්ගලික සබඳතා තුළින් ද සම්මේලන ඇමතීම, මාධ්‍ය සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම හා තමන්ට විශේෂඥ දැනුමක් ඇති ක්ෂේත්‍ර ගැන මත පළ කිරීමේ ලිපි ලිවීම තුළින් ද සම්බන්ධතා ජාල ගොඩ නඟනු ඇත.

(ආ) තොරතුරු අනාවරණය කිරීම

55. ප්‍රතිපත්තිය ආ. සං. බැං. නිපදවන හෝ නිපදවීමට අවශ්‍ය කරනු ලබන ලේඛන සම්බන්ධයෙන් අනාවරණය කිරීමේ අවශ්‍යතා ස්ථාපනය කරයි. එය එබඳු ලේඛනගත කිරීම් සඳහා අවශ්‍යතා විස්තර කොට දක්වන්නේ නැත. ප්‍රතිපත්තිය පුරා ම ආ. සං. බැංකුවේ අනෙක් ප්‍රතිපත්ති ගැන සැඳහීම් (references) කරනු ලැබේ. ආ. සං. බැංකුවේ වෙනත් ප්‍රතිපත්තියක් ගැන කරනු ලබන කවර හෝ සැඳහීමකට කලින් කලට ආ. සං. බැං. විසින් සංශෝධනය කරන ලද ආකාරයට ඒ ප්‍රතිපත්තිය ඇතුළත් වේ. ප්‍රතිපත්තිය බලාත්මක වන දිනයට පසු ආ. සං. බැං. විසින් වර්ධනය කරන ලද හෝ සංශෝධනය කරන ලද කවර ප්‍රතිපත්තියක් හෝ මූලෝපායක් වේ නම් එය ප්‍රතිපත්තිය හෝ මූලෝපාය යටතේ නිපදවීමට අවශ්‍ය කෙරෙන ලේඛන හා වෙනත් තොරතුරු සම්බන්ධ අනාවරණ අවශ්‍යතා පැහැදිලි ව දැක්විය යුත්තේ ය. එබඳු අනාවරණය කිරීමේ අවශ්‍යතා ප්‍රතිපත්තිය තුළ දැක්වෙන පොදු මූලධර්ම සමඟ අනුරූප විය යුතු ය.

1. පරිවර්තන

56. ආ. සං. බැංකුවේ රාජකාරි කටයුතු කරන භාෂාව ඉංග්‍රීසි ය.[13] කෙසේ වෙතත්, ලේඛන හා වෙනත් තොරතුරු ඉංග්‍රීසි හැරුණු කල වෙනත් භාෂාවන්ට පරිවර්තනය කිරීම ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් වටහා ගැනීමට හා ඒවාට සහාය දීමට මෙන් ම ඒ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට එහි කොටස් හිමියන් හා අනෙක් පාර්ශ්වකරුවන් දිරි ගැන්වීම සඳහා බොහෝ විට අවශ්‍ය වෙයි. බාහිර පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම තුළින් ආ. සං. බැංකුව එහි මෙහෙයුම්වලට සම්බන්ධිත ලේඛන සම්බන්ධයෙන් පරිවර්තන සැකිල්ලක් වර්ධනය කළ යුත්තේ ය.

57. ආ. සං. බැංකුව එහි මෙහෙයුම් අවශ්‍යතා මත රඳා පවතින පරිවර්තන භාර ගනු ඇත. එබඳු පරිවර්තනවලට (i) එහි සමස්ත ව්‍යාපාරික කටයුතු, ප්‍රතිපත්ති හා මූලෝපායාත්මක චින්තනය අමතන්නා වූ ද පුළුල් ජාත්‍යන්තර ප්‍රේක්ෂක පිරිසක් සඳහා අරමුණු කරන ලද්දා වූ ද තොරතුරු; (ii) මහජනයාගේ විශේෂයෙන් ම, ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වූ පුද්ගලයන්ගෙන් අදහස් විමසීම සඳහා පවතින තොරතුරු (74 වැනි ඡේදය බලන්න); (iii) විශේෂිත රටවලට, ව්‍යාපෘතිවලට හා වැඩසටහන්වලට සම්බන්ධිත තොරතුරු; හා (iv) වෙබ් අඩවි සඳහා අභිප්‍රායික තොරතුරු ඇතුළත් විය හැකි ය.

58. පරිවර්තන භාර ගැනීමේ නිර්ණායකයන්ට අදාළ ප්‍රේක්ෂක පිරිසගේ සාක්ෂරතා මට්ටම ද ප්‍රේක්ෂක පිරිස් දන්නා භාෂා ද පරිවර්තනයට විකල්ප ද පරිවර්තනයට අවශ්‍ය කාලය හා වියදම ද ඇතුළත් වෙයි.

## 2. ආ. සං. බැංකුවේ මෙහෙයුම්වලට අදාළ තොරතුරු

59. සංවර්ධන ක්‍රියාකාරකම් සූදානම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ආ. සං. බැංකුව එහි ණය ගැනුම්කරුවන් හා පුද්ගලික අංශයේ ව්‍යාපෘති අනුග්‍රාහකයන් සමඟ සමීප ව ක්‍රියා කරයි. එසේ කිරීම මඟින් එය ණය ගැනුම්කරුවන්ට හා අනුග්‍රාහකයන්ට ආ. සං. බැංකුවේ සහාය ලද මෙහෙයුම් ගැන තොරතුරු අනාවරණය කිරීමට පක්ෂ ව එහි පූර්වානුමිතිය දැනුම් දෙනු ඇත. යෝග්‍ය පරිදි අදාළ ණය ගැනුම්කරුවන්ගේ හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයාගේ අදහස් විමසීමෙන් පසු ව හා තොරතුරු අනාවරණය කිරීම්වල ව්‍යාතිරේකයන් පිළිබඳ වගන්තියට (123-130 දක්වා ඡේද) යටත් ව නිශ්චිත ව දක්වන ලද කාල පරිච්ඡේදයකට අනුව පහත දැක්වෙන ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

### (අ) රාෂ්ට්‍රීය (country) හා කලාපීය (regional) වැඩසටහන සැකසීම

### (i) මූලෝපාය හා වැඩසටහන ඇගයීම

60. ආ. සං. බැංකුව රාෂ්ට්‍රීය මූලෝපාය හා වැඩසටහන සඳහා ද කලාපීය සහයෝගිතා මූලෝපාය හා වැඩසටහන සඳහා ද වන ලේඛන සකස් කිරීමට සූදානම් වීම් වස් ඇගයුම් අධ්‍යයනයන් පවත්වයි. එබඳු මූලෝපාය හා වැඩසටහන පිළිබඳ ඇගයීමකට දිළිඳුකම ගැන විශ්ලේෂණයන් ද ආර්ථික විශ්ලේෂණයන් ද තේමාගත විශ්ලේෂණයන් (ලිංග භේදය, රාජ්‍ය පාලනය, පරිසරය හා පුද්ගලික අංශය) හා ක්ෂේත්‍ර ඇගයීම් ද ඇතුළත් වේ. මේ ඇගයීම් ඒවා රාජ්‍ය නො වන පාර්ශ්වකරුවන්ගේ උපදෙස් මත වර්ධනය කරන ලද්දේ නම් දේශීය පාර්ශ්වකරුවන්ට කෙටුම්පත් ආකාරයෙන් ලබා ගැනීමට සැලැස්විය යුතු ව තිබේ. ආ. සං. බැංකුව මූලෝපාය හා වැඩසටහන් ඇගයීම් ඒවා සකස් කර නිම කිරීමෙන් පසු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

### (ii) මූලෝපායන් හා වැඩසටහන්

61. රාෂ්ට්‍රීය මූලෝපාය හා වැඩසටහන අදාළ රට සමඟ එකඟ වී ඇති පරිදි ආ. සං. බැංකුවේ මධ්‍යම කාලීන සංවර්ධන මූලෝපාය නිර්වාචනය (define) කර දක්වයි. ආ. සං. බැංකුවේ සහාය ලබා ගැනීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති සඳහා වන සංකල්ප ලේඛන රාෂ්ට්‍රීය මූලෝපාය (රා. මූ.) හා වැඩසටහන්වලට ඇතුළත් වෙයි. රාෂ්ට්‍රීය මූලෝපාය හා වැඩසටහන්වල යාවත්කාල කිරීමක් රා. මූ. වැඩසටහන්වල අඛණ්ඩ අදාළත්වය සැලකිල්ලට ගන්නා අතර එය ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කර දක්වයි. තව ද, එය ඊළඟ වසර 3 සඳහා මෙහෙයුම් වැඩසටහන ද ඉදිරිපත් කරයි.

62. එසේ ම, කලාපීය සහයෝගිතා මූලෝපාය හා වැඩසටහන උපකලාපීය මට්ටමෙන් යෝජිත ආ. සං. බැංකු ආධාර සඳහා සයුක්තිකරණය සපයයි. ක. ස. මූ. හා වැඩසටහන ආ. සං. බැංකුවේ ආධාර ජාතික අරමුණු හා මූලෝපාය ඌනපූරණය කරන ආකාරය නිශ්චය කොට දක්වන අතර යෝජිත කලාපීය ව්‍යාපෘති සම්බන්ධ සංකල්ප ලේඛන ඊට ඇතුළත් වේ. කලාපීය සහයෝගිතා මූලෝපාය හා වැඩසටහන් යාවත්කාල කිරීමක් වාර්ෂික ව සූදානම් කරනු ලැබේ.

63. ආ. සං. බැංකුව ඊළඟ වසරක කාලය තිස්සේ සූදානම් කිරීමට නියමිත නව මූලෝපායන් හා වැඩසටහන්වල ලැයිස්තුවක් තාවකාලික පදනමක් මත පවත්වා ගෙන යාමට හා ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තත්වයක් නිර්මාණය කර දීමට ක්‍රියා කළ යුත්තේ ය.

64. පාර්ශ්වකරුවන්ට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම පහසු කර වීමට[14] හා ඔවුන්ට තමන්ගේ රට හෝ කලාපය තුළ කෙටුම්පත් කෙරුණු මූලෝපාය හා වැඩසටහනට සම්ප්‍රදානයන් කිරීමට, ආ. සං. බැංකුව උපදෙස් ලබා ගැනීමට මත්තෙන් දේශීය පාර්ශ්වකරුවන්ගේ

අදහස් දැක්වීම සඳහා කෙටුම්පත් කළ මූලෝපායන් හා වැඩසටහන් සකස් කළ යුත්තේ ය. ඒවා (i) ප්‍රාරම්භක ලේඛනය සකස් කර අවසන් වීමෙන් ද (ii) මූලෝපාය හා වැඩසටහන කෙටුම්පත් කිරීමෙන් ද පසු ව - එහෙත් එහි පාලක මණ්ඩලයේ සමාලෝචන රැස්වීමට පෙර - ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

65. ආ. සං. බැංකුව මූලෝපායන් හා වැඩසටහන් ද මූලෝපායන් හා වැඩසටහන් සම්බන්ධයෙන් සෑම අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවක ම සභාපතිවරයාගේ ලුහුඬු ප්‍රකාශනය ද එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය ලද කල්හි ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. අදාළ රටෙහි ඉංග්‍රීසි භාෂාව පුළුල් ලෙස භාවිත නො කරනු ලබයි නම්, ආ. සං. බැංකුව ඕනෑ ම නව රාෂ්ට්‍රීය මූලෝපායක් හා වැඩසටහනක් (නැති නම් එහි යාවත්කාල කරන ලද ලියවිල්ලක්) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය ලැබීමෙන් දින 90ක් ඇතුළත පුළුල් ව තේරුම් ගනු ලබන භාෂාවකට පරිවර්තනය කළ යුත්තේ ය.

### (ආ) ප්‍රතිපත්ති, මූලෝපායන් හා මෙහෙයුම් පටිපාටීන්

66. ආ. සං. බැංකුව එහි ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්ෂේත්‍ර හා තේමාගත මූලෝපායන් සංවර්ධනය කිරීමේ හා සමාලෝචනය කිරීමේ කාල පරිච්ඡේදය තුළ එහි කොටස් හිමියන්ගේ හා වෙනත් උනන්දුවත් පුද්ගලයන්ගේ සක්‍රිය සහභාගිත්වය බලාපොරොත්තු වෙයි. ආ. සං. බැංකුව ඊළඟ මාස 12 තිස්සේ සංවර්ධනය හෝ සමාලෝචනය කිරීමට නියමිත ආරක්ෂණ ප්‍රතිපත්ති හෝ තේමාගත මූලෝපායන්ගේ ලැයිස්තුවක් සකස් කළ යුත්තේ ය. මේ ලැයිස්තුව ප්‍රසිද්ධියේ තාවකාලික පදනමක් මත ලබා ගත හැකි වනු ඇත. එබඳු සංවර්ධනය කිරීමක් හෝ සමාලෝචනය කිරීමක් සඳහා වන සංකල්ප ලේඛනයක් පාලක මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු ඊට කරුණු එකතු කරනු ලැබේ. ආ. සං. බැංකුව බාහිර ප්‍රේක්ෂක පිරිස් සමඟ වන කවර හෝ පූර්වාපේක්ෂිත මුහුණට මුහුණ ලා සිදු කෙරෙන හමු වීම් ඇතුළු අදහස් විමසීමේ සැලසුම් සකස් කළ යුතු අතර එබඳු සැලසුම් සම්පූර්ණ කරන ලද කල්හි ඒවා ප්‍රසිද්ධියේ ලබා ගත හැකි විය යුත්තේ ය. ආ. සං. බැංකුව උපදේශනය සඳහා ප්‍රසිද්ධියේ ලබා ගත හැකි අඩු තරමින් එක් ප්‍රතිපත්ති කෙටුම්පතක් හෝ මූලෝපාය පිළිබඳ එක් ලේඛනයක් සැකසිය යුත්තේ ය. අනෙක් ප්‍රතිපත්ති හා මූලෝපායන් සම්බන්ධයෙන් - උදාහරණයක් වශයෙන්, මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය, දිළිඳුකම පහත හෙළීමේ මූලෝපාය හා වගඋත්තර සැපයීම පිළිබඳ යන්ත්‍රණය - ආ. සං. බැංකු පාලක මණ්ඩලයට ඒවා ද මේ ඡේදයේ අවශ්‍යතාවන්ට යටත් වන බව තීරණය කළ හැකි ය.

67. ආ. සං. බැං. එහි අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලක මණ්ඩලය විසින් අවසාන අනුමතිය දීමෙන් පසු අප්‍රමාද ව එහි සියලු ම ප්‍රතිපත්ති හෝ මූලෝපාය පිළිබඳ ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද සෑම ප්‍රතිපත්තියක් ම හා මූලෝපායක් ම සඳහා ආ. සං. බැංකුව ප්‍රතිපත්තිය හෝ මූලෝපාය පිළිබඳ ලේඛනය අනාවරණය කරනු ලැබීමත් සමඟ ඒ අවස්ථාවේ දී ම සභාපතිවරයාගේ ලුහුඬු ප්‍රකාශය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

68. ආ. සං. බැංකුව රාෂ්ට්‍රීය හා කලාපීය වැඩසටහන් සැකසීම හා ව්‍යාපෘති පිරිසැකසුම් සඳහා ඉදිරිපත් කරන එහි ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. මේවාට මෙහෙයුම් අත් පොත - *Operations Manual* (බැංකු ප්‍රතිපත්ති හා මෙහෙයුම් කාර්ය පටිපාටීන්) හා *ප්‍රතිසංවිහිත ආ. සං. බැංකුව සඳහා ව්‍යාපාරික ක්‍රියාදාමයෝ - Business Processes for the Reorganized ADB* - යන ලේඛන ඇතුළත් වේ. ආ. සං. බැංකුව ව්‍යාපෘති පරිපාලන උපදෙස් හා කාර්ය මණ්ඩල මෙහෙයුම් ප්‍රතිපත්ති හා ආ. සං. බැංකුව පිළිබඳ අත් පොත් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ද කටයුතු සැලැස්විය යුත්තේ ය.

### (ඈ) ව්‍යාපෘති හා වැඩසටහන්

#### (i) ව්‍යාපෘති හෝ වැඩසටහන් තොරතුරු ලේඛනය

69. ආ. සං. බැංකුව ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. මෙය වූ කලී ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් පිළිබඳ ලුහුඬු කරුණුමය ප්‍රකාශනයකි. රාජ්‍ය හා පුද්ගලික අංශවල ව්‍යාපෘති සඳහා ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනයට (i) ව්‍යාපෘතියේ නම; (ii) ක්ෂේත්‍රමය, තේමාගත හා ඉලක්කගත වර්ගීකරණය; (iii) ව්‍යාපෘති/වැඩසටහන් අංකය; (iv) ආධාර ලබා දෙන මාදිලිය නැත හොත් විධිය; (v) පිහිටීම හා භූගෝල විද්‍යාත්මක ආවරණය; (vi) විස්තරය; (vii) අරමුණු හා විෂය පථය - අපේක්ෂිත සංවර්ධන බලපෑම ඇතුළත් ව; (viii) පිරිවැය හා මූල්‍ය සම්පාදන සැලැස්ම (රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සඳහා පමණි); (ix) ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන නැත හොත් අනුග්‍රාහකයා/අනුග්‍රාහකයෝ; (x) වෙන් කරන ලද පාරිසරික හා සමාජීය ආරක්ෂණය සුපිරික්සීමේ ප්‍රවර්ග; (xi) පාරිසරික හා සමාජීය ගැටලු පිළිබඳ සාරාංශය; (xii) රාෂ්ට්‍රීය සන්දර්භය; (xiii) සිදු කර ඇති හෝ සැලසුම් කර ඇති උපදේශනයන්; (xiv) වගකිව යුතු ආ. සං. බැංකු දෙපාර්තමේන්තුව, කොට්ඨාසය හා නිලධාරියා; (xv) ව්‍යාපෘති විකල්ප ලේඛනය නැත හොත් පුද්ගලික අංශයේ ව්‍යාපෘති නිෂ්කාසන ලේඛනය; (xvi) ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය පිළියෙළ කළ දිනය හා ඉතා ම මෑත දී සිදු කළ යාවත්කාල කිරීම; (xvii) සූදානම් කරන ලද හෝ සූදානම් කිරීමට නියම කර ඇති ශක්‍යතා හා තාක්ෂණික ලේඛනවල ලැයිස්තුව; සහ (xviii) තක්සේරු බලය පැවරීම හා අධ්‍යක්ෂ මණ්ඩල සලකා බැලීම් සඳහා ආගණනය කරන ලද දින ඇතුළු ව ආධාර, සැලසුම්, පිරිසැකසුම් හා ක්‍රියාත්මක කිරීම සඳහා කාල සටහනක් ඇතුළත් වේ. ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය වූ කලී ක්‍රියාත්මක වෙමින් තිබෙන කටයුත්තක් හෙයින් (viii), (x), (xi), (xiii) හා (xvii) යන අංක යටතේ අඩංගු තොරතුරු ඊට ඇතුළත් නො විය හැකි ය. ඒ වන විට ප්‍රාරම්භක ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට හැකි තත්වයක් නිර්මාණය වී තිබෙනු ඇත. ලබා ගත හැකි ව තිබෙන තොරතුරු බඳු තොරතුරු මේවාට ඇතුළත් වනු ඇත.

#### 11. රාජ්‍ය අංශයේ ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය

70. ආ. සං. බැංකුව ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සම්බන්ධයෙන් පෙරසූදානම් කටයුතු ආරම්භ කළ වහා ම පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සඳහා ඉදිරිපත් කෙරෙන මූලික ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. මේ කටයුත්ත ව්‍යාපෘතිය හෝ වැඩසටහන සඳහා ඉදිරිපත් කෙරෙන විකල්ප ලේඛනය අනුමත කරනු ලැබීමෙන් පසු දින 30ක් ඉක්මවා යාමට පෙර ඉටු කළ යුත්තේ ය. රාජ්‍ය අංශයේ ණය ව්‍යාපෘතියක් සූදානම් කෙරෙන කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇගයුම සඳහා පදනම සපයන්නා වූ ව්‍යාපෘති සැලැස්ම හා අධීක්ෂණ රාමුව වර්ධනය කරනු ලැබේ. ආ. සං. බැංකුව ව්‍යාපෘතිය නැත හොත් වැඩසටහන තක්සේරු කිරීමට මත්තෙන් ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය තුළ සැලසුම් හා අධීක්ෂණ රාමුව ඇතුළත් කළ යුත්තේ ය.

71. ආ. සං. බැංකුව ව්‍යාපෘතියේ ස්වභාවය පිළිබිඹු කිරීම සඳහා ව්‍යාපෘතිය නැත හොත් වැඩසටහන සූදානම් කිරීමේ කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය යාවත්කාල කළ යුත්තේ ය. ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන කාල පරිච්ඡේදය තුළ දී ආ. සං. බැංකුව එහි ව්‍යාපෘති කාර්ය සාධන කළමනාකරණ පද්ධති තුළින් රාජ්‍ය අංශයට දී ඇති ණය හා තාක්ෂණික ආධාර ව්‍යාපෘති වසරේ සෑම කාර්තුවක දී ම අධීක්ෂණය කරයි. ආ. සං. බැංකුව ක්‍රියාකාරකම් හා ගැටලු ද සංවර්ධන අරමුණු හා ගිවිසුම්වල ස්වභාවය ද ණය උපයෝගීකරණය ද පිළිබිඹු

කිරීමට ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ක්‍රියාත්මක කරනු ලබන කාල පරිච්ඡේදය තුළ වසරේ සෑම කාර්තුවක් පාසා ම එය යාවත්කාල කළ යුතු වන්නේ ය.

72. ආ. සං. බැංකුව රාජ්‍ය අංශයේ ව්‍යාපෘතියක හෝ වැඩසටහනක එහි සහභාගිත්වය නතර කරන්නේ නම්, ඊට අනුරූපී ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය තුළ සහභාගිත්වය නතර කිරීමට හේතුව දැක්වෙන ප්‍රකාශයක් ඇතුළත් කළ යුත්තේ ය. ආ. සං. බැංකුව සහභාගිත්වය නතර කිරීමෙන් පසු මාස 6ක් ගත වන තුරු නතර කරන ලද ව්‍යාපෘති සඳහා වන ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

### (iii) පුද්ගලික අංශයේ ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය

73. කිසි යම් ව්‍යාපෘතියක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන්ට ඉඩ ඇතැයි ආ. සං. බැංකුව තීරණය කිරීමෙන් පසු පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් සඳහා ඉදිරිපත් කෙරෙන ප්‍රාරම්භක ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය. එහෙත් එය කළ යුත්තේ ව්‍යාපෘතිය සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන දිනයට කැලැන්ඩර දින 30කට මත්තෙනි. පාරිසරික ප්‍රතිපත්තිය විසින් පාරිසරික බලපෑම් පිළිබඳ සංක්ෂේපණීය තක්සේරුවක් හෝ සංක්ෂේපණීය මූලික පාරිසරික විභාග කිරීමක් ඉල්ලා සිටිනු ලබන පාරිසරික ව සංවේදී ව්‍යාපෘති ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තත්වයක් නිර්මාණය කළ යුතු වන්නේ ය. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමට අඩු තරමින් කැලැන්ඩර දින 120කට මත්තෙන් කළ යුතු ව තිබේ.[15] ආ. සං. බැංකුව පුද්ගලික අංශයේ ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමට අඩු තරමින් කැලැන්ඩර දින 120කට මත්තෙන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට හැකි තත්වයක් නිර්මාණය කළ යුත්තේ ය. ව්‍යාපෘති සූදානම් කිරීම, පිළිසැකසීම හා ක්‍රියාත්මක කිරීම ආරම්භ වීමත් සමඟ ආ. සං. බැංකුව ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ත්‍රෛමාසික ව යාවත්කාල කළ යුතු වන්නේ ය. ව්‍යාපෘතියට සම්බන්ධ ක්‍රියාකාරකම් ද සංවර්ධන අරමුණුවල කාර්ය තත්වය හා කවර හෝ උව්‍යමය වෙනස්වීමක් වේ නම් ඒවා ද මෙකී යාවත්කාල කිරීම තුළ පිළිබිඹු විය යුතු ව තිබේ. ආ. සං. බැංකුව පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් තුළ එහි සහභාගිත්වය නතර කරන්නේ නම් ඊට අනුරූපී ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ආ. සං. බැංකුවේ සහභාගිත්වය නතර කළ බව දැක්වෙන ප්‍රකාශයක් ඊට ඇතුළත් කළ යුත්තේ ය. ආ. සං. බැංකුව නතර කරන ලද ව්‍යාපෘති සඳහා වන, ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් තොරතුරු ලේඛනය ව්‍යාපෘතියට සහභාගිත්වය නතර කිරීමෙන් පසු මාස 6ක් තිස්සේ ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

### iv. ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වන ජනතාව වෙනුවෙන් තොරතුරු සැපයීම

74. ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වන ජනතාව හා අනෙකුත් පුද්ගලයන් හා සංවිධාන සමඟ සංවාදයකට පහසුකම් සැලසීම සඳහා දැනට සූදානම් වෙමින් පවතින රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් නැත හොත් වැඩසටහනක් ගැන (සමාජීය හා පාරිසරික ගැටලු ඇතුළු ව) තොරතුරු බලපෑමට පාත්‍ර වූ ජනතාවට ලබා ගත හැකි තත්වයක් නිර්මාණය කළ යුතු ව තිබේ. තොරතුරු සපයනු ලබන බවත් යෝජිත ව්‍යාපෘති සැලැස්ම සම්බන්ධයෙන් ප්‍රතිපෝෂණය ලබා ගැනීමට උත්සාහ දරනු ලබන බවත් කේන්ද්‍රීය අරමුණ වී ඇත්තේ බලපෑමට පාත්‍ර වූ ජනතාව සමඟ නිරන්තර සබඳතා පවත්වා ගැනීම බවත් සහතික කිරීමට ආ. සං. බැංකුව ණය ගැනුම්කරුවන්ට හෝ ව්‍යාපෘති අනුග්‍රාහකයන් සමඟ සමීප ව කටයුතු කළ යුත්තේ ය. ව්‍යාපෘති සැලසුම් තුළ බලපෑමට පාත්‍ර වන ජනතාවගේ අදහස් උදහස් ප්‍රමාණවත් අන්දමින් සැලකිල්ලට ගත හැකි වීම පිණිසත් එය ව්‍යාපෘතිය නැත හොත් වැඩසටහන සූදානම් කිරීම, පිළිසැකසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම යන සෑම අවධියක දී ම අඛණ්ඩ ව කර ගෙන යාම පිණිසත් මේ කටයුත්ත ව්‍යාපෘතිය සූදානම් කිරීමේ මුල් අවධියේ දී ම ආරම්භ කළ

යුතු ය. ව්‍යාපෘතියේ හෝ වැඩසටහනේ සැලැස්ම එය ක්‍රියාත්මක කෙරෙන කාල පරිච්ඡේදය තුළ පාර්ශ්වකරුවන්ට ප්‍රතිපෝෂණය කිරීමට ඉඩ ලබා දෙන බවට ආ. සං. බැංකුව සහතික විය යුතු ය. ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ ව සිදු කෙරෙන කවර හෝ ප්‍රධාන වෙනසක් ගැන ඊට අදාළ තොරතුරු බලපෑමට පාත්‍ර වන ජනතාව සමඟ බෙදා හදා ගනු ලබන බව ආ. සං. බැංකුව විසින් සහතික කළ යුත්තේ ය.

75. 74 වැනි ඡේදයේ ඉල්ලා ඇති අවශ්‍යතාවන්ට සහාය දීම සඳහා සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල ආණ්ඩු හා ආ. සං. බැංකුව ඒකාබද්ධ ව සමහර (විශේෂයෙන්, ඉහළ මට්ටමේ මහජන උනන්දුවක් ජනනය කිරීමට ඉඩ තිබෙන) ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සන්නිවේදන සැලසුම් වර්ධනය කළ හැකි ය. උදාහරණයක් වශයෙන්, එබඳු සැලසුම්වලට බලපෑමට පාත්‍ර වූ ජනතාව සමඟ සංවාදයක නිරත විය යුතු ආකාරය ද ආර්ථික හා නෛතික ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු කරා ප්‍රවේශ වීමට මහජනයාට ඇති අවස්ථා පුළුල් කරන ආකාරය ද ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළ බලපෑමට පාත්‍ර වූ ජනතාව පිළිබඳ කටයුතුවල නිරත ව සිටින ආණ්ඩු හා ව්‍යාපෘති අනුග්‍රාහකයන්ට උපකාර කරන ආකාරය ද සංවර්ධන ක්‍රියාදාමය තුළ බිම් මට්ටමේ හා සිවිල් සමාජයේ සහභාගිත්වය වර්ධනය කරන ආකාරය ද නිර්දේශ කළ හැකි ය.[16]

76. පෞද්ගලික අංශයේ හිමිකාරයන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන එකිනෙකට වෙනස් හැකියාවන්ගෙන් යුත් අසමාන කණ්ඩායමකි. ආ. සං. බැංකුව ඔවුන් සමඟ කටයුතු කිරීමේ දී සාමාන්‍යයෙන් නම්‍යශීලී වෙයි. පුද්ගලික අංශයේ ආයෝජන සඳහා ආ. සං. බැංකුවේ පාරිසරික හා සමාජ ආරක්ෂණ අවශ්‍යතාවන්ගේ මූලිකාංග පොදුවේ සලකන කල රාජ්‍ය අංශයට ද එක හා සමාන වෙයි. ආ. සං. බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්තිවලට ඒවායේ ව්‍යාපෘතිවල සමාජීය හා පාරිසරික බලපෑම් තක්සේරු කිරීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට හා අනාවරණය කිරීමට පුද්ගලික අංශයේ අනුග්‍රාහකයන් අවශ්‍ය වෙයි. පුද්ගලික අංශයේ අනුග්‍රාහකයන් බලපෑමට පාත්‍ර වූ ජනතාව සමඟ වේලාසනින් කාර්ය නියුක්ත වීම හා අවබෝධ කළ හැකි හා ළඟා විය හැකි ආකාරයේ ප්‍රජාගණයන් වෙත නිසි කලට අදාළ ව්‍යාපෘති තොරතුරු පතුරුවා හැරීම ඒවාට අයත් වෙයි. මේ අරමුණ කරා ළඟා වීමේ දී ව්‍යාපෘති අනුග්‍රාහකයෝ ව්‍යාපෘතිය තක්සේරු කිරීමට මත්තෙන් එහි බලපෑමට පාත්‍ර වන ජනතාව සමඟ එය කාර්ය නියුක්ත වන්ට අදහස් කරන්නේ කෙසේ දැයි යන්න ආ. සං. බැංකුවට දැනුම් දිය යුත්තාහ.

### v. පාරිසරික ඇගයීම්

77. පාරිසරික ප්‍රතිපත්තිය යටතේ ඉල්ලුම් කෙරෙන අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් ආ. සං. බැංකුව පාරිසරික ව සංවේදී යැයි හඟින A ප්‍රවර්ගයට අයත් ව්‍යාපෘතියක් සඳහා සංක්ෂේපණීය පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීමක් හෝ B ප්‍රවර්ගයට අයත් ව්‍යාපෘතියක් සඳහා සංක්ෂේපණීය ප්‍රාරම්භක පාරිසරික විමර්ශනයක් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. මෙය (i) ආ. සං. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ණය සලකා බැලීමට ද (ii) පාරිසරික වශයෙන් සංවේදී යැයි හඟිනු ලබන A ප්‍රවර්ගයට අයත් උප ව්‍යාපෘතියක් හෝ B ප්‍රවර්ගයට අයත් උප ව්‍යාපෘතියක් අනුමත කිරීමට ද එසේත් නැත් නම් (iii) අදාළ අවස්ථාවන්හි ව්‍යාපෘතියේ විෂය පථයක් සම්බන්ධයෙන් සිදු කෙරෙන ප්‍රධාන වෙනස්කමක් අනුමත කිරීමට ද අඩු තරමින් කැලැන්ඩර දින 120කට මත්තෙන් කළ යුතු වෙයි.[17] උනන්දුවත් පාර්ශ්වයන්ගේ ඉල්ලීම පරිදි පූර්ණ පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීමක් හා ප්‍රාරම්භක පාරිසරික විමර්ශනයක් ඔවුන්ට ලබා ගත හැකි තත්වයක් ආ. සං. බැංකුව ඇති කළ යුත්තේ ය.

78. ණය ගැනුම්කරු හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයා ව්‍යාපෘතියේ පාරිසරික ගැටලු පිළිබඳ අදාළ තොරතුරු බලපෑමට පාත්‍ර වූ ජනතාවට ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තෝය. මෙය පාරිසරික ප්‍රතිපත්තිය යටතේ ඉල්ලුම්කර ඇති පරිදි ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වන කණ්ඩායම් හා දේශීය රාජ්‍ය නො වන සංවිධාන

සමඟ අදහස් විමසීමට කලින් හෝ ඒ අතරතුර සිදු කළ යුතු වෙයි.[18] A ප්‍රවර්ගයට අයත් ව්‍යාපෘති සඳහා ණය ගැනුම්කරු හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයා එබඳු තොරතුරු අවස්ථා දෙකක දී බලපෑමට පාත්‍ර වූ ජනතාවට ලබා ගත හැකි බව සහතික කළ යුත්තේ යː (i) පාරිසරික බලපෑම් ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍ර කටයුතුවල මුල් අවධිය තුළ; හා (ii) ඇගයීමට මත්තෙන් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තා කෙටුම්පත ලබා ගත හැකි වූ කල්හි.

79. මූල්‍යමය අතරමැදියකු තුළ සමාන ආයෝජන හෝ උප ව්‍යාපෘති සඳහා ණය පටිපාටියක් සහභාගී කර ගනු ලබන සහ පරිසර ප්‍රතිපත්තිය යටතේ පාරිසරික කළමනාකරණයක් අවශ්‍ය කෙරෙන රාජ්‍ය අංශයේ ව්‍යාපෘති නැත හොත් වැඩසටහන් සම්බන්ධයෙන් සලකන කල එබඳු ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සඳහා ඉදිරිපත් කරනු ලබන සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශයට පාරිසරික කළමනාකරණ පද්ධතිය පිළිබඳ විස්තරයක් ඇතුළත් විය යුත්තේ ය.

**(vi) යළි පදිංචි කර වීමේ සැලසුම් ලේඛනය**

80. අනිච්ඡානුග (සිය කැමැත්තෙන් බාහිර ව) යළි පදිංචි කරවීම සම්බන්ධ Operation Manualහි, එෆ්2/බීපී වගන්තිය යටතේ ණය ගැනුම්කරු හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයා ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වන ජනයාට පහත දැක්වෙන ලේඛන ලබා ගැනීමට අවස්ථාව සැලසිය යුත්තේ ය.[19]

(i) ඇගයීමට මත්තෙන් - යළි පදිංචි කර වීමේ සැලැස්මෙහි කෙටුම් පතක්;

(ii) යළි පදිංචි කර වීමේ අවසාන සැලැස්ම සම්පූර්ණ කිරීමෙන් පසු - එබඳු යළි පදිංචි කර වීමේ සැලැස්මක්; සහ

(iii) වැඩසටහනෙහි හෝ ව්‍යාපෘතියෙහි විෂය පථය තුළ ඇති කරනු ලබන සවිස්තරාත්මක තාක්ෂණික සැලසුම් හෝ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස යළි පදිංචි කර වීමේ සැලැස්මට ඇතුළත් කිරීමෙන් පසු[20] - සංශෝධිත යළි පදිංචි කර වීමේ සැලැස්ම.

81. 80 වැනි ඡේදය තුළ විශේෂ කොට දක්වා ඇති ලේඛනවල තොරතුරු දේශීය භාෂාවලින් ලියැවුණු පොත් පිංචවල්, පත්‍රිකා හෝ කුඩා පොත් වශයෙන් ලබා ගැනීමට කටයුතු සැලැස්විය හැකි ය. කියවීමට හා ලිවීමට අසමත් ජනතාව වෙනුවෙන් වෙනත් සන්නිවේදන ක්‍රමවේද යෝග්‍ය වනු ඇත.

82. ආ. සං. බැංකුව පහත දැක්වෙන ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ යː

(i) ඇගයීමට මත්තෙන් - යළි පදිංචි කර වීමේ සැලැස්ම හෝ රාමුව (හෝ දෙක ම) අන්තර්ගත කෙටුම්පතක්;

(ii) යළි පදිංචි කර වීමේ අවසාන සැලැස්ම ලැබුණු කල්හි - අවසාන යළි පදිංචි කර වීමේ සැලැස්ම; හා

(iii) සංශෝධිත යළි පදිංචි කර වීමේ සැලැස්ම ලැබුණු කල්හි - සංශෝධිත යළි පදිංචි කර වීමේ සැලැස්ම

**(vii) ස්වදේශික ජනයා පිළිබඳ සැලසුම් ලේඛනය**

83. ණය ගැනුම්කරු හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයා ස්වදේශික ජනයා/වාර්ගික සුළුතරය වන ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වන ජනතාවට පහත දැක්වෙන ලේඛන ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය:

   (i) ඇගයීමට මත්තෙන් - ස්වදේශික ජනතාව සංවර්ධනය කිරීමේ සැලැස්මෙහි කෙටුම් පතක්;

   (ii) ස්වදේශික ජනතාව සංවර්ධනය කිරීමේ අවසාන සැලැස්ම සම්පූර්ණයෙන් සකස් කිරීමෙන් පසු - එබඳු ස්වදේශික ජනතාව සංවර්ධනය කිරීමේ සැලැස්ම; හා

   (iii) වැඩසටහනට හෝ ව්‍යාපෘතියට අදාළ විෂය පථය තුළ සිදු කෙරෙන සවිස්තරාත්මක තාක්ෂණික සැලැස්මක හෝ වෙනස් කිරීමක ප්‍රතිඵලයක් ලෙස ස්වදේශික ජනයා පිළිබඳ සැලැස්මට සංශෝධන ගෙන ඒමෙන් පසු ව[21] - සංශෝධිත ස්වදේශික ජනතාවගේ සංවර්ධනය පිළිබඳ සැලැස්ම.

84. 83 වැනි ඡේදය තුළ විශේෂ කොට දක්වන ලද තොරතුරු දේශීය භාෂාවන්ගෙන් පොත් පිංචි, පත්‍රිකා හා කුඩා පොත් වශයෙන් ලබා ගැනීමට සැලැස්විය හැකි ව තිබේ. කියවීමෙහි හා ලිවීමෙහි අසමත් ජනතාව සඳහා වෙනත් සන්නිවේදන ක්‍රමවේද යොදා ගැනීම යෝග්‍ය වනු ඇත.

85. ආ. සං. බැංකුව පහත දැක්වෙන ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය:

   (i) ඇගයීමට මත්තෙන් - ස්වදේශික ජනයාගේ සංවර්ධනය පිළිබඳ සැලැස්මට හෝ රාමුවට (හෝ දෙක ම) අදාළ කෙටුම්පතක්;

   (ii) ස්වදේශික ජනතාවන් පිළිබඳ අවසාන සංවර්ධන සැලැස්ම ලැබීමෙන් පසු - ස්වදේශික ජනතාවන් පිළිබඳ අවසාන සංවර්ධන සැලැස්ම; හා

   (iii) සංශෝධිත ස්වදේශික ජනතාවන් පිළිබඳ සංවර්ධන සැලැස්මක් ලැබීමෙන් පසු - සංශෝධිත ස්වදේශික ජනතාවන් පිළිබඳ සංවර්ධන සැලැස්ම

**(viii) ව්‍යාපාරික අවස්ථා ලැයිස්තුගත කිරීම**

86. ආ. සං. බැංකුව මුදල් සැපයීම සඳහා සූදානම් ව සිටින සෑම පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ම වන ව්‍යාපාරික අවස්ථා දැක්වෙන ලැයිස්තුවක් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුවට කටයුතු සැලැස්විය යුත්තේ ය. ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන හා ගිවිසුම් ප්‍රදානයන් මඟින් නිකුත් කරනු ලබන කළමනා සම්පාදන දැන්වීම් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැං. කටයුතු සැලැස්විය යුත්තේ ය.

**(ix) මූලික දිළිඳුකම හා සමාජීය ඇගයීම**

87. සියලු ආයෝජන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මූලික දිළිඳුකම හා සමාජීය ඇගයීමක් කරනු ලබන අතර එය කිසි යම් ව්‍යාපෘතියකින් ප්‍රතිලාභ ලැබිය හැකි හෝ හානිකර බලපෑම්වලට පාත්‍ර විය හැකි ජනතාව පෙන්නුම් කරයි. ආ. සං. බැංකුව මෙකී ඇගයීම සම්පූර්ණ කරන ලද කල්හි එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (x) තාක්ෂණික ආධාර වාර්තාව

88. තාක්ෂණික ආධාර වාර්තාවක් යනු තාක්ෂණික ආධාර ලැබිය යුතු ව්‍යාපෘතියක් සඳහා මුදල් සැපයීම සම්බන්ධයෙන් කෙරෙන නිර්දේශයකි. අදාළ බලධාරීන් (අධ්‍යක්ෂ මණ්ඩල සභාපති හෝ උප සභාපති) විසින් අනුමත කරනු ලැබූ කල්හි ප්‍රමාදයකින් තොර ව සියලු ම තාක්ෂණික ආධාර වාර්තා ප්‍රසිද්ධියේ ලබා ගැනීම සඳහා ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය.

### (xi) තාක්ෂණික ආධාර යටතේ සම්පාදිත ලේඛන

89. තාක්ෂණික ආධාර ව්‍යාපෘතියක් සඳහා ශක්‍යතා අධ්‍යයන, සවිස්තරාත්මක ව්‍යාපෘති සැලසුම්, ක්ෂේත්‍ර සමාලෝචන, හා උපදේශකයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෙනත් වාර්තා බඳු සුවිශේෂී වාර්තා සම්පාදනය කරනු ලැබීම අවශ්‍ය ය. තාක්ෂණික ආධාර කෙරෙන් සම්පාදනය කරනු ලබන අවසාන වාර්තා සම්පූර්ණ කෙරුණු කල්හි ආ. සං. බැංකුව එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. රටවල් වැඩි වැඩියෙන් උපදේශක තාක්ෂණික ආධාර තුළින් සංවේදී කාරණා සම්බන්ධයෙන් ආ. සං. බැංකුවේ උපදෙස් බලාපොරොත්තු වන්නේ ය යන සත්‍යය පිළිගනිමින් ආ. සං. බැංකුව උපදේශක තාක්ෂණික ආධාර යටතේ සම්පාදනය කරනු ලබන අවසන් වාර්තා අනාවරණය කිරීමට විරුද්ධත්වය පළ කිරීමට ආණ්ඩුවලට අවස්ථාව ලබා දිය යුත්තේ ය.[22] තාක්ෂණික සහාය යටතේ සූදානම් කරන ලද රට සුවිශේෂී කර ගැනුණු වාර්තා කෙටුම්පත් හෝ ඒවායින් කොටස් දේශීය පාර්ශ්වකරුවන්ට ලබා ගත හැකි තත්වයක් නිර්මාණය කිරීමට ආ. සං. බැංකුවට පියවර ගත හැකි ය. එසේ කළ හැකි වනු ඇත්තේ එකී පාර්ශ්වකරුවන්ට උපදේශන සාකච්ඡා හෝ සංවර්ධන සහභාගිකත්වයන් සඳහා පහසුකම් සලස්වා දීම හෝ ව්‍යාපෘති සැලැස්ම පිළිබඳ ව ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම අවශ්‍ය යැයි ආ. සං. බැංකුව තීරණය කරන්නේ නම් පමණි.

### (xii) සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය

90. සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය යනු අනුමතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ආ. සං. බැංකුවේ සහාය ලද ව්‍යාපෘති සම්බන්ධ තීරණ අඩංගු ලේඛනයකි. ආ. සං. බැංකුව රාජ්‍ය අංශයේ සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කල්හි එය අප්‍රමාද ව ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව පුද්ගලික අංශයේ සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය අඩංගු ලේඛනවල සංක්ෂේපිත පිටපත අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලද කල්හි ඒවා අප්‍රමාද ව ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය; මේ පිටපත රහස්‍ය තොරතුරු හා ව්‍යාපෘතිය හෝ ගනුදෙනු පිළිබඳ අවදානම ගැන ආ. සං. බැංකුවේ ඇගයීම බැහැර කරනු ඇත.

### (xiii) ව්‍යාපෘති පරිපාලන සන්දේශය

91. සෑම රාජ්‍ය අංශයේ ණය ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සඳහා ම ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති පරිපාලන සන්දේශය ණය ගැනුම්කරුවාට ද විධායක නියෝජිත ආයතනයට ද ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයට හා ආ. සං. බැංකුවට ද ව්‍යාපෘතිය පරිපාලනය කිරීමට ඉඩ ලබා දෙන තොරතුරු අන්තර්ගත කර ගනියි. ව්‍යාපෘති පරිපාලන සන්දේශය අනුමත කරනු ලැබූ කල්හි ආ. සං. බැංකුව එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (xiv) සමාජීය හා පාරිසරික අධීක්ෂණ වාර්තා

92. ණය ගිවිසුමක් සඳහා ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් ක්‍රියාත්මක වන කාලය තුළ සූදානම් කරනු ලබන සමහර සමාජීය හා පාරිසරික වාර්තා අවශ්‍ය විය හැකි ය.

පාරිසරික හා සමාජීය අධීක්ෂණ වාර්තා ආ. සං. බැංකුවට ඉදිරිපත් කරන ලද කල්හි ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය. පාරිසරික හා සමාජීය අධීක්ෂණ වාර්තා ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වූ ජනයාට ලබා ගැනීමට සැලැස්වීම සඳහා ආ. සං. බැංකුවට පුද්ගලික අංශයේ අනුග්‍රාහකයකු අවශ්‍ය වනු ඇත. බලපෑමට පාත්‍ර වූ ජනතාවට දේශීය වශයෙන් අනාවරණය කරනු ලැබ තිබෙන පාරිසරික හා සමාජීය අධීක්ෂණ වාර්තා ආ. සං. බැංකුවට ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය.

**(xv) ව්‍යාපෘති හා වැඩසටහන්වල විෂය පථය වෙනස් කිරීම**

93. ආ. සං. බැංකුව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන එහි ව්‍යාපෘති හෝ වැඩසටහන්වල විෂය පථයෙහි සිදු කෙරෙන ප්‍රධාන වෙනස්කම්වලට සම්බන්ධිත ලේඛන එවැනි වෙනස් කිරීම් අනුමතිය සඳහා ඉදිරිපත් කළ කල්හි ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

**(xvi) කොටස් මුදා හැරීම සම්බන්ධ ප්‍රගති වාර්තා**

94. බහුවිධ ව්‍යාපාර වස්තු කොටස් සහිත රාජ්‍ය අංශයේ වැඩසටහන් මඟින් සිදු කෙරෙන ණය සැපයීමේ මෙහෙයුමක කොටස් මුදා හැරීම සම්බන්ධ ප්‍රගති වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක මණ්ඩලයේ අනුමතිය සඳහා ඉදිරිපත් කළ කල්හි ආ. සං. බැංකුව ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

**(xvii) ව්‍යාපෘති, තාක්ෂණික ආධාර හා වැඩසටහන් සමාප්තිය පිළිබඳ වාර්තා**

95. ව්‍යාපෘති, තාක්ෂණික සහාය හා වැඩසටහන් සමාප්තිය පිළිබඳ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ බෙදා හරිනු ලැබීමෙන් පසු ආ. සං. බැංකුව ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. පුද්ගලික අංශයේ ව්‍යාපෘතියක් සම්බන්ධ සමාප්ති වාර්තාව එහි සංවර්ධන අරමුණු අත් පත් කර ගැනීම ගැන වාර්තා කළ යුත්තේ ය.

**(ඈ) මූලෝපායන්, වැඩසටහන් හා ව්‍යාපෘතිවලට අදාළ වෙනත් තොරතුරු**

**(i) මෙහෙයුම් ඇගයීම**

96. ආ. සං. බැංකුව වර්ෂය සඳහා සැලසුම් කළ එහි මෙහෙයුම් ඇගයීම් පිළිබඳ ලැයිස්තුවක් කලින් වසරේ දෙසැම්බර් මාසය තුළ ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එහි ඇගයීම් සඳහා තේරීම් නිර්ණායකයන් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

97. ආ. සං. බැංකුව පහත දැක්වෙන වාර්තා නිතිපතා සම්පාදනය කරයි: ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණන වාර්තා, තාක්ෂණික ආධාර ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණන වාර්තා, බලපෑම් ඇගයීමේ අධ්‍යයනයන්, රාෂ්ට්‍රීය ආධාර වැඩසටහන් පිළිබඳ ඇගයීම්, ක්ෂේත්‍ර ආධාර වැඩසටහන් ඇගයීම් සහ විශේෂ ඇගයීම් අධ්‍යයනයන්. ආ. සං. බැංකුව එබඳු ඇගයීම් වාර්තා පාලක මණ්ඩලයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට බෙදා දෙන අවස්ථාවේ දී ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. වාර්තාව සංවර්ධන කාර්ය සාධන කමිටුව මඟින් සාකච්ඡා කරනු ලබන්නේ නම් ආ. සං. බැංකුව සං. කා. කමිටු සභාපතිවරයාගේ ලුහුඬු ප්‍රකාශය සාකච්ඡාවෙන් සති දෙකක් ඇතුළත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. තව ද, ආ. සං. බැංකුව පාලක මණ්ඩලය හෝ මෙහෙයුම් ඇගයීමේ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිචාර කිසිවක් වේ නම් ඒවා සම්පූර්ණ වූ කල්හි ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

98. ආ. සං. බැංකුව වාර්ෂික ඇගයීම් වාර්තා ද සම්පාදනය කරයි. ඇගයීම් ක්‍රියාකාරකම්වල වාර්ෂික සමාලෝචනය ක්‍රියාකාරිත්වයන් ඇගයීමේ කටයුතු හා මෙහෙයුම් ඇගයීම් දෙපාර්තමේන්තුවේ සොයා ගැනීම් සංක්ෂේපණය කරයි. ණය සහ තාක්ෂණික ආයෝජන ක්‍රියාකාරිත්වය සම්බන්ධ වාර්ෂික වාර්තාවක් දෙන ලද වර්ෂයක් සඳහා ආ. සං. බැංකුවේ ආයෝජන ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක් කරයි. ආ. සං. බැංකුව එබඳු වාර්ෂික ඇගයීම් වාර්තා සංවර්ධන කාර්ය සාධන කමිටුව විසින් සාකච්ඡා කරනු ලැබූ විට ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (ii) සම මූල්‍ය සම්පාදන තොරතුරු

99. ආ. සං. බැංකුව වාණිජමය සම මූල්‍ය සම්පාදනය අවශ්‍ය කෙරෙන රාජ්‍ය අංශයේ ව්‍යාපෘති පිළිබඳ ත්‍රෛමාසික සාරාංශයක් වසරේ සෑම කාර්තුවක ම ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව නිල සම මූල්‍ය සම්පාදනය පිළිබඳ තොරතුරු - දෙන ලද තාක්ෂණික ආධාර හෝ ආයෝජන ව්‍යාපෘතියක් සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන කොන්දේසි හා අවශ්‍යතා බඳු - සෑම අදාළ තාක්ෂණික ආධාර වාර්තාවක් හෝ සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය තුළ ම ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව එබඳු නිල සම මූල්‍ය සම්පාදනයන් සඳහා වන නෛතික හා මූල්‍යමය ගිවිසුම් ආයෝජකයා විරුද්ධ නො වන්නේ නම් ඉල්ලුම් කළ විටෙක ලබා දීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව හා ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික සම ආයෝජකයා අතර ඇති කර ගනු ලබන මාර්ගයක මූල්‍ය ගිවිසුම් ඒවා අත්සන් තැබීමෙන් පසු එබඳු ආයෝජකයකු විරුද්ධ නො වන්නේ නම් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය. වාණිජමය සම ආයෝජන ගිවිසුම් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ඉඩ නො ලැබෙනු ඇත.

### (iii) දූෂණ විරෝධී තොරතුරු

100. ආ. සං. බැංකුව එහි මෙහෙයුම් සම්බන්ධයෙන් නැඟෙන වංචා හා දූෂණ පිළිබඳ චෝදනා කලින් කලට විමර්ශනය කරයි. ආ. සං. බැංකුව වංචා හා දූෂණ සම්බන්ධයෙන් එහි විමර්ශනවල ප්‍රතිඵලවලට සම්බන්ධිත සංඛ්‍යාමය තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ඊට අතිරේක ව, විගණන කටයුතුවලින් ලැබෙන වැදගත් නිර්දේශ හා ගැටලු ආ. සං. බැංකුවේ *වාර්ෂික වාර්තාවට* සංයුක්ත කළ යුත්තේ ය. ආ. සං. බැංකුවට එහි දූෂණ විරෝධී ප්‍රතිපත්තියට[23] අනුකූල වෙමින් විමර්ශනවල මාතෘකාවන්ගේ හා තහනම් කරන ලද පාර්ශ්වයන්ගේ නම්වල අනන්‍යතාවන් ඇතුළු ව විමර්ශනයන්ගේ ප්‍රතිඵල ආ. සං. බැංකුවේ සාමාජික රටවල්වල ආණ්ඩු සමඟ බෙදා හදා ගත හැකි ය.

### (iv) රාජ්‍ය අංශයේ ව්‍යාපෘති හා වැඩසටහන්වලට අදාළ නෛතික ගිවිසුම්

101. ඊට අමතර ව, 1995 ජනවාරි 1 වැනි දාට කලින් ආ. සං. බැංකුව එළඹුණු රාජ්‍ය අංශයේ ණය ගිවිසුම්, ව්‍යාපෘති ගිවිසුම් හා සංශෝධන සඳහා ආ. සං. බැංකුව එවැනි ලේඛන ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට මත්තෙන් අදාළ ආණ්ඩුවේ අනුමතිය පැතිය යුත්තේ ය. අදාළ ආණ්ඩුව එවන් අනුමතියක් සඳහා ආ. සං. බැංකුවේ ඉල්ලීම මත කැලැන්ඩර දින 30ක් ඇතුළත එබඳු ලේඛන අනාවරණය කිරීම සම්බන්ධයෙන් එහි විරුද්ධත්වය ආ. සං. බැංකුවට දැනුම් නො දුන හොත් ආ. සං. බැංකුව ගිවිසුම සඳහා ඉල්ලුම් කිරීමෙන් දින 60ක් ඇතුළත එවන් ගිවිසුම් ඕනෑ ම ඉල්ලුම්කරුවකුට ලබා ගැනීමට කටයුතු සලස්වනු ඇත.

102. ආ. සං. බැංකුව, 1995 ජනවාරි 1 වැනි දා සහ ප්‍රතිපත්තිය බල පවත්වන දිනය අතර එළඹුණු රාජ්‍ය අංශයේ ණය ගිවිසුම් හා ව්‍යාපෘති ගිවිසුම් හා එවැනි ගිවිසුම්වලට ගෙන එන ලද කවර හෝ සංශෝධන වේ නම් ඒවා ද ඉල්ලූ විටෙක ලබා ගත හැකි තත්වයක් සලස්වනු ඇත. එය එසේ කරනුයේ එබඳු ගිවිසුම්, හා සංශෝධන තුළ අඩංගු කවර හෝ රහස්‍ය තොරතුරක් වේ නම් ඒවා ද ඉවත්

කිරීමෙන් පසු ව ය. එකී තොරතුරු එබඳු තොරතුරු ලෙස විශේෂ කොට දක්වනු ලබන්නේ එවැනි ගිවිසුම් හා සංශෝධනන පිළිබඳ ව සාකච්ඡා පැවැත්වෙන මොහොතේ බලයේ සිටින අදාළ ආණ්ඩු විසිනි.

103. ආ. සං. බැංකුව, ප්‍රතිපත්තිය බල පවත්වන දිනයට පසු ව එළඹුණු රාජ්‍ය අංශයේ ණය ගිවිසුම්, ආ. සං. අරමුදලේ ප්‍රතිපාදන ගිවිසුම් හා ඒවාට අදාළ සහගාමී සභාපතිවරයාගේ වාර්තාව හා නිර්දේශය සමඟ ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. රහස්‍ය තොරතුරු ඉවත් කිරීමෙන් පසු එවැනි ගිවිසුම් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්විය යුත්තේ ය. කවර හෝ සංශෝධනයක් වේ නම් ආ. සං. බැංකුව එබඳු සංශෝධන ඒවා කාර්ය සාධකත්වයට පත් වීමෙන් සති 2ක් ඇතුළත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

**(v) පුද්ගලික අංශයේ ව්‍යාපෘති සම්බන්ධ නෛතික ගිවිසුම්**

104. ආ. සං. බැංකුව විසින් එළඹෙන ලද පුද්ගලික අංශයේ නෛතික ගිවිසුම් හෝ එබඳු ගිවිසුම්වලට ගෙන එන ලද සංශෝධන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ආ. සං. බැංකුව කටයුතු සැලැස්වීම නො කළ යුත්තේ ය.

**3. වෙනත් තොරතුරු**

**(අ) ආසියානු සංවර්ධන අරමුදලේ සම්පත්වලින් ප්‍රදානය කෙරෙන ආයෝජන ඵලදායිත්වය පදනම් කර ගැනුණු ප්‍රතිපාදන**

105. ආ. සං. අරමුදලේ සම්පත් ලබා ගැනීමට සුදුසුකම නිර්ණය කරන්නේ ආ. සං. බැංකුවේ ක්‍රමවත් කිරීමේ ප්‍රතිපත්තිය යි.[24] සුදුසුකම් ඇති රටවල් සම්බන්ධයෙන් ආයෝජන ඵලදායිත්වය පදනම් කර ගැනුණු ප්‍රතිපාදන ප්‍රදානය කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රතිපාදන සඳහා මඟ පෙන්වීමට අවශ්‍ය මූලධර්ම හා නිර්ණායකයන් නිර්වාචනය කරයි.[25] ආ. සං. අරමුදලේ සම්පත් කරා ප්‍රවේශ වීමට හැකියාව ඇති සෑම රටක් සම්බන්ධයෙන් ම, ආ. සං. බැංකුව සංඛ්‍යාත්මක ඵලදායිත්ව අගයන් රාෂ්ට්‍රීය ඵලදායිත්ව ඇගයීම් පිළිබඳ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. රාෂ්ට්‍රීය ප්‍රතිපත්තිය හා ආයතනමය ඇගයීම් සඳහා වන මෙහෙයුම් නියමයන් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

**(ආ) ආර්ථික දත්ත හා පර්යේෂණ**

106. ආ. සං. බැංකුව එහි වාර්ෂික වාර්තාව *(Annual Report)* මෙන් ම ආර්ථික හා සමාජීය දත්තයන්, විශ්ලේෂණ හා අනාවැකි අඩංගු *ආසියානු සංවර්ධන දැක්ම (Asian Development Outlook)* ද *ආසියානු සංවර්ධන දැක්මෙහි යාවත්කාල කිරීම් (Asian Development Outlook Update)* හා *ප්‍රධාන දර්ශකයෝ (Key Indicators)* ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

107. ආ. සං. බැංකුව පර්යේෂණ, වාර්තා හා විශ්ලේෂණ අඩංගු අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි පොත්වල පෑටුල නාමාවලියක් ද සම්මේලන පත්‍රිකා ද වාර සංග්‍රහයන් ද වාර්තා ද අධ්‍යයනයන් හා තාක්ෂණික උපදෙස් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

**(ඇ) පරිපාලනමය හා වෙනත් තොරතුරු**

108. ආ. සං. බැංකුව පහත දැක්වෙන ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ යඃ

(i) ආ. සං. බැංකුව ස්ථාපනය කිරීමේ ගිවිසුම;

(ii) ආ. සං. බැංකුවේ අතුරු නීති;

(iii) ආ. සං. බැංකුවේ විධායක මණ්ඩලයේ නීති හා කාර්ය පටිපාටිය;

(iv) ආ. සං. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නීති හා කාර්ය පටිපාටිය; හා

(v) ආ. සං. බැංකුවේ මූලස්ථානය සම්බන්ධයෙන් ආ. සං. බැංකුව හා පිලිපීන ජනරජ ආණ්ඩුව අතර ඇති කර ගෙන තිබෙන ගිවිසුම.

109. ආ. සං. බැංකුව පහත දැක්වෙන තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ යඃ

(i) ආ. සං. බැංකුවේ සාමාජික රටවල්, ඒවායේ දායක ප්‍රාග්ධනය හා ඡන්ද බලය;

(ii) විධායක මණ්ඩල සාමාජිකයන්;

(iii) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා ඔවුන්ගේ ඡන්ද හිමි කණ්ඩායම්;

(iv) අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හා ඒවායේ සාමාජිකයන්;

(v) ආ. සං. බැංකු පාලක මඬුල්ලේ සාමාජිකයන් හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය;

(vi) ආ. සං. බැංකුවේ සංවිධාන ව්‍යුහය; හා

(vii) ඉහත දැක්වෙන එක් එක් කරුණ ගැන සබඳතා ඇති කර ගැනීම සඳහා තොරතුරු

110. ආ. සං. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ කල්හි රටවල් පිළිබඳ වර්ගීකරණය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

111. ආ. සං. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කරනු ලැබීමත් සමඟ සෑම මුදල් වර්ෂයක් සඳහා ම වැඩසටහන හා අයවැය රාමුව ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

112. ආ. සං. බැංකුව විධායක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ හා විධායක නිලධාරින්ගේ දේශන ඇතුළත් එහි වාර්ෂික රැස්වීම්වල ලුහුඬු වාර්තා එබඳු සෑම වාර්ෂික රැස්වීමක් ම පැවැත්වීමෙන් කැලැන්ඩර දින 60ක් ඇතුළත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව විධායක මණ්ඩලය විසින් තැපැල් ඡන්දය තුළින් ගනු ලැබූ තීරණ ඉල්ලූ විටෙක ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

113. ආ. සං. බැංකුව (i) එළඹෙන සති 3 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවන්ගේ යාවත්කාල කරන ලද කාර්ය පටිපාටීන් හා මාතෘකා තාවකාලික පදනමක් මත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය; (ii) සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක ම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කල්හි ඒවා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් කැලැන්ඩර දින 60ක් ඇතුළත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

114. ආ. සං. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව විසින් සකස් කරන ලදුව පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන වාර්තා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය

යුත්තේ ය. එසේ කළ යුත්තේ එසේ කරන ලෙස කමිටුව නිර්දේශ කරන්නේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන්නේ නම් පමණි.

**(ඇ) මූල්‍යමය තොරතුරු**

115. ආ. සං. බැංකුව සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් සම්බන්ධයෙන් ද ආසියානු සංවර්ධන අරමුදල, තාක්ෂණික ආධාර සඳහා වන විශේෂ අරමුදල, ජපන් විශේෂ අරමුදල හා ස්ථාපනය කෙරී ඇති පරිදි වෙනත් අරමුදල් සම්බන්ධයෙන් ද ඉදිරිපත් කරනු ලබන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන විධායක මණ්ඩලයේ වාර්ෂික රැස්වීමට කලින් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

116. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කල්හි පහත දැක්වෙන දෑ ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ යː

(i) සෑම අරමුදලක් ම සම්බන්ධ මූල්‍යමය දත්ත ඇතුළත් ව ආ. සං. බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් හා විශේෂ අරමුදල් පිළිබඳ පාලක මණ්ඩලයේ සාකච්ඡාවන් හා විශ්ලේෂණයන්;

(ii) සංක්ෂේපිත ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ;

(iii) සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල ණය සැපයුම් සේවා සම්බන්ධ වාර්ෂික වාර්තාව; හා

(iv) සෑම මුදල් (ෆිස්කල්) වර්ෂයක් සඳහා ම ආ. සං. බැංකුවේ අයවැය ලේඛනය.

117. ආ. සං. බැංකුව මහජන කොටස් නිකුතුව සම්බන්ධ කවර හෝ ලේඛන වේ නම් ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. මූල්‍ය වෙළඳපොළ පාලනය කෙරෙන නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් සලකන කල්හි ඒවා රජයේ නියෝජිත ආයතනවලින් පිරවීම අවශ්‍ය වෙයි.

**(ඉ) රැකියා තොරතුරු**

118. ආ. සං. බැංකුව (i) ආ. සං. බැංකුවේ වැටුප් ව්‍යුහය, පාලක මණ්ඩලයේ හා කාර්ය මණ්ඩලයේ වැටුප් මට්ටම් හා ප්‍රතිලාභ නිර්ණය කිරීමට භාවිත කරනු ලබන ක්‍රමවේදය හා (ii) කාර්ය මණ්ඩල සේවයට බඳවා ගැනීම, තනතුරුවල පිහිටුවීම, වෙනත් ස්ථානයක සේවයෙහි යෙදවීම හා නැවත සේවයෙහි රඳවා ගැනීම යන කරුණුවල දී ආ. සං. බැංකුවට පවතින පුළුල් අරමුණු හා මූලෝපාය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුව කාර්ය මණ්ඩලවලට බඳවා ගනු ලබන්නන්ගේ තනතුරු පිළිබඳ විස්තර ද තනතුරක් පිරවීමට අඩු තරමින් දෙසතියකට මත්තෙන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැංකුවේ පරිපාලන විනිශ්චය මණ්ඩලයේ සෑම තීරණයක් ම එබඳු තීරණයක් නිකුත් කළ කල්හි එය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

**(ඊ) ආ. සං. බැංකුවේ වග උත්තර සැපයීමේ යන්ත්‍රණය[26] යටතේ සම්පාදනය කෙරුණු තොරතුරු**

**(i) උපදේශන අදියර**

119. විශේෂ ව්‍යාපෘති පහසුකම් සලසන්නා (වි. ව්‍යා. ප. ස) (The Special Project Facilitator) පහත දැක්වෙන තොරතුරු හා ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

(i) පැමිණිලි ලිපිය - පැමිණිල්ල පිළිබඳ ව වි. ව්‍යා. ප. සලසන්නාගේ නිශ්චය මත හා පැමිණිලිකරුගේ ගිවිසුමට යටත් ව;

(ii) පැමිණිල්ලේ යෝග්‍යතාව පිළිබඳ ව වි. ව්‍යා. ප. සලසන්නාගේ නිශ්චය - යෝග්‍යතාව පිළිබඳ ව වි. ව්‍යා. ප. සලසන්නාගේ නිශ්චය මත;

(iii) පැමිණිල්ල පිළිබඳ සාමාන්‍ය විස්තරයක් - පැමිණිලිකරු පැමිණිලි ලිපිය අනාවරණය කිරීමට කැමැත්ත ප්‍රකාශ කර නො තිබේ නම්, පැමිණිල්ලේ යෝග්‍යතාව පිළිබඳ ව වි. ව්‍යා. ප. සලසන්නාගේ නිශ්චය මත;

(iv) වග උත්තර සැපයීමේ යන්ත්‍රණයේ උපදේශන අදියරෙහි 4 වැනි පියවර යටතේ වි. ව්‍යා. ප. සලසන්නා විසින් සූදානම් කරන ලද සමාලෝචනය හා ඇගයීම් වාර්තාව (2003) - උපදේශන අදියරේ 7 වැනි අදියර ආරම්භයේ දී හා පැමිණිලිකරුගේ ද රජයේ හා/හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයාගේ ද කැමැත්තට යටත් ව;

(v) පැමිණිල්ල තුළ මතු කෙරුණු ගැටලු විසඳීමට උපදේශන ක්‍රියාදාමයෙහි සහභාගි වූ වි. ව්‍යා. ප. සලසන්නා සහ පාර්ශ්වයන් විසින් එකඟ වනු ලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳ සාමාන්‍ය විස්තරයක් - උපදේශන අදියරෙහි 7 වැනි පියවර ආරම්භයේ දී හා පැමිණිලිකරුගේ ද රජයේ හා/හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයාගේ ද කැමැත්තට යටත් ව;

(vi) ඉහත (iv) අංකය යටතේ සඳහන් කෙරුණු ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තත්ව වාර්තා - උපදේශන ක්‍රියාදාමයෙහි සහභාගි වූ පාර්ශ්වයන් විසින් එකඟ වන ලද එබඳු කවර හෝ වාර්තාවක් අනාවරණය කිරීම සඳහා පවතින කවර හෝ කාල සටහනකට අනුකූල ව;

(vii) වි. ව්‍යා. ප. සලසන්නාගේ අවසාන වාර්තාව - පාර්ශ්වකරුවන් අතර බෙදා හැරීමෙන් කැලැන්ඩර දින 7ක් ඇතුළත හා පැමිණිලිකරුගේ ද රජයේ හා/හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයාගේ ද කැමැත්තට යටත් ව;

(viii) අධීක්ෂණ වාර්තා - අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදා හරින ලද කල්හි හා පැමිණිලිකරුගේ ද රජයේ හා/හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයාගේ ද කැමැත්තට යටත් ව;

(ix) වි. ව්‍යා. ප. සලසන්නාගේ වාර්ෂික වාර්තාව - අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදා හරින ලද කල්හි.

**(ii) අනුකූලතා සමාලෝචනය කිරීමේ අදියර**

120. අනුකූලතා සමාලෝචනය කිරීමේ මණ්ඩලය (අ. ස. ම.) අවශ්‍ය මූලික තොරතුරු සමඟ අනුකූලතා සමාලෝචනයක් සඳහා කෙරෙන ඉල්ලීමක් භාර ගැනීමෙන් කැලැන්ඩර දින 7ක් ඇතුළත පුවත්පත් උපදේශනයක් නිකුත් කළ යුත්තේ ය.[27] ඉල්ලීම යෝග්‍ය යැයි අ. ස. ම. තීරණය කරන්නේ නම්, අ. ස. ම. යෝග්‍යතාව පිළිබඳ සිය වාර්තාව හා අනුකූලතා සමාලෝචනයට අනුමතිය දීම සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ අ. ස. ම. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ලබා ගැනීමෙන් කැලැන්ඩර දින 7ක් ඇතුළත ය. ඉල්ලීම යෝග්‍ය නො වේ යැයි අ. ස. ම. විසින් තීරණය කරනු ලබන්නේ නම් අ. ස. ම. අයෝග්‍යතාව පිළිබඳ එහි වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට බෙදා දුන් කල්හි ප්‍රසිද්ධියේ ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය. අ. ස. ම. සමාලෝචනයේ සැඳහීම් පිළිබඳ අනුදේශ (terms of reference) ප්‍රසිද්ධියේ ලබා

ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ අ. ස. ම. සමාලෝචනය පිළිබඳ ව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් කැලැන්ඩර දින 14ක් ඇතුළත ය. අ. ස. ම. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය හා අ. ස. මණ්ඩලයේ අවසාන වාර්තාව වාර්තාවේ කෙටුම්පතට පාලක මණ්ඩලයෙන් හා ඉල්ලුම්කරුගෙන් ලැබෙන කවර හෝ ප්‍රතිචාර ඇත් නම් ඒවා ද අමුණා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයෙන් කැලැන්ඩර දින 7ක් ඇතුළත ය. අ. ස. ම. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කවර හෝ ප්‍රතිකර්මදායී පියවර ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අධීක්ෂණ වාර්තා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ ඒ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට හා පාර්ශ්වකරුවන්ට බෙදා දුන් කල්හි ය. අ. ස. මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සෑම කැලැන්ඩර වර්ෂයක් අවසානයේ ම මාස 4ක් ඇතුළත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (උ) ආසියානු සංවර්ධන අරමුදලේ ගිවිසුම්වලට සම්බන්ධිත තොරතුරු

121. සාමාන්‍යයෙන් ආ. සං. බැංකුව ආ. සං. අරමුදලේ ප්‍රතිපූරණ සඳහා වන ගිවිසුම්වලට හා වාර මැද සමාලෝචනවලට සම්බන්ධිත තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආ. සං. බැං. ආධාර දෙන රටවල්වල රැස්වීම් සඳහා ඉදිරිපත් කරනු ලබන මූල්‍ය නො වන සාකච්ඡා පත්‍රිකා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ එබඳු සාකච්ඡා පත්‍රිකා ආධාර දෙන රටවල් වෙත බෙදා දුන් කල්හි ය. ආ. සං. බැං. සෑම රැස්වීමක් ම අවසානයේ සභාපතිවරයාගේ සංක්ෂේප සටහන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ආධාර දෙන රටවල වාර්තාව විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද කල්හි ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන වෙනත් ලේඛන

122. ආ. සං. බැං. ප්‍රතිපත්තිය තුළ දක්වා නැති තොරතුරු සැපයීම සඳහා හෝ අනුමතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බෙදා දෙනු ලබන ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ පාලක මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයට වෙනත් ලෙසකට ක්‍රියා කරන ලෙස දැනුම් නො දෙන්නේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ නො වන්නේ නම් ය.

## 4. පූර්වානුමිත (Presumed) අනාවරණය කිරීම්වලට ව්‍යතිරේක

123. තොරතුරු අනාවරණය කිරීමට පක්ෂ ආ. සං. බැංකුවේ පූර්වානුමිතියට ව්‍යතිරේක 126, 127 හා 130 යන ඡේද තුළ විස්තර කොට දක්වයි. තොරතුරු ව්‍යතිරේකයක් යටතට වැටීම හේතු කොට ගෙන ලේඛනයකින් තොරතුරු ඉවත් කරනු ලබන්නේ නම් එසේ නැත හොත්, ප්‍රතිපත්තිය තුළ උපුටා දක්වා ඇති ලේඛනයක් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු නො ලබන්නේ නම් ආ. සං. බැං. ඉවත් කරන ලද තොරතුරු හා/හෝ ලේඛනය ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එසේ කළ යුත්තේ ඉවත් කරන ලද තොරතුරු හෝ ලේඛනය උපුටා දැක්වීම ම ව්‍යතිරේකයක් උල්ලංඝනය කිරීමක් නො වන්නේ නම් ය.

124. ඉල්ලුම් කරනු ලබන ලේඛනයක කොටසක් අනාවරණය නො කරනු ලැබීමට යටත් ව හා ව්‍යතිරේක ලැයිස්තුවට අනුකූල වේ නම් පමණක් අනාවරණය නො කරනු ලැබීමට යටත් නො වන ලේඛනය තුළ අඩංගු කවර හෝ තොරතුරක් එය අවශේෂ තොරතුරුවලින් සෑහෙන තරම් වෙන් විය හැකි ව තිබෙන තාක් දුරට ඉල්ලුම් කරන්නාට සන්නිවේදනය කළ යුත්තේ ය.

125. ආ. සං. බැං. කිසි යම් පුද්ගලයකුට කලින් අවස්ථාවක කරන ලද ඉල්ලීමකින් පසු ව එබඳු තොරතුරක් සපයා තිබේ නම් එසේ නැත හොත්, තොරතුරු සැපයිය නො හැකි වීමට හේතු දක්වා තිබේ නම් එකී පුද්ගලයාගෙන්, සංවිධානයෙන් හෝ

කණ්ඩායමෙන් එක ම විෂය සම්බන්ධයෙන් නැවත නැවතත් කෙරෙන හෝ අයුක්ති සහගත ඉල්ලීම්වලට එය අවනත වීම හෝ ප්‍රතිචාර දැක්වීම නො කළ යුත්තේ ය.

(අ) ප්‍රචලිත තොරතුරු

126. ප්‍රතිපත්තියෙහි දැක්වෙන වෙනත් කවර හෝ ප්‍රතිපාදනයන් නො සලකා පහත දැක්වෙන තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුතු නො වන්නේ ය.

1. අනාවරණය කළ හොත්, ඍජු ව අදහස් හා පණිවුඩ හුවමාරු කිරීම බාධා කිරීම මඟින් ආ. සං. බැංකුවේ විචාරණ හා තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ ඒකාබද්ධතාව අනතුරට පත් කරන හෝ පත් කිරීමට ඉඩ තිබෙන අභ්‍යන්තර තොරතුරු - මීට අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ වෛකල්පිකයන්ට, අධ්‍යක්ෂවරයාගේ උපදේශකයන්ට පාලක මණ්ඩලයේ සාමාජිකයන්ට, ආ. සං. බැංකුවේ කාර්ය මණ්ඩලයට හා එහි උපදේශකයන්ට යවනු ලබන හා ඔවුන්ගෙන් ලැබෙන අභ්‍යන්තර ලේඛන, සන්දේශ හා වෙනත් ඒ සමාන ම සන්නිවේදන ඇතුළත් වේ.

2. විශේෂයෙන්, සංවර්ධනය වෙමින් පවත්නා සාමාජික රටවල් සමඟ ප්‍රතිපත්ති සංවාද සම්බන්ධයෙන් වන අනාවරණය කළ හොත්, ඍජු ව අදහස් හා පණිවුඩ හුවමාරු කිරීම බාධා කිරීම මඟින් ආ. සං. බැං. හා එය සහයෝගයෙන් ක්‍රියා කරන එහි සාමාජිකයන් හා වෙනත් ස්වාධීන ඒකක අතර සිදු වන විචාරණ හා තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ ඒකාබද්ධතාව අනතුරට පත් කරන හෝ පත් කිරීමට ඉඩ තිබෙන තොරතුරු - මීට ආ. සං. බැං. හා එහි සාමාජිකයන් හා ආ. සං. බැං. සහයෝගී ව ක්‍රියා කරන වෙනත් ස්වාධීන ඒකක අතර සිදු වන විචාරණ හා තීරණ ගැනීමේ ක්‍රියාදාමය සඳහා හුවමාරු කළ, සූදානම් කළ හෝ එසේත් නැත්නම් ඒ ක්‍රියාදාමයෙන් ව්‍යුත්පන්න කර ගත් (derived) තොරතුරු.

3. අනාවරණය කළ හොත්, එකී පාර්ශ්වය සමඟ ආ. සං. බැංකුවට පවතින සබඳතා ද්‍රව්‍යමය වශයෙන් පූර්ව නිශ්චය කරන හෝ කරන්ට ඉඩ තිබෙන රජයකින් හෝ අන්තර්ජාතික සංවිධානයකින් විශ්වාසය තබා ලබා ගන්නා තොරතුරු.

4. අධ්‍යක්ෂවරුන්ගේ ද ඔවුන්ගේ වෛකල්පිකයන්ගේ ද අධ්‍යක්ෂවරුන්ගේ උපදේශකවරුන්ගේ ද පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ ද ආ. සං. බැංකු කාර්ය මණ්ඩලයේ හා උපදේශකයන්ගේ රැකියා කොන්දේසි, ක්‍රියාකාරිත්ව ඇගයීම් හා පුද්ගලික වෛද්‍ය තොරතුරු ඇතුළු පුද්ගල වාර්තා මෙන් ම කාර්ය මණ්ඩල නීති හා අධ්‍යක්ෂ මණ්ඩල නීති හා රෙගුලාසි මඟින් අවසර දෙනු ලබන තාක් දුරට අභ්‍යන්තර අභියාචනා යන්ත්‍රණයන්ගේ කාර්ය පටිපාටිය.

5. ආ. සං. බැංකුවේ අනාගත ණය ගැනීම් පිළිබඳ තක්සේරු වාර්තා, මූල්‍ය අනාවැකි, ආ. සං. බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම් සම්බන්ධ පුද්ගල ආයෝජනවලට අදාළ දත්ත හා ණය තක්සේරු වාර්තා.

6. රාෂ්ට්‍රීය ණය සැපයුම්වල යෝග්‍යතාව හා ණය වාර්ගීකරණ පිළිබඳ විශ්ලේෂණය.

7. 113 වැනි ඡේදයේ සඳහන් කළ පරිදි රැස්වීම් වාර්තා හා 65 වැනි හා 67 වැනි ඡේදවල සඳහන් කළ පරිදි සංක්ෂේපණ හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය පටිපාටීන්.[28]

8. අනාවරණය කළ හොත්, එබඳු පාර්ශ්වයක වාණිජ අයිතිවාසීන්ට, මූල්‍ය අයිතිවාසීන්ට හා/හෝ තරඟකාරී තත්වයට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පමුණුවන්ට ඉඩ තිබෙන කිසි යම් පාර්ශ්වයක් විසින් ආ. සං. බැංකුවට සපයනු ලබන තොරතුරු.

9. රහස්‍ය ව්‍යාපාරික තොරතුරු.

10. කළමනා සම්පාදන ක්‍රියාදාමයන්ට සම්බන්ධිත තොරතුරු - අනාගත ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන පූර්ව සුදුසුකම් පිළිබඳ තොරතුරු ද ටෙන්ඩර් ද යෝජනා හෝ මිල ගණන් කැඳවුම් ද මීට ඇතුළත් වේ.

11. අනාවරණය කළ හොත්, කවර හෝ පුද්ගලයකුගේ ජීවිතය, සෞඛ්‍යය හෝ එසේත් නැති නම් ආරක්ෂාව අනතුරේ හෙළන/හෙළන්ට ඉඩ තිබෙන තොරතුරු.

12. අනාවරණය කළ හොත්, අධිකරණමය පරිපාලන කටයුතුවලට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පැමිණ වීමට ඉඩ තිබෙන තොරතුරු.

13. නීතිඥ - සේවාදායක වරප්‍රසාදවලට යටත් එසේ නැත හොත් අනාවරණය කිරීම විමර්ශනයකට හානි පමුණුවන්ට ඉඩ තිබෙන තොරතුරු.

14. දූෂණ චෝදනාවක් පිළිබඳ මූලාශ්‍රය.

15. දූෂණ විරෝධී ප්‍රතිපත්තිය යටතේ අයෝග්‍ය (Black-listed = අපලේඛනගත) වූවන් ලෙස ප්‍රකාශිත හෝ විමර්ශනයන්ට භාජනය වී සිටින පුද්ගලයන්ගේ නම්.

16. විගණකාධිපතිවරයාගේ කාර්යාලය හා ආ. සං. බැංකුවේ බාහිර විගණන නිලධාරියා විසින් සූදානම් කරනු ලබන විගණන වාර්තා.

17. අනාවරණය කළ හොත්, සාමාජිකයකුගේ ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පමුණුවන්ට ඉඩ තිබෙන තොරතුරු.

18. අනාවරණය කළ හොත්, සාමාජික රටක ආණ්ඩුවකට එහි ආර්ථිකය කළමනාකරණය කිරීමට ඇති හැකියාවට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පමුණුවන්ට ඉඩ තිබෙන මූල්‍යමය තොරතුරු.

19. අනාවරණය කළ හොත්, ප්‍රතිරූපණ අයිතිය (Copyright) පිළිබඳ නීතිය ඇතුළු අදාළ නීතිය උල්ලංඝනය කරන/කිරීමේ විභවයක් පවතින තොරතුරු.

**(ආ) ඓතිහාසික තොරතුරු**

127. ආ. සං. බැං. පහත දැක්වෙන ව්‍යාතිරේකයන්ට යටත් ව නිකුත් කිරීමෙන් වසර 20කට පසු කරනු ලබන ඉල්ලීමක් මත ඓතිහාසික තොරතුරු ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

1. අනාවරණය කළ හොත් විමර්ශනයකට හානි පැමිණ වීමට ඉඩ ඇති නීතිඥ - සේවාදායක වරප්‍රසාදයට යටත් තොරතුරු.

2. රහස්‍ය භාවය පවත්වා ගනු ලබන්නේ ය යන පැහැදිලි අවබෝධයෙන් යුතු ව විශ්වාසී ව ආ. සං. බැංකුවට සපයනු ලබන තොරතුරු හා අනාවරණය කළ හොත්, තොරතුරු සැපයූ පාර්ශ්වය සමඟ ආ. සං. බැංකුව පවත්වන සබඳතාවන්ට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පමුණුවන්ට ඉඩ තිබෙන එසේ නැත හොත්, නීතිය උල්ලංඝනය කරන හෝ නෛතික ගිවිසුමක් කඩ කරන තොරතුරු.

3. දූෂණ චෝදනාවක මූලාශ්‍රය.

4. අයෝග්‍ය (අපලේඛනගත) වූවන් හැටියට ප්‍රකාශිත පුද්ගලයන්ගේ හෝ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය යටතේ විමර්ශනයට භාජනය වී සිටින පුද්ගලයන්ගේ නම්.

5. අනාවරණය කළ හොත්, සාමාජික රටක ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පමුණුවන්ට ඉඩ තිබෙන තොරතුරු.

6. අනාවරණය කළ හොත් ප්‍රතිරූපණ අයිතිය පිළිබඳ නීතිය ඇතුළු අදාළ නීතිය උල්ලංඝනය කිරීමේ විභවය අන්තර්ගත කර ගත් තොරතුරු.

7. කාර්ය මණ්ඩල නීති හා විධායක මණ්ඩල තීරණ මඟින් අවසර දෙනු ලබන තාක් දුරට අභ්‍යන්තර අභියාචනා යන්ත්‍රණවල කාර්ය පටිපාටීන් මෙන් ම අධ්‍යක්ෂවරුන්ගේ ද ඔවුන්ගේ වෛකල්පිකයන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ උපදේශකයන්ගේ ද පාලක මණ්ඩල සාමාජිකයන්ගේ හා ආ. සං. බැං. කාර්ය මණ්ඩලවල හා උපදේශකයන්ගේ ද රැකියා කොන්දේසි, ක්‍රියාකාරිත්ව ඇගයීම් හා පුද්ගලික වෛද්‍ය තොරතුරු ඇතුළත් වාර්තා.

8. වෙළඳ රහස්.

9. අනාවරණය කළ හොත්, සාමාජික රටක ආණ්ඩුවකට එහි ආර්ථිකය කළමනාකරණය කිරීමට ඇති හැකියාවට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පැමිණ වීමට ඉඩ තිබෙන මූල්‍යමය තොරතුරු.

10. අනාවරණය කළ හොත්, අධිකරණ පරිපාලන කටයුතුවලට ද්‍රව්‍යමය වශයෙන් හානි පමුණුවන/පැමිණ වීමට ඉඩ තිබෙන තොරතුරු.

128. නිකුත් කරනු ලබන අවස්ථාවේ ප්‍රසිද්ධියේ ලබා ගත නො හැකි වූ එහෙත් ප්‍රතිපත්තිය යටතේ අවස්ථාව උදා කරනු ලබන්නේ නම් ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු ප්‍රතිපත්තියේ හා එහි ව්‍යතිරේකයන්ගේ වගන්ති හා කොන්දේසිවලට යටත් ව ආ. සං. බැංකුවේ අභිමතය ඇති ව ඉල්ලුම් කළ විටෙක ලබා ගැනීමට කටයුතු සැලැස්විය යුත්තේ ය.

129. තොරතුරු අනාවරණය කිරීමෙන් සිදු වන පොදු යහපත එවැනි අනාවරණය කිරීමකින් ඇති කළ හැකි හානියට වඩා වැදගත්කමින් වැඩි වේ යැයි ආ. සං. බැං. තීරණය කරන්නේ නම් හෝ එසේත් නැත හොත් සාමාජික රටක් එහි ම නීතියට අනුව එසේ කරන ලෙස ඉල්ලා සිටින්නේ නම් ආ. සං. බැංකුවට 126(1) හා (2) සහ 127 යන ඡේද තුළ ලැයිස්තුගත කර තිබෙන තොරතුරු අනාවරණය කළ හැකි ය. තොරතුරු අනාවරණය කිරීමෙන් වන යහපත එබඳු අනාවරණය කිරීමකින් සිදු විය හැකි හානියට වඩා සැලකියයුතු වැදගත්කමක් දරන්නේ යැයි ආ. සං. බැං. තීරණය කරන්නේ නම් හෝ සාමාජික රටක් එහි නීතියට අනුකූල වෙමින් එසේ කරන ලෙස ඉල්ලා සිටින්නේ නම් ආ. සං. බැංකුවට වෙනත් ඕනෑ ම තොරතුරක් අනාවරණය කළ හැකි ය.[29]

130. කෙසේ වෙතත්, ආ. සං. බැං. කිසි යම් පාර්ශ්වයකට එබඳු තොරතුරු රහසිගත ව තබා ගන්නා බවටත් එබඳු පාර්ශ්වයක් අනුමතිය නො දෙන්නේ නම් එබඳු තොරතුරක් අනාවරණය නො කරන බවටත් නිශ්චිත නෛතික ප්‍රතිඥාවක් දී ඇත්නම්, හෝ (ii) එබඳු අනානවරණය කිරීමක් කවර හෝ අදාළ නීතියක් මඟින් තහනම් කරනු ලබන්නේ නම් 129 වැනි ඡේදය නො සලකා ආ. සං. බැං. 126(1) ඡේදයෙහි ලැයිස්තුගත කර තිබෙන තොරතුරු අනාවරණය නො කළ යුත්තේ ය.

## vi. ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන

### (අ) භූමිකාවන් හා වගකීම්

131. ප්‍රතිපත්තියෙහි අරමුණ වන්නේ ආ. සං. බැං. කෙරෙහි පාර්ශ්වකරුවන් තුළ පවත්නා විශ්වාසය වර්ධනය කිරීම හා ආ. සං. බැං. සමඟ කාර්ය නියුක්ත වීමේ හැකියාව

ශක්තිමත් කිරීමත් ය. එහි සියලු ම දෙපාර්තමේන්තු හා කාර්යාල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වග උත්තර සැපයීමට බැඳී සිටිනු ඇත. ආ. සං. බැංකු පාලක මණ්ඩලයේ හා කාර්ය මණ්ඩලයේ භූමිකාවන් හා වගකීම් පහත දැක්වෙන අයුරු සංක්ෂේප කොට දැක්විය හැකි ය.

1. **පාලක මණ්ඩලය**

132. පාලක මණ්ඩලය බාහිර ප්‍රේක්ෂක පිරිස් හා මාධ්‍ය සමඟ එහි කාර්ය නිරතත්වයන් තීව්‍ර කිරීම මඟින් හා බාහිර සබඳතා ක්‍රියාකාරකම්වල සක්‍රිය ව සහභාගී වීමට සියලු කාර්ය මණ්ඩල උනන්දු කර වීම මඟින් බාහිර සබඳතා ශක්තිමත් කිරීමෙහි ලා එහි කැප වීම ප්‍රදර්ශනය කරයි. පාලක මණ්ඩලය නිතිපතා පවත්වනු ලබන පාලක මණ්ඩල කමිටු රැස්වීම් තුළින් ආ. සං. බැංකුවේ බාහිර සබඳතා ප්‍රවේශයන් - ප්‍රමුඛත්වය දෙනු ලබන ක්ෂේත්‍ර, ප්‍රධාන පණිවුඩ, සමාජ කැප වීම හා බලපෑම නිර්වාචනය හා පිරිපහදු කරනු ඇති අතර ඉහළ ම බලපෑම සහතික කෙරෙන අයුරින් ඒවා ක්‍රියාත්මක කිරීමට නායකත්වය ද අධීක්ෂණය ද සපයනු ඇත. සියලු ම මට්ටම්වල කාර්ය මණ්ඩල පාලක මණ්ඩලයේ මතයන් හා ආස්ථානයන් ගැන දැනුවත් ව සිටින බව සහතික කරලීමට පාලක මණ්ඩලය විවෘත හා කාර්ය සාධක අභ්‍යන්තර සන්නිවේදනයන් ප්‍රවර්ධනය කරනු ඇත.

2. **සියලු දෙපාර්තමේන්තු හා කාර්යාල**

133. ආ. සං. බැංකුවේ සියලු ම දෙපාර්තමේන්තු හා කාර්යාල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම භාර ගනු ඇත. එපරිදි ම ආ. සං. බැංකුවේ ප්‍රධාන සන්නිවේදකයෝ ද සියලු දෙපාර්තමේන්තු හා කාර්යාලවල ප්‍රධානීහු ද බාහිර ප්‍රේක්ෂක පිරිස් සමඟ ප්‍රගාමී ව සන්නිවේදනයෙහි යෙදෙනු ඇති අතර ආ. සං. බැංකුවේ බාහිර සබඳතා සවිමත් කිරීමේ ප්‍රයත්නයන්ට නායකත්වය දීමට ද ආ. සං. බැංකුවේ අභිප්‍රායන් හා අරමුණු පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට ද ආයතනය කෙරෙහි පාර්ශ්වකරුවන් තුළ විශ්වාසය ගොඩ නැඟීමට ද ක්‍රියා කරන්නෝ ය. මෙහෙයුම් දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල ව්‍යාපෘති හා විශේෂිත ව සම්බන්ධ වී සිටින පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය පවත්වා ගැනීමෙහි හා අනාවරණය කිරීමේ අවශ්‍යතාවන් සපුරනු ලබන බව සහතික කිරීමෙහි ලා ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ඇත. තමන් අන්තර් ක්‍රියාකාරිත්වයෙහි යෙදෙන රාජ්‍ය, පුද්ගලික හා ලාභ නො ලබන ක්ෂේත්‍රවල ජනයා ප්‍රතිපත්තිය හා ප්‍රතිපත්තියට අනුකූල ව ආ. සං. බැංකුවෙන් තොරතුරු ලබා ගැනීමට පොදු මහජනතාවට පවත්නා අයිතිය ගැන දැනුවත් ව සිටින බව සහතික කිරීමට ඔවුහු උත්සාහ දරනු ඇත.

3. **බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය**

134. තානාපති මණ්ඩල හා නියෝජිත කාර්යාල ඇතුළු ආ. සං. බැංකුවේ පාලක මණ්ඩලය හා සියලු ම දෙපාර්තමේන්තු හා කාර්යාල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය එය ක්‍රියාත්මක කිරීම හා අඛණ්ඩ උපයෝගී කර ගැනීම සම්බන්ධ සමස්ත වගකීම උසුලනු ඇත. බාහිර සබඳතා සම්බන්ධයෙන් මනා සම්බන්ධීකරණ ප්‍රවේශයක් සහතික කරනු වස් නියෝජිත කාර්යාලවල කටයුතු බාහිර සබඳතා පිළිබඳ කාර්යාලය සමඟ ඒකාබද්ධ කරනු ලැබේ. ආ. සං. බැං. ඇතුළත බාහිර සබඳතා පිළිබඳ පාර්ශ්වික දර්ශනය ඉහළ නැංවීම සඳහාත් පුළුල් කරන ලද වගකීම් කාර්ය සාධක අන්දමින් කළමනාකරණය කිරීමට හැකි කර වනු සඳහාත් බාහිර සබඳතා කාර්යාලය දෙපාර්තමේන්තුවක මට්ටමට උසස් කරනු ලබන අතර එය පාලක මණ්ඩලයේ සමීප මඟ පෙන්වීම යටතේ කටයුතු කරනු ඇත. ලබා ගත හැකි සම්පත්වල සීමාවන් තුළ එහි බලපෑම උපරිම මට්ටමකට නැංවීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිය තුළ සාකච්ඡා කරන ලද නව මූලෝපාය මත පදනම් ව එහි භූමිකාව නිර්වාචනය කරනු ඇති අතර එහි කාර්යන් දැඩි ලෙස ප්‍රමුඛතා පදනමක පිහිටුවනු ඇත.

135. ප්‍රතිපත්තිය අනුමත වීමෙන් මාස 3ක් ඇතුළත බාහිර සබඳතා කාර්යාලය මූලෝපායෙහි බාහිර සබඳතා සංරචකය (Component) ක්‍රියාත්මක කිරීම හැසිරවීමට හා තක්සේරු කිරීමට සවිස්තරාත්මක ක්‍රියා මාර්ගික සැලැස්මක් හා අධීක්ෂණ රාමුවක් වර්ධනය කරනු ඇත.

(අ) අනාවරණය කිරීම

136. බාහිර සබඳතා කාර්යාලය තුළ ස්ථාපනය කර තිබෙන නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය (Info - Unit) සියලු ම ආ. සං. බැංකු දෙපාර්තමේන්තුවලට උපදෙස් හා ප්‍රතිපත්ති අර්ථකථන සපයනු ඇති අතර ප්‍රතිපත්තියෙහි අන්තර්ගත අනාවරණය කිරීමේ අවශ්‍යතාවන් අධීක්ෂණය කරනු ඇත. මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය ප්‍රතිපත්තියෙහි අන්තර්ගත අනාවරණය කිරීමේ අවශ්‍යතා ගැන මෙහෙයුම් කාර්ය මණ්ඩල සඳහා අනිවාර්ය පුහුණුවක් සැලසුම් කොට පවත්වා ගෙන යනු ඇත. තව ද, එය ආ. සං. බැං. ප්‍රතිපත්තිය සමඟ අනුකූල ව ක්‍රියා කරන බව සහතික කිරීමට සුපරීක්ෂක පද්ධති හා කාර්ය මණ්ඩල දිරි ගැන්වීම් වර්ධනය කරනු ඇත. එය මූලෝපායන්, වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා සන්නිවේදන සැලසුම් වර්ධනය කිරීම සඳහා මෙහෙයුම් දෙපාර්තමේන්තුවලට සහාය දෙනු ඇත. එය මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුවේ වැඩකටයුතුවලට සෘජු ව සහාය දෙනු ඇති අතර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධ ප්‍රගති වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරයි (151 වැනි ඡේදය බලන්න). මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය ආ. සං. බැං. විසින් සම්පාදනය කරනු ලබන මෙහෙයුම් ලේඛනවල ලැයිස්තුව නිතිපතා යාවත්කාල කරනු ඇති අතර ප්‍රසිද්ධියේ ලබා ගත හැකි මෙහෙයුම් ලේඛන ගැන පොදු ජනතාව දැනුවත් ව තබනු ඇත. එය ප්‍රතිපත්තියෙහි අවශ්‍යතා සමඟ අනුකූල ව අවශ්‍යතා සොයා දැන ගැනීම සඳහා පද්ධතියක් ද පවත්වා ගෙන යනු ඇත.

137. බාහිර සබඳතා කාර්යාලයේ තොරතුරු සන්නිවේදන ජාලය භාර කණ්ඩායම විද්‍යුත් තැපැල් නිවේදන පද්ධතියක් නිර්මාණය කොට නඩත්තු කරනු ඇත. මෙය භාවිත කරන්නන්ට තමන් රුචි කරනුයේ කවර මාදිලියේ තොරතුරු ද යන්න පෙන්වා දීමට හැකි කර වන අතර අදාළ ලේඛනය ලබා ගත හැකි තත්වයකට පත් වීමත් සමඟ විද්‍යුත් තැපෑල මඟින් සංඥා ලබා ගත හැකි කර වයි.

138. බාහිර සබඳතා කාර්යාලය ආ. සං. බැංකුවේ කාර්ය මණ්ඩල අතර විවෘත භාවය පිළිබඳ සංස්කෘතියක් සඳහා උනන්දු කර වනු ඇති අතර තොරතුරු ප්‍රගාමී ව බෙදා හදා ගැනීම සඳහා දිරි ගැන්වීම් වර්ධනය කිරීමට උත්සාහ දරනු ඇත.

(ආ) පරිවර්තන

139. උනන්දුවත් පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම මඟින් මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය ප්‍රතිපත්තිය අනුමත කරනු ලැබීමෙන් මාස 6ක් ඇතුළත පරිවර්තන රාමුවක් සූදානම් කරනු ඇත. පරිවර්තන රාමුව ආ. සං. බැංකුවේ වැඩ කරන භාෂාව වන ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් ලබා ගත හැකි තොරතුරුවල වපසරිය ව්‍යාප්ත කරන මාර්ග සංක්ෂේපයෙන් දක්වනු ඇත.

140. නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය ආ. සං. බැං. ඇතුළත පරිවර්තන කටයුතු සම්බන්ධීකරණය කිරීමටත් ආ. සං. බැං. හරහා ප්‍රධාන පෙළේ පරිවර්තන ප්‍රයත්නයන්ගේ මධ්‍යගත වාර්තාවක් බිහි කිරීමට හා ආ. සං. බැංකුවේ සාමාජික රටවල් තුළ භාවිත කරනු ලබන භාෂාවන්හි ප්‍රවීන පරිවර්තකයන්ගේ දත්ත සමුදායක් පවත්වා ගෙන යාමටත් කටයුතු කරනු ඇත. නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය ආ. සං. බැංකුවේ දෙපාර්තමේන්තු හා කාර්යාල අතර

ඔවුන්ට ලබා ගත හැකි පරිවර්තන සේවා ගැන දැනුවත් භාවය ප්‍රවර්ධනය කරනු ඇත.

### (ඇ) මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ අත්පොත

141. බාහිර සබඳතා කාර්යාලය මහජන සන්නිවේදනයන් පිළිබඳ කාර්ය මණ්ඩල අත් පොතක් සම්පාදනය කරනු ඇත. මෙහෙයුම් තොරතුරු හා ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්වීම සම්බන්ධයෙන් ආ. සං. බැං. කාර්ය මණ්ඩලවලට මඟ පෙන්වීම සඳහා පියවරෙන් පියවර දැක්වෙන කාර්ය පටිපාටියක් මෙහි ඇතුළත් කර තිබේ. කාර්ය මණ්ඩල අත්පොත පාලක මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයට පහසුවෙන් ලබා ගැනීමට සලස්වනු ලැබේ. ආ. සං. බැංකුවේ ණය ලබා ගන්නා ආණ්ඩුවලට හා පුද්ගලික අංශයේ ව්‍යාපෘති අනුග්‍රාහකයන්ට ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා වෙන ම අත්පොතක් ක්‍රමානුකූල ව සකස් කරනු ලැබේ. බාහිර සබඳතා කාර්යාලය මාධ්‍ය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ක්‍රියා පටිපාටීන් පැහැදිලි කරලීමට හා තව දුරටත් සුසංවිහිත කිරීමට එහි මාධ්‍ය මෙහෙයුම් ප්‍රතිපත්ති යාවත්කාල කරනු ඇත. සියලු ම අත්පොත් ප්‍රසිද්ධියේ ලබා ගත හැකි වනු ඇත (68 වැනි ඡේදය බලන්න).

### (ඈ) මහජන තොරතුරු මධ්‍යස්ථාන ජාලය

142. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟීමේ ප්‍රථම වසර තුළ බාහිර සබඳතා කාර්යාලය ආ. සං. බැංකුවේ සංචිත පුස්තකාල වැඩසටහන පිළිබඳ සමාලෝචනයක් පවත්වනු ඇති අතර ආ. සං. බැංකුවේ මහජන තොරතුරු මධ්‍යස්ථාන තත්වයෙන් උසස් කිරීම සඳහා මූලෝපායක් වර්ධනය කරනු ඇත. මහජන තොරතුරු මධ්‍යස්ථාන සඳහා මූලෝපාය හා වැඩසටහන ප්‍රතිපත්තිය බලාත්මක වන දිනයේ පටන් වසර 2ක් ඇතුළත සමාප්ත කරනු ලබන්නේ ය.

143. වෙනත් අන්තර්ජාතික නියෝජිත ආයතන සමඟ හවුල්කාරී වෙමින් තොරතුරු මධ්‍යස්ථාන තුළ ආ. සං. බැං. නිර්මාණය කරන සහභාගිකත්වය මූලෝපායට ඇතුළත් වේ. එය සම්බන්ධීකාරක හා අග්‍රස්ථ රාජ්‍ය නො වන සංවිධාන හා රාජ්‍ය නො වන පර්යේෂණ ආයතන බඳු සිවිල් සමාජ සංවිධාන ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් ගැන තොරතුරු ව්‍යාප්ත කර හැරීමට උපයෝගී කර ගත හැකි මාර්ග ද හඳුනා ගනු ඇත.

### 4. නියෝජිත කාර්යාල හා දූත මණ්ඩල

144. ආ. සං. බැංකුවේ පාර්ශ්වික දර්ශනය ගොඩ නැඟීමෙහි හා පවත්වා ගැනීමෙහි ලා නියෝජිත කාර්යාල හා දූත මණ්ඩල තීරණාත්මක "ඉදිරි පෙළ" භූමිකාවක් නිරූපණය කරයි; ඉලක්ක කෙරුණු ප්‍රේක්ෂක පිරිස්වලට ඔවුන්ගේ සමීපත්වය, ඔවුන්ගේ මෙහෙයුම් හා ආර්ථික විශේෂඥතාව, හා ඔවුන් මූලස්ථාන කර ගෙන සිටින රට හෝ කලාපය තුළ පවත්නා අසමාන සංස්කෘතික හා සන්නිවේදන යථාර්ථයන් පිළිබඳ ඔවුන් සතු අවබෝධය මෙහි ලා දෙන ලද තත්වයන් වේ.

145. නියෝජිත කාර්යාල ප්‍රධානීන් හා දූත මණ්ඩල ආ. සං. බැංකුවේ ප්‍රධාන සන්නිවේදකයන් වන අතර තමන්ගේ රටවල් තුළ මාධ්‍ය, මත පළ කරන නායකයන් හා තීරකයන් සමඟ ආ. සං. බැංකුවේ අන්තර් ක්‍රියාකාරිත්වයන් ව්‍යාප්ත කිරීමේ හා ශක්තිමත් කිරීමේ කාර්යය ඔවුන් වෙත පැවරෙනු ඇත. ආ. සං. බැං. මෙහෙයුම් විශේෂඥ ඥානයෙන් ද සන්නිවේදන නිපුණත්වයෙන් හා මේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය උචිත ආකල්පවලින් යුතු පුද්ගලයන් පත් කළ යුතු ය.

146. ආ. සං. බැං. දූත මණ්ඩලවල බාහිර සබඳතා කාර්ය මණ්ඩල සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වැඩි කරනු ලැබේ.[30] බාහිර සබඳතා කාර්ය මණ්ඩලය ඔවුන්ගේ මණ්ඩලයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානීන්ට වෘත්තිමය සහයෝගය හා උපදෙස්

සපයනු ඇත. මොවුහු දූත මණ්ඩල කළමනාකරණ කණ්ඩායමේ කොටසක් වනු ඇති අතර මණ්ඩලයේ සියලු ක්‍රියාකාරකම් පිළිබඳ ව දැනුවත් ව සිටිනු ඇත. දූත මණ්ඩලයට සම්බන්ධ බාහිර සබඳතා කාර්ය මණ්ඩලයට ස්ථිරසාර රැකියා විස්තර හා සුදුසුකම් තිබෙනු ඇති අතර ව්‍යුහගත හා ප්‍රගමනකාරී පුහුණුවක් ලැබෙනු ඇත.

147. දූත මණ්ඩල බාහිර සබඳතා කාර්ය මණ්ඩලවල ප්‍රධාන වගකීම්වලට ජ්‍යේෂ්ඨ ආ. සං. බැං. කාර්ය මණ්ඩල සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය පහසු කර ගැනීමට පුළුල් පරාසයක ජනතාවන් හා පුද්ගල කණ්ඩායම් සමඟ සබඳතා ස්ථාපනය කිරීම හා දියුණු කර ගැනීම ඇතුළත් වනු ඇත; දේශීය හා ජාත්‍යන්තර මාධ්‍යයන්ට ආ. සං. බැංකු නියෝජිතයන් හා තොරතුරු කරා නිත්‍ය වශයෙන් ප්‍රවේශ වීමට ඇති මාර්ග පිළිබඳ ව වග බලා ගැනීම; මේ මූලෝපායට ඇතුළත් අනාවරණය කිරීමේ අංශ ක්‍රියාවට නැංවීමට දූත මණ්ඩලවලට සහාය වීම; ප්‍රතිපත්තියට අදාළ අනාවරණය කිරීමේ අවශ්‍යතා අර්ථ නිරූපණය කර දැක්වීමට රට ඇතුළත ම ජනතාවට උපකාර කිරීම; හා ආ. සං. බැංකුවට වැදගත් වන වාද විෂයන් පිළිබඳ ව මාධ්‍ය ප්‍රසිද්ධියක් ලබා ගැනීම සඳහා ඉංග්‍රීසි හා දේශීය භාෂාවලින් පළ වන ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර ප්‍රවෘත්ති අධීක්ෂණය කිරීම ඉහත කී වගකීම්වලට අයත් වේ.

148. ස්ථිරසාර භාවය වැඩි දියුණු කිරීමට හා තොරතුරු බෙදා හදා ගැනීමේ ප්‍රතිලාභ උපරිමත්වයට පත් කර ගැනීමට නියෝජිත කාර්යාලවලින් ද සියලු බාහිර සබඳතා කාර්ය මණ්ඩලවලින් ද දූත මණ්ඩල හා බාහිර සබඳතා කාර්යාලයෙන් ද සමන්විත වන බාහිර සබඳතා ජාලයක් නිර්මාණය කරනු ලබන අතර මේ පිරිස් ඇසිදිසි සබැඳි සම්මන්ත්‍රණවල දී (හා වාර්ෂික ව පෞද්ගලික ව ද) නිතිපතා මුණ ගැසෙනු ඇත. දූත මණ්ඩල බාහිර සබඳතා කාර්ය මණ්ඩලයට අදාළ රටේ අධ්‍යක්ෂවරයාට හා බාහිර සබඳතා කාර්යාලයට වාර්තා යැවීම සඳහා ද්විත්ව පණිවුඩ මාර්ගයක හිමිකම ලැබෙනු ඇත.

149. දූත මණ්ඩල හා නියෝජිත කාර්යාල ලේඛන පරිවර්තන කටයුතු සම්බන්ධීකරණය ද අවශ්‍ය පරිදි පරිවර්තනවල නිරවද්‍ය භාවය සමාලෝචනය ද කරනු ඇත.

### 5. ණය ගැනුම්කරුවෝ හා ව්‍යාපෘති අනුග්‍රාහකයෝ

150. ආ. සං. බැං. සම්බන්ධයෙන් සලකන කල, තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධ වගකීමෙන් වැඩි කොටස ණය ඉල්ලුම් කරන ආණ්ඩුව හෝ පුද්ගලික අංශයේ අනුග්‍රාහකයන් මත රැඳී පවතිනු ඇත. ණය ගැනුම්කරුවා ව්‍යාපෘතිය ගැන එහි බලපෑමට පාත්‍ර වන ජනයා සමඟ සංවාදයක් පවත්වා ගෙන යාමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශ තුළ අවධානය යොමු විය යුතු කේන්ද්‍රීය ක්ෂේත්‍ර සපයා දීම සඳහා මෙහෙයුම් දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල සමඟ ක්‍රියා කරනු ඇත (74 වැනි ඡේදය). ව්‍යාපෘතිවල අවධානය යොමු කෙරෙන කේන්ද්‍රීය ක්ෂේත්‍රවලට ව්‍යාපෘතිය හා රට සම්බන්ධිත තොරතුරු කරා ප්‍රවේශ වීම සඳහාත් ප්‍රාදේශිය ව හා සංස්කෘතික වශයෙන් යෝග්‍ය නිකුත් කිරීමේ යන්ත්‍රණයන් භාවිත කරමින් උනන්දුවත් පාර්ශ්වයන්ට එබඳු තොරතුරු අනාවරණය කිරීම සඳහාත් වෙබ් අඩවි උපයෝගී කර ගත හැකි ය.

### 6. මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව

151. ප්‍රතිපත්තිය පිළිබඳ අනාවරණය කිරීමේ අවශ්‍යතා අර්ථ නිරූපණය කිරීමට, අධීක්ෂණය කිරීමට හා සමාලෝචනය කිරීමට අධීක්ෂණ මණ්ඩලයක් හැටියට මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුවක් නිර්මාණය කිරීමට ආ. සං. බැං. පියවර ගනු ඇත. මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව කළමනාකරණ අධ්‍යක්ෂවරයාගෙන් (සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි) ද බාහිර සබඳතා කාර්යාලයේ ප්‍රධාන අධ්‍යක්ෂවරයාගෙන් ද ලේකම්වරයාගෙන් හා මහා මණ්ඩලයෙන් ද සමන්විත වනු ඇත. එය සෘජු ව ම සභාපතිවරයාට රපෝර්තු කරනු ඇත. ඉහත සඳහන් කමිටුව ආ. සං. බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තු හෝ

කාර්යාල මඟින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබෙන තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් සමාලෝචනය කිරීමට අවශ්‍ය වන පරිදි රැස් වනු ඇත.

152. මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව ප්‍රතිපත්තියෙහි අන්තර්ගත අනාවරණ කිරීම් පිළිබඳ මූලිකාංග ක්‍රියාත්මක කිරීම තක්සේරු කිරීම මඟින් මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය (162 වැනි ඡේදය) සම්බන්ධ වාර්ෂික වාර්තාවට සම්ප්‍රදානයන් කරනු ඇත. මහජනයාට තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ ලුහුඬු වාර්තාවක් මෙන් ම ප්‍රතිපත්තියෙහි, මෙහෙයුම් අත් පොතෙහි හෝ ආ. සං. බැංකුවේ තොරතුරු පිළිබඳ ප්‍රසිද්ධ අනාවරණය කිරීම්වලට සහාය දක්වන සංවිධානමය ව්‍යුහයෙහි සිදු කරනු ලබන වෙනස්කම් සම්බන්ධ කවර හෝ නිර්දේශයන් වේ නම් ඒවා ද වාර්ෂික වාර්තාවට ඇතුළත් වනු ඇත.

### (ආ) තොරතුරු ලබා ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටීන්

#### 1. ප්‍රගාමී අනාවරණය කිරීම්

153. ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ඒවා ලෙස ප්‍රතිපත්තිය තුළ හඳුනා ගනු ලැබ තිබෙන තොරතුරු සඳහා වන ඉල්ලීම් වාචික ව හෝ ලිඛිත ව ආ. සං. බැංකුවට සන්නිවේදනය කළ හැකි ව තිබේ. කෙසේ වෙතත්, 157 වැනි ඡේදය තුළ සංක්ෂේපයෙන් දක්වා ඇති කාල සීමාවන් ක්‍රියාත්මක වීම ආරම්භ වනු ඇත්තේ කිසි යම් සීමාවන් ක්‍රියාත්මක වීම ආරම්භ වනු ඇත්තේ කිසි යම් ඉල්ලීමක් ලිඛිත ව ආ. සං. බැංකුව භාර ගත් තැන් පටන් පමණි. ඉල්ලීම් නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකයට, දූත මණ්ඩලයකට හෝ නියෝජිත කාර්යාලයකට එසේත් නැත් නම් මෙහෙයුම් දෙපාර්තමේන්තුවකට යොමු කළ හැකි ව තිබේ. ආ. සං. බැංකුවේ කවර හෝ කාර්ය මණ්ඩල සාමාජිකයකු වේවා ඔහු ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ලේඛන හැකි තරම් කඩිනම් හා ප්‍රායෝගික අයුරින් සපයා දිය යුත්තේ ය. ලේඛනය ආ. සං. බැංකුවේ වෙබ් අඩවියෙහි දැක්වේ නම් හා ඉල්ලුම්කරු අන්තර් ජාලයට ප්‍රවේශ වීමට සූදානම් ව සිටින්නේ නම් ඉල්ලුම්කරු අදාළ වෙබ් අඩවි සම්බන්ධකයට යොමු කිරීම ද මීට ඇතුළත් විය හැකි ය.[31]

#### 2. ව්‍යාතිරේක පදනම් කොට ගත්, තොරතුරු සඳහා වන ඉල්ලීම්

154. ප්‍රතිපත්තිය යටතේ ප්‍රසිද්ධියේ ලබා ගැනීමට නො හැකි තොරතුරු හා ලේඛන සඳහා කෙරෙන ඉල්ලීම් ලිඛිත ව (විද්‍යුත් තැපෑලෙන්, සාමාන්‍ය තැපෑලෙන්, අන්තර් ජාල ප්‍රතිපෝෂණ ෆෝරම හෝ ෆැක්ස් පණිවුඩ මඟින්) ලබා ගත යුතු ව තිබේ. ඉල්ලීම් නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය වෙත හෝ අදාළ දූත මණ්ඩලයට නැත හොත්, නියෝජිත කාර්යාලයට යොමු කළ හැකි ව තිබේ. ඉහත සඳහන් කෙරුණු කාර්යාල හා සම්බන්ධ වීමට අදාළ විස්තර ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

155. ඉල්ලීම සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටක් තුළ ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකමක් සම්බන්ධ වුවක් වන අවස්ථාවන්හි දී අදාළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව ලේඛනයේ අඩංගු ව ඇත්තේ ව්‍යාතිරේක පිළිබඳ වගන්තියට (123, 130 වැනි ඡේද) අනුකූල ව ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුතු නො වන තොරතුරු දැයි තීරණය කළ යුතු අතර යෝග්‍ය පරිදි රජයෙන් ද ව්‍යාපෘති අනුග්‍රාහකයාගෙන් නැත හොත් සම ආයෝජකයාගෙන් ද අදහස් විමසිය යුත්තේ ය. ලේඛනයක යම් නිශ්චිත තොරතුරක් ප්‍රතිපත්තියේ ව්‍යාතිරේකයන්ට අනුකූල ව රහස්‍ය යැයි සලකනු ලබන අවස්ථාවන්හි අදාළ දෙපාර්තමේන්තුව ලේඛනය අනාවරණය කිරීමට මත්තෙන් රහස්‍ය තොරතුරු ඉවත් කළ යුත්තේ ය. එහි දී ඉවත් කරන ලද තොරතුරු සම්බන්ධයෙන් (එය ඉවත් කිරීමට හේතුව ද සහිත ව) නිර්දේශනයක් ද යොදනු ඇත. බාහිර සබඳතා කාර්යාලයේ මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකයේ කාර්ය මණ්ඩලය අවශ්‍ය පරිදි ප්‍රතිපත්තිය පිළිබඳ අර්ථ කථනය

සම්බන්ධයෙන් අනෙක් දෙපාර්තමේන්තුවලට මාර්ගෝපදේශකත්වය සැපයිය යුත්තේ ය.

### 3. ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු භාෂාව

156. ආ. සං. බැංකුවට ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් ඉංග්‍රීසි බසින් හෝ ආ. සං. බැංකු සාමාජික රටවල ජාතික භාෂාවලින් ඉදිරිපත් කළ හැකි ව තිබේ. ඉංග්‍රීසි භාෂාවෙන් හැර වෙනත් භාෂාවලින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සඳහා වන ඉල්ලීම් අදාළ දූත මණ්ඩලයට හෝ මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකයට යොමු කළ හැකි ව තිබේ.

### 4. ප්‍රචලිත තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා වන කාල සීමාවන්

157. ආ. සං. බැං. ඉල්ලීමක් භාර ගත් බව (153 හා 154 වැනි ඡේද තුළ විස්තර කර ඇති පරිදි) වැඩ කරන දින 5ක් ඇතුළත දැනුම් දිය යුත්තේ ය. ඉක්බිති තීරණයක් ගනු ලැබූ වහා ම ආ. සං. බැං. ඉල්ලුම්කරුට ඒ බව දැනුම් දිය යුත්තේ ය. කෙසේ වුවත්, මෙය ඉල්ලීම ලැබීමෙන් පසු කැලැන්ඩර දින 30ක් ගත වීමට මත්තෙන් සිදු කළ යුතු ව තිබේ. මීට ප්‍රතිචාර වශයෙන්, ආ. සං. බැං. ඉල්ලුම් කරන ලද තොරතුරු සැපයිය යුත්තේ ය; එසේ නැත හොත්, ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තුඩු දුන් හේතු පහදා දිය යුත්තේ ය. මෙහි දී එබඳු ප්‍රතික්ෂේප කිරීමක් යුක්ති යුක්ත කෙරෙන, ප්‍රතිපත්තිය තුළ අඩංගු ප්‍රතිපාදන ද පෙන්වා දිය යුත්තේ ය. ආ. සං. බැං. සමාලෝචනය කරන ලද ඉල්ලීම්වල ලැයිස්තුවක් හා ඊට අනුරූපී වන තීරණ හා හේතු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### 5. පැමිණිලි

158. කිසි යම් ඉල්ලුම්කරුවකු සිය ඉල්ලීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබ ඇතැයි විශ්වාස කරන්නේ නම් එසේ නැත හොත් ප්‍රතිපත්තිය අනිසි ලෙස අර්ථ කථනය කරනු ලැබ ඇතැයි විශ්වාස කරන්නේ නම් විමර්ශනයක් සඳහා ඉල්ලීමක් පහත සඳහන් ලිපිනයට ලිඛිත ව ඉදිරිපත් කළ හැකි ව තිබේ: Public Disclosure Advisory Committee, Asian Development Bank, 6, ADB Avenue, Mandaluyong City, 1550, Metro Manila, Philippines; නැත හොත්, pdac@adb.org, යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද +632 636 2640 අංකයට ෆැක්ස් මඟින් ද ඉදිරිපත් කළ හැකි ය.

159. මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව (ම. අ. උ. ක.) ඉල්ලීමක් භාර ගත් බව වැඩ කරන දින 5ක් ඇතුළත දැනුම් දිය යුත්තේ ය. ම. අ. උ. ක. පැමිණිලි සලකා බැලීම සඳහා හැකි ඉක්මනින් රැස් වනු ඇත. ඉල්ලුම් කරන ලද තොරතුරු අනාවරණය කිරීම ප්‍රතික්ෂේප කිරීම් මෙන් ම ඉල්ලුම් කර ඇති තොරතුරු අනාවරණය කිරීමෙහි ලා මහජන උනන්දුව ගැන ද සලකා බලමින් ම. අ. උ. ක. තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ඉඩ සලසා දීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය තුළ දැක්වෙන ව්‍යතිරේකයන් සලකා බලනු ඇත. ම. අ. උ. ක. එහි තීරණය, තීරණය ගනු ලැබූ වහා ම හේතු සඳහන් කරමින් ලිඛිත ව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය; කෙසේ වුවත්, මේ දැනුම් දීම කළ යුත්තේ ඉල්ලීම ලැබීමෙන් පසු කැලැන්ඩර දින 30ක් ගත වීමට මත්තෙනි. ම. අ. උ. ක. එබඳු සියලු ඉල්ලීම්වල ලැයිස්තුවක් ද එක් එක් ඉල්ලීමේ ස්වභාවය හා එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් ගන්නා ලද තීන්දුව තාවකාලික පදනමක් මත ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. මෙය කළ යුත්තේ ඉල්ලීම කරනු ලැබීමෙන් හෝ තීරණය ගනු ලැබීමෙන් සති 2ක් ඉක්ම යාමට කලිනි.

## 6. ඓතිහාසික තොරතුරු සඳහා ඉල්ලීම්

160. ඓතිහාසික තොරතුරු, ප්‍රතිපත්තියේ 127 -129 දක්වා ඡේදවලට අනුකූල ව කරනු ලබන ඉල්ලීමක් මත ලබා ගත හැකි ය. එබඳු ඉල්ලීම් පහත දැක්වෙන ලිපිනයට ලිඛිත ව ඉදිරිපත් කළ හැකි ව තිබේ:Information Resources and Services Section, Asian Development Bank, 6, ADB Avenue, Mandaluyong City, 1550 Metro Manila, Philippines; නැත හොත්, adblibrary@adb.Org, යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද + 63 2 632 5020 අංකයට ෆැක්ස් මඟින් ද ඉදිරිපත් කළ හැකි ය. ඓතිහාසික තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම් ඉල්ලා සිටිනු ලබන නිශ්චිත තොරතුරු හඳුනා ගත යුතු ය; ඓතිහාසික තොරතුරු කරා ප්‍රවේශ වීමට කෙරෙන පොදු ඉල්ලීම් භාර ගනු නො ලැබේ. ආ. සං. බැං. එබඳු ඉල්ලීම් භාර ගත්තේ නම් ඒ බව වැඩ කරන දින 5ක් ඇතුළත දැනුම් දිය යුතු අතර ඓතිහාසික තොරතුරු සඳහා කෙරෙන ඉල්ලීම්වලට කැලැන්ඩර දින 30ක් ඇතුළත ප්‍රතිචාර දැක්විය යුත්තේ ය. ඉල්ලීම විශාල ප්‍රමාණයක තොරතුරු සඳහා වන්නේ නම් මේ කාල සීමාව දීර්ඝ කළ හැකි ව තිබේ.

### (ඇ) ක්‍රියාත්මක වන දිනය හා සංක්‍රමණීය කාල පරිච්ඡේදය

161. ප්‍රතිපත්තිය 2005 සැප්තැම්බර් 1 වැනි දා ක්‍රියාත්මක භාවයට පත් විය යුත්තේ ය. තව ම ආරම්භ වී නො මැති හෝ මේ මොහොතේ සූදානම් වීමේ කටයුතු ආරම්භ කෙරෙමින් තිබෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියෙහි අඩංගු සියලු අනාවරණය කිරීමේ අවශ්‍යතා අදාළ විය යුත්තේ ය. ප්‍රතිපත්ති, මූලෝපායන් හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පාලක මණ්ඩල සමාලෝචන රැස්වීම සම්පූර්ණ කර තිබෙන මූලෝපායන් හා වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියෙහි අඩංගු අනාවරණය කිරීමේ අවශ්‍යතා අදාළ විය යුත්තේ ඒවායේ සමාලෝචන හෝ යාවත්කාල කිරීම් සඳහා පමණි. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දිනය වන විට ඇගයීමේ කටයුතු නිම කර තිබෙන ව්‍යාපෘති හෝ වැඩසටහන් ප්‍රතිපත්තියෙහි අඩංගු අනාවරණය කිරීමේ අවශ්‍යතා ව්‍යාපෘතියේ හෝ වැඩසටහනේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලැබීමට මත්තෙන් සූදානම් වීමේ අදියර සඳහා අදාළ නො විය යුතු නමුත් එය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා සම්පූර්ණ කිරීමේ අදියරයන්ට අදාළ විය යුත්තේ ය. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර 2ක් ඇතුළත ආ. සං. බැං. ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ආ. සං. බැංකුවේ සහාය ලද සියලු ම ව්‍යාපෘති සඳහා වන ව්‍යාපෘති/වැඩසටහන් තොරතුරු ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට ආරම්භ වන ප්‍රථම වසර ඇතුළත ආ. සං. බැං. ක්‍රියාත්මක වෙමින් තිබෙන සියලු ම ව්‍යාපෘති හා වැඩසටහන්වලින් අඩු තරමින් 50%ක ප්‍රමාණයක් සඳහා වන ව්‍යාපෘති/වැඩසටහන් තොරතුරු ලේඛන ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය.

### (ඈ) අධීක්ෂණය කිරීම හා වාර්තාකරණය

162. ආ. සං. බැං. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟීම අධීක්ෂණය කරන අතර එහි බලපෑම තක්සේරු කරනු ඇත. ආ. සං. බැං. එහි තොරතුරු ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ ප්‍රතිඵල වාර්ෂික වාර්තාවක් තුළින් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. ප්‍රතිපත්තිය සඳහා ආ. සං. බැංකුවේ ක්‍රියාකාරිත්වයන් ඇගයීමේ රාමුව 2 වැනි උපග්‍රන්ථය තුළ සංක්ෂේපයෙන් දැක්වේ.

163. ආ. සං. බැං. පාර්ශ්වකරුවන්ට විවාදයට තුඩු දෙන ගැටලු මතු කිරීමට ද තොරතුරු කරා ප්‍රවේශ වීමට හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ආ. සං. බැං. සමඟ කාර්ය සාධක අයුරින් නියුක්ත වීමට ද අවකාශ ලබා දෙයි. එසේ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුව හොත්, ආ. සං. බැං. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ගැන කනස්සල්ල පළ කරන පුද්ගලයන්ගේ හා කණ්ඩායම්වල නම් අනාවරණය නො කරනු ඇත.

(ඉ) සමාලෝචන හා සංශෝධන

164. ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් ද වෙනත් ආ. සං. බැං. ප්‍රතිපත්ති හා මූලෝපායන් පිළිබඳ සමාලෝචනයන්ගේ ප්‍රතිඵල හා වෙනත් ස්ථානවල පරිණාම වෙමින් පවතින භාවිතයන් පිළිබිඹු කිරීමට ආ. සං. බැං. ප්‍රතිපත්තිය තුළ දැක්වෙන ප්‍රතිපාදන සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම අවශ්‍ය වෙයි. කලින් කලට ඒබඳු වෙනස්කම් අන්තර්ගත කර ගැනීම සඳහා නම්‍යතාව අවශ්‍ය වනු ඇත. යථා පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් පසු ආ. සං. බැංකුවට අවශ්‍ය අයුරින් ප්‍රතිපත්තිය සංශෝධනය හෝ ප්‍රතිශෝධනය කළ හැකි ය.

165. දැනට පවත්නා වෙනත් ආ. සං. බැංකු ප්‍රතිපත්ති හෝ මූලෝපායන් සඳහා ප්‍රතිපත්තිය නව අනාවරණය කිරීමේ අවශ්‍යතා සකස් කර තිබෙන තන්හි දී ඒබඳු ප්‍රතිපත්ති හෝ මූලෝපායන් පිළිබඳ මෙහෙයුම් අත්පොතේ වගන්ති ප්‍රතිපත්තිය අනුමත වීමෙන් මාස 5ක් ඇතුළත යාවත්කාල කළ යුතු ව තිබේ.

166. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර 5ක් ඉක්මවා නො යන කාල පරිච්ඡේදයකට පසු ව ආ. සං. බැං. පුළුල් සමාලෝචනයක් පැවැත්විය යුත්තේ ය. සමාලෝචනය උනන්දුවත් පුද්ගලයන් හා සංවිධාන සක්‍රිය ව නියුක්ත කර ගනු ඇත.

### vii. කාර්ය මණ්ඩල යෙදවීම හා සම්පත් පිළිබඳ ගම්‍යමානයෝ (implications)

167. ප්‍රතිපත්තිය සාර්ථක ව ක්‍රියාත්මක වීම ආ. සං. බැංකුවේ බොහෝ කාර්ය මණ්ඩල ඉදිරියේ අලුත් අභියෝගයන් තබනු ඇති අතර ඒ සඳහා අතිරේක පිරිවැයක් අවශ්‍ය වෙනු ඇත. වඩා පුළුල් විවෘත භාවයක් කරා ආ. සං. බැංකුවේ පෘථුල විතැන් වීම, වඩාත් පූර්ණ අනාවරණය කිරීම් හා වඩාත් ප්‍රගාමී තොරතුරු බෙදා හදා ගැනීම ආ. සං. බැංකුවේ පුළුල් වගකීමක් වන අතර ඉහතින් දැක්වුණු ඡේද තුළ හඳුනා ගත් තීරණාත්මක ක්‍රියාදාමයන් හා පියවරයන් සඳහා සමහර ක්ෂේත්‍ර තුළ අතිරේක සම්පත් අවශ්‍ය වනු ඇත. නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අතිරේක පිරිවැය සීමා කර ගැනීමට සියලු ප්‍රයත්න දරනු ලැබ තිබේ; එය ක්‍රියාත්මක වීමත් සමඟ ඒවා සමීප සමාලෝචනයකට යටත් කර තබනු ඇති අතර අයවැය ලේඛන මඟින් කෙරෙන මුදල් වෙන් කිරීම යථා පරිදි සකස් කෙරෙනු ඇත.

168. පහත වඩාත් සවිස්තර ව සාකච්ඡා කෙරෙන පරිදි, ආ. සං. බැං. අවශ්‍ය සම්පත් අදියරෙන් අදියරට වෙන් කර දෙනු ඇත. සමස්තයක් වශයෙන් කෙටි කාලීන ව වෘත්තිමය කාර්ය මණ්ඩල තනතුරු 1ක් ද ජාතික නිලධාරි තනතුරු 10ක් ද වෘත්තීය කාර්ය මණ්ඩල වර්ෂ 5.2කට හා සහායක කාර්ය මණ්ඩල වර්ෂ 1.5කට ද සමාන තනතුරු ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත.[32] ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට එක් වතාවක පිරිවැය වශයෙන් ආසන්න වශයෙන් වර්ෂයකට එ. ජ. ඩොලර් 203,000ක් ද පුනරාවර්තන පිරිවැය වශයෙන් එ. ජ. ඩොලර් 208,000ක් ද අවශ්‍ය වනු ඇත.

(අ) බාහිර සබඳතා

169. ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් පසු දැනට සීමා සහිත බාහිර සබඳතා හැකියාවන් තිබෙන ප්‍රධාන දූත මණ්ඩලවලට නව ජාතික නිලධාරි තනතුරු පවරනු ලැබේ: බංග්ලාදේශය, කසකස්ථානය,[33] කිර්ගිෂ් ජනරජය, පකිස්ථානය, ශ්‍රී ලංකාව, තායිලන්තය, උස්බෙකිස්ථානය හා වියට්නාමය (146 වැනි ඡේදය)[34] මීට අයත් වේ. මධ්‍ය කාලීන ව, ආ. සං. බැං. දැනට පවතින දූත මණ්ඩලවලට බාහිර සබඳතා ඉල්ලීම හා අවස්ථා මට්ටමෙන් ප්‍රමුඛත්වය දෙනු ඇති අතර යථා පරිදි අතිරේක තනතුරු නියම කරනු ඇත. ආ. සං. බැං. සුදුසු දූත මණ්ඩල සඳහා කලාපීය වගකීම් සහිත වෘත්තිමය කාර්ය මණ්ඩල තනතුරු නිර්මාණය කිරීමේ අවශ්‍යතාව ද තක්සේරු කරනු ඇත.

170. බාහිර සබඳතා සඳහා නව සංවිධානාත්මක විධිවිධාන මත පදනම් ව ආ. සං. බැං. තව දුරටත් ප්‍රතිපත්තිය යටතේ බාහිර සබඳතා මූලෝපාය ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් අවශ්‍යතා තක්සේරු කරනු ඇති අතර බාහිර සබඳතා කාර්යාල හා නියෝජිත කාර්යාල තුළ කාර්ය මණ්ඩල නිපුණතා සංකලනය වැඩි දියුණු කිරීම හා යළි පෙළ ගැස්වීම සඳහා විෂය පථය හඳුනා ගනු ඇත. තව ද, අනුමත කරන ලද අය-වැය ආවරණය ඇතුළත ලබා ගත හැකි සම්පත් ප්‍රමාණය අවශ්‍ය ස්ථානයන්හි නැවත ස්ථානගත කරනු ඇත. හැඳින ගැනීමේ සමීක්ෂණය හා බාහිර සබඳතා සඳහා සිදු කරනු ලබන දූත ගමන්, පුහුණු කිරීම් හා දූරස්ථ මාධ්‍ය ක්‍රියාකාරකම් බඳු පුනරාවර්තන පිරිවැය සඳහා එක් වතාවකට වැය වන මුදල ද තක්සේරු කරනු ලබන අතර මේ ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය අරමුදල් රැස් කර ගැනීමේ මාර්ග වාර්ෂික අයවැය ක්‍රියාදාමය තුළින් සොයා ගනු ලැබේ.

171. දූත මණ්ඩලවල හා සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල්වලට සේවය කරන වෙනත් ක්ෂේත්‍ර කාර්යාලවල පිහිටුවා තිබෙන මහජන තොරතුරු මධ්‍යස්ථාන උසස් මට්ටමකට ගෙන ඒමේ හව්‍යතාව බාහිර සබඳතා කාර්යාලය මඟින් සමාලෝචනය කරනු ලබන අතර යෝග්‍ය පිරිවැය ඇස්තමේන්තු වෙන් වෙන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙන එනු ලබනු ඇත.

### (ආ) තොරතුරු අනාවරණය කිරීම

172. ප්‍රතිපත්තිය පිළිබඳ අනාවරණය කිරීම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා ඇගයීම ගැන වග බලා ගන්නා බාහිර සබඳතා කාර්යාලයේ නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය නිර්මාණය කිරීම අතිරේක ව එක් වෘත්තිමය කාර්ය මණ්ඩල තනතුරක් හා එක් ජාතික නිලධාරී තනතුරක් පිහිටු වීම අවශ්‍ය කෙරෙනු ඇත. ඊට අතිරේක ව, නව මහජන තොරතුරු හා අනාවරණය කිරීමේ ඒකකය, මෙහෙයුම් දෙපාර්තමේන්තු හා ආ. සං. බැංකු වෙබ් අඩවියට බොහෝ ලේඛන ඇතුළත් කිරීමෙහි යෙදී සිටින වෙනත් කාර්යාල සමඟ සම්බන්ධීකරණය ඇති කිරීමට වෙබ් අඩවි කණ්ඩායමට අලුතින් එක් ජාතික නිලධාරියකු පත් කරනු ඇත. පළමු වසර තුළ බාහිර සබඳතා කාර්යාලයට පුහුණු කිරීමේ කටයුතු සඳහා ආසන්න වශයෙන් ඩොලර් 133,000ක ද ඊට පසු එළඹෙන සෑම වසරක් සඳහා ම ප්‍රතිපත්තිය අධීක්ෂණය කිරීමට ඩොලර් 20,000ක ද වැය ශීර්ෂයක් අවශ්‍ය වනු ඇත.

173. ප්‍රතිපත්තිය යටතේ අවශ්‍ය කෙරෙන අතිරේක ලේඛන අනාවරණය කිරීමට ද බලපෑමට පාත්‍ර වූ ජනයා සමඟ වඩා ක්‍රමානුකූල ව සන්නිවේදනයෙහි යෙදීමට ද පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණවලට ආමන්ත්‍රණය කිරීමට හා රාෂ්ට්‍රීය මූලෝපාය හා වැඩසටහන් පරිවර්තනය කිරීමට හා යාවත්කාල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීමට ද අතිරේක මෙහෙයුම් කාර්ය මණ්ඩල ශ්‍රම කාල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. කලාපීය දෙපාර්තමේන්තුවලට වෘත්තීය කාර්ය මණ්ඩල අවුරුදු 5.2ක් (ඩොලර් 960,000) ද සහායක කාර්ය මණ්ඩල අවුරුදු 1.5ක් (ඩොලර් 32,500) හා වසරකට සංගත ගමන් බිමන් වියදම් සඳහා ඩොලර් 60,000ක් ද අවශ්‍ය වනු ඇත. ව්‍යාපෘති තොරතුරු ලේඛන නිර්මාණය කිරීමට එක් වරකට වියදම් වශයෙන් ඩොලර් 70,000ක් ද පරිවර්තන කටයුතු සඳහා වියදම් වශයෙන් වාර්ෂික ව ඩොලර් 128,000ක් ද කලාපීය දෙපාර්තමේන්තුවලට අවශ්‍ය වනු ඇත. ප්‍රතිපත්තිය අනුමත කරනු ලැබීමෙන් මාස 6ක් ඇතුළත බාහිර සබඳතා කාර්යාලය ආ. සං. බැං. ක්‍රමානුකූල ව පරිවර්තනය කරන ලේඛනවල පරාසය පුළුල් කිරීම සඳහා රාමුවක් වර්ධනය කරනු ඇත. පරිවර්තන කටයුතු පිළිබඳ රාමුවට වඩා සවිස්තර පරිවර්තන වැය ශීර්ෂයක් ඇතුළත් වනු ඇත.

174. නව ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලයක් වශයෙන් පූර්වාපේක්ෂණය කළ හැකි ඓතිහාසික තොරතුරු සඳහා වන ඉහළ යන විමසීම් සංඛ්‍යාවට සවිමත් කරන ලද හා වැඩි පිරිවැය ඵලදායිත්වයකින් යුත් පුස්තකාල, වාර්තා සටහන් හා ලේඛන සංරක්ෂණාගාර කළමනාකරණ පද්ධති තුළින් අනුග්‍රහ ලබා දෙනු ඇත.

175. ආ. සං. බැංකුවේ නව තොරතුරු පද්ධති හා තාක්ෂණික මූලෝපාය II(2004-2009) යටතේ ආ. සං. බැංකුවේ පරිගණක පද්ධතිය නිසි කලට, අදාළ තොරතුරු සැපයීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා යළි හැඩ ගැස්වීමට හා ඒකාබද්ධ කිරීමට පියවර ගනු ඇත. මේ මූලෝපාය යටතේ දැනට වර්ධනය කරනු ලබමින් හා සැලසුම් කරනු ලබමින් තිබෙන තොරතුරු කෝෂ්ඨාගාරය හා සමුද්ධරණ පද්ධති ද (retrieval systems) මෙහෙයුම් තොරතුරු කරා වඩා ලෙහෙසියෙන් හා ඉක්මනින් ප්‍රවේශ වීමට හා තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආ. සං. බැං. වෙබ් අඩවි තුළ වඩ වඩාත් ව්‍යාපෘතිවලට සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීම - සහ එය භාවිත කරන්නාට වඩා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි මට්ටමක් කරා නැංවීමට සංවිධානය කිරීම - මඟින් තොරතුරු සඳහා ලැබෙන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට කාර්ය මණ්ඩල දැනට වැය කරන කාලය අඩු වනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

176. ණය හා තාක්ෂණික සහාය, සන්නිවේදන සැලසුම් හා බලපෑමට පාත්‍ර වූ ජනයා සමඟ සන්නිවේදනය පවත්වා ගැනීම සඳහා යන්ත්‍රණයන් වර්ධනය කිරීම (74 - 76 දක්වා ඡේද බලන්න) සඳහා වන පිරිවැය ව්‍යාපෘති මාදිලිය හා භූගෝලීය පිහිටීම අනුව වෙනස් වනු ඇත. මෙකී වෙනස්කම් ව්‍යාපෘති සැලසුම් කිරීමේ අවධියේ දී හඳුනා ගෙන එක් එක් වැඩසටහනට නැත හොත් ව්‍යාපෘතියට අදාළ අය-වැය ලේඛනය තුළට සංයුක්ත කරනු ලබනු ඇත.

### viii. අනුකූලතා සමාලෝචනය

177. ප්‍රතිපත්තිය පිළිබඳ අනාවරණය කිරීමේ අවශ්‍යතා ආ. සං. බැංකුවේ වග උත්තර සැපයීම පිළිබඳ යන්ත්‍රණයට අනුකූල ව අනුකූලතා සමාලෝචනයට භාජනය විය යුත්තේ ය.[35] 25 - 38 දක්වා වන ඡේදයන් තුළ විස්තර විභාග දක්වා ඇති ප්‍රතිපත්තිය ද 55 - 130 දක්වා වන ඡේදයන් තුළ විස්තර විභාග දක්වා ඇති නිශ්චිත අනාවරණය කිරීමේ අවශ්‍යතා හා 153 - 166 දක්වා වන ඡේද තුළ විස්තර විභාග දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන ද ආ. සං. බැංකුවේ වග උත්තර සැපයීම පිළිබඳ යන්ත්‍රණය යටතේ අනුකූලතා සමාලෝචනයට භාජනය විය යුත්තේ ය.

### ix. නිර්දේශ කිරීම

178. අධ්‍යක්ෂ මණ්ඩලය මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය අනුමත කළ යුතු බවට සභාපතිවරයා නිර්දේශ කරයි.

## පාදීය සටහන්

---

[1] ආ. සං. බැං. 1999, *Fighting Poverty in Asia and the Pacific : The Poverty Reduction Strategy,* මැනිලා; ආ. සං. බැං. 2004, *Review of the Poverty Reduction Strategy of the Asian Development Bank,* මැනිලා; යන කෘතිය ද බලන්න.

[2] "පාර්ශ්වකරුවන්" යනු සංවර්ධන ආරම්භකත්වයක ප්‍රකාශිත අරමුණුවලට පාත්‍ර විය හැකි, එකී අරමුණු කෙරෙහි සැලකිය යුතු අනුහස පැතිර විය හැකි හෝ එකී අරමුණු මුදුන් පමුණුවා ගැනීමෙහි ලා වැදගත් වන ජනයා, කණ්ඩායම් හෝ ආයතනයන් ය.

[3] ආ. සං. බැං. 2000, *The Long-Term Strategic Framework of the Asian Development Bank (2001-2005);* මැනිලා.

[4] ආ. සං. බැං. 2004, *Knowledge Management in ADB,* මැනිලා.

[5] තොරතුරු ලබා ගැනීමට ඇති අයිතියෙහි වැදගත්කම වසර 50කට අධික කාලයක් තිස්සේ ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබ තිබේ. "තොරතුරු ලබා ගැනීමට ඇති නිදහස මූලික මානව හිමිකමක් වන අතර එය එක්සත් ජාතීන් විසින් අනුමත කරන ලද සියලු නිදහසෙහි උරගල වන්නේ ය" යි 1946 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය තීරණය කළේ ය. රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ පිළිගනු ලැබ තිබෙන අතර රටවල් සැලකිය යුතු සංඛ්‍යාවක තොරතුරු නීති (information laws) තුළට ඇතුළත් වේ. ආ. සං. බැංකුවේ සාමාජික රටවල් වැඩි ම සංඛ්‍යාවක් විසින් අත්සන් තබන ලද සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියෙහි 19 වැනි වගන්තියෙහි මෙය විස්තර සහිත ව දක්වා තිබේ. (වැඩි විස්තර සඳහා http://www.unhchr.ch/pdf/report.pdf බලන්න).

[6] වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල සන්නිවේදන හා තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධ සාකච්ඡාවක් 1 වැනි උප ග්‍රන්ථය තුළ ඇතුළත් වෙයි.

[7] ආ. සං. බැං. 1994, *Information Policy and Strategy,* සහ *Policy on Confidentiality and Disclosure of Information,* මැනිලා.

[8] වසර 20කට අධික කාලයක් තිස්සේ සංවර්ධනය වෙමින් පවතින හා සංක්‍රමණීය අවධියේ පසු වන රටවල් 78ක් අතර වර්ධනයේ වෙනස් ශීඝ්‍රතාවන් පැහැදිලි කිරීමට බහුගුණ විචල්‍යයන් පරීක්ෂා කළ අධ්‍යයනයකින් සොයා ගනු ලැබුවේ "ආර්ථික වර්ධනය ගැන අනාවැකි පළ කිරීමෙහි ලා ඉතා ම විශ්වාසවත් අන්දමින් වැදගත් වන තනි ලක්ෂණය වන්නේ තොරතුරු ලබා ගැනීමට ඇති අවස්ථාව බව ය." සීගල් ජෝශප්, 2001; *Democratization and Economic Growth : The contribution of Accountability Institution.*

[9] ෆවුලර්, ඇලන් 2001; *Enhancing Participation in Country Strategy and Program Planning,* මැනිලා, ආ. සං. බැං.

[10] ආ. සං. බැංකුවේ විශේෂ ව්‍යාපෘති පහසුකම් සලසන්නාගේ කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබ කලින් පැවති අධීක්ෂණ කාර්ය යටතේ භාර දෙන ලද පැමිණිලි ආ. සං. බැංකුවේ සහාය ලද ක්‍රියාකාරකම් ගැන තොරතුරු අනාවරණය කිරීමේ පවත්නා ඌනතාව පැහැදිලි ව ගෙන හැර දක්වා තිබේ.

[11] මාධ්‍ය හා වෙනත් මත පළ කරන නායකයන් තුළින් මහ ජනයා වෙත ළඟා වන තොරතුරු මත පළ කරන නායකයන්ගේ පෞද්ගලික හැඟීම් හා අදහස්වල බලපෑමට ලක් වන බැව් පිළිගැනේ.

[12] ආ. සං. බැං. දූරගාමී ක්‍රියාකාරකම් සොයා දැන ගැනීම හා සැලසුම්කරණය වැඩි දියුණු කිරීමට විද්‍යුත් බාහිර සිදු වීම් පිළිබඳ ලේඛනයක් දැනට වර්ධනය කරමින් තිබේ.

[13] ආ. සං. බැං. 1966, *The Agreement Establishing the Asian Development Bank,* මැනිලා : 39.1 වගන්තිය.

[14] ආ. සං. බැං. 2001, *Business Processes for the Reorganized ADB,* මැනිලා : 2 වැනි උප ග්‍රන්ථය : 2-4 දක්වා සහ 4 වැනි උප ග්‍රන්ථය : 2.

[15]පාරිසරික ඇගයීම් වාර්තා සැකසීම සම්බන්ධයෙන් ආ. සං. බැංකුවේ අවශ්‍යතා සඳහා බලන්න, ආ. සං. බැං. 2002, *Environment Policy*, මැනිලා.

[16] සන්නිවේදන සැලසුම්, අරමුණු ද භාෂාවන් ඇතුළු තොරතුරු ඉදිරිපත් කරන රූපාකාරයන් ද ක්‍රමවේදය ද තොරතුරු බෙදා හදා ගැනීම සඳහා කාල නියමයන් ද පාර්ශ්වකරුවන් හා අවධානය කේන්ද්‍රගත කළ යුතු ගැටලු ද පෙන්නුම් කරනු ඇත. ඒවාට ප්‍රතිචාර හා ආදානයන් ඒකාබද්ධ කිරීම හා එකී ආදානයන්ගේ ප්‍රයෝජන පිළිබඳ වාර්තාකරණය සඳහා වන ක්‍රියාදාමයක් ද ඇතුළත් වනු ඇත. සමහර සන්නිවේදන සැලසුම්වලට ව්‍යාපෘති තොරතුරු මධ්‍යස්ථාන සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය. අදාළ වන්නේ නම්, ව්‍යාපෘති යෝජනාවලට එබඳු මධ්‍යස්ථාන සඳහා විස්තරයක් හා මූල්‍ය සම්පාදන සැලැස්මක් ඇතුළත් වනු ඇත.

[17] ව්‍යාපෘති විෂය පථය තුළ ප්‍රධාන පෙළේ වෙනස්කම් ව්‍යාපෘති පරිපාලන උපදෙස්වල 5.04 වගන්තිය යටතේ පැන නඟියි.

[18] පරිසර ප්‍රතිපත්තියේ 63 වැනි ඡේදය බලන්න.

[19] මෙහෙයුම් අත්පොතෙහි (Operations Manual) එෆ් 2/බීපී වගන්තියේ 3 වැනි පාදීය සටහන බලන්න. මෙහෙයුම් අත්පොතෙහි එෆ් 2/බීපී වගන්තිය යටතේ අස්වේච්ඡාවෙන් යළි පදිංචි කර වීමට නියමිත බලපෑමට පාත්‍ර වූ පුද්ගලයන් ව්‍යාපෘතිය යටතේ බලපෑමට පාත්‍ර වූ සියලු ම ජනයාගේ උප කුලකයක් විය හැකි ය.

[20] සැලැස්ම හෝ ආකෘතිය ව්‍යාප්ත කරලීම විෂය සීමාව තුළ ඇති කරනු ලබන වෙනස්කම් මඟින් බලපෑමට පාත්‍ර වූ ජනයාට සීමා විය හැකි ව තිබේ.

[21] සැලැස්ම හෝ ආකෘතිය ව්‍යාප්ත කරලීම විෂය සීමාව තුළ ඇති කරනු ලබන වෙනස්කම් මඟින් බලපෑමට පාත්‍ර වූ ජනයාට සීමා විය හැකි ව තිබේ.

[22] අනාවරණය කිරීමට පක්ෂවාදී ප්‍රතිපත්තියෙහි පූර්වානුමිතීන්ට අනුකූල ව එබඳු ලේඛනයක් කවර අන්දමින් හෝ ඉවත් කිරීමක් නැති නම් රඳවා ගැනීමක් 126 හෝ 127 වැනි ඡේද තුළ ලැයිස්තුගත කර ඇති ව්‍යතිරේකයන් මත පදනම් විය යුත්තේ ය.

[23] ආ. සං. බැං. 1998, *Anticorruption*, මැනිලා.

[24] ආ. සං. බැං. 1998, *A Graduation Policy for the Bank's DMCs*, මැනිලා.

[25]ආ. සං. බැං. 2004, *Policy On Performance - Based Allocation for Asian Development Fund Resources*, මැනිලා.

[26] ආ. සං. බැං. 2003, *Review of the Inspection Function : Establishment of a New ADB Accountability Mechanism*, මැනිලා.

[27] අනුකූලතා සමාලෝචන මණ්ඩලය මඟින් අනාවරණය කරන ලද ලේඛන http://www.compliance.adb.org වෙබ් අඩවිය තුළ ස්ථාපනය කර තිබේ.

[28] ආ. සං. බැං. සෑම නිල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ම පිටපත් ඉදිරිපත් කරයි. මේවා ආ. සං. බැංකු ලේඛන රක්ෂාගාරයේ සංරක්ෂිත කෙරේ.

[29] උදාහරණයක් වශයෙන්, මහජන ආරක්ෂාව පිළිබඳ බරපතළ තත්වයක් හෝ පාරිසරික අවදානමක් එළිදරව් කෙරෙන තොරතුරු ඉල්ලා සිටීමක දී "මහජන උනන්දුව වැඩි වැදගත්කමක්" දැරිය හැකි වාතාවරණයක් උද්ගත වීමට ඉඩ තිබේ.

[30] දැනට, ආ. සං. බැංකුවේ දූත මණ්ඩල 20කින් පහක ජාතික නිලධාරියකු මට්ටමේ බාහිර සබඳතා නිලධාරීහු සිටිති (චීන මහජන සමූහාණ්ඩුව, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය හා පිලිපීනය).

[31] පිරිවැය ප්‍රතිසාධනය (recovery) සඳහා වන කාර්ය පටිපාටියක් මහජන තොරතුරු ප්‍රතිපත්තිය පිළිබඳ කාර්ය මණ්ඩල අත්පොතෙහි සවිස්තරාත්මක ව දක්වනු ලබන්නේ ය.

[32] එක් වෘත්තීය කාර්ය මණ්ඩලයක් හා ජාතික මට්ටමේ නිලධාරි තනතුරු 6ක් ආ. සං. බැංකුවේ 2005 වියදම් ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ ඇත.

[33] බාහිර සබඳතා කාර්ය මණ්ඩලය කෂකස්ථානය තුළ හා මධ්‍යම ආසියානු කලාපීය ආර්ථික සහයෝගිතාව තුළ මහජන සන්නිවේදනයන් ආවරණය කරනු ඇත.

[34] 30 වැනි පාදීය සටහන බලන්න.

[35] ආ. සං. බැං. 2003, *The Review of the Inspection Function : Establishment of a New ADB Accountability Mechanism*, මැයි 8, R79-03.

# 1 වැනි උප ග්‍රන්ථය

## වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල සන්නිවේදන හා තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රවණතා

### (අ) වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල බාහිර සබඳතා

1. මෑත වසරවල දී වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකු (බ. පා. සං. බැං.) ප්‍රගාමී දූරගාමී කටයුතු වර්ධනය කර තිබේ. මේ සඳහා ඒවායේ පාලක මණ්ඩලවල හා සුවිසල් කාර්ය මණ්ඩලවල කැපවීම ද මාධ්‍ය හා මහජන සබඳතා සඳහා පවතින මූල්‍යමය සම්පත් ද පිටු බල ලබා දුනි. වොෂිංටනය මූලස්ථානය කර ගත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකු සංවර්ධන ආයතන ගැන තොරතුරු සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලීමට ද පක්ෂවාදී රාජ්‍ය නො වන සංවිධාන කෙරෙන් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල මෙහෙයුම් ගැන එල්ල වන ඉහළ නඟිමින් තිබෙන විවේචන රැල්ලට හා ආධාර දෙන රටවල්වලින් ප්‍රදානය කෙරෙන සහනදායී අරමුදල් ලබා ගැනීම සඳහා වර්ධනය වෙමින් පවතින තරඟයට ද සෘජු ව ප්‍රතිචාර දැක්වීම තුළින් අර්ථහාරී පියවර ගෙන තිබේ.

2. බාහිර සබඳතා පිළිබඳ කටයුතුවල නිරත 250කගෙන් සමන්විත වෘත්තික කාර්ය මණ්ඩලයක් ලෝක බැංකුව සතු ව පවතී. එහි ක්ෂේත්‍ර නිලධාරීහු විශේෂයෙන් ආසියා හා පැසිෆික් කලාප තුළ මේ ක්ෂේත්‍රයෙහි සක්‍රිය ක්‍රියා කලාපයක් ඉටු කරති. ඇතැම් විට ආ. සං. බැංකුවේ සමීප තම සංසදකයා විය හැකි ව තිබෙන අන්තර් ඇමෙරිකානු සංවර්ධන බැංකුව (අ. ඇ. සං. බැං.) ද එහි බාහිර සබඳතා සඳහා වෙන් කර ඇති සම්පත් වැඩි කර තිබෙන අතර සැලකිය යුතු උපදේශන සම්පත් මඟින් අනුපූරණය කෙරුණු 45 දෙනෙකුන්ගෙන් පමණ සමන්විත වෘත්තික කාර්ය මණ්ඩලයක් සහිත අලුත් කාර්ය මණ්ඩල බළ ඇණියක් එය සතු ව තිබේ. විවේචනාත්මක වාර්තාවකට ප්‍රතිචාර වශයෙන්, ජා. මූ. අ. 2000 වසරේ 70ක් ව සිටි බාහිර සබඳතා කටයුතුවල නිරත ව සිටින වෘත්තික කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 2004 අවසානය වන විට 90 දක්වා වැඩි කර තිබේ. ලෝක බැංකුව, ජා. මූ. අරමුදල, හා අ. ඇ. සං. බැං. යන මේ සියලු ම ආයතනවලට යුරෝපය තුළ මාධ්‍ය හා මහජන සබඳතා තුළ සක්‍රිය ව නිරත ව සිටින කාර්යාල තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඒවා මීට දශක දෙකකට ඉහත ප්‍රකට වී තිබුණාට වඩා හොඳින් අද ප්‍රකට ව පවතී.

### (ආ) වෙනත් බහු පාර්ශ්වීය සංවර්ධන බැංකුවල තොරතුරු අනාවරණය

3. තොරතුරු අනාවරණය කිරීම පිළිබඳ ක්ෂේත්‍රයේ දී බ. පා. සං. බැංකු තුළ තොරතුරු ලබා ගැනීම සඳහා මහජනයාට මාර්ග විවෘත වීම දැන් කාලීන වාද විෂයක් බවට පත් ව තිබේ. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් තුළ බ. පා. සං. බැංකුවල සංජානිත බලපෑම මීට හේතු වී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන නිකුත් කළ *2002 මානව සංවර්ධන වාර්තාව (Human Development Report)* ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල "පාරදෘශ්‍යතාව සම්බන්ධයෙන් බරපතළ හිඩැස්" පවතින බැව් තිරසර ලෙස ප්‍රකාශ කළේ ය. මෙහි ලා ලෝක බැංකුවේ හා ජා. මූ. අරමුදලේ විධායක මණ්ඩලවල වාර්තා හෝ ඡන්ද විමසීම් පිළිබඳ වාර්තා නො මැති වීම විශේෂ අවධානයට ලක් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, "සාමාජික රටවල පුරවැසියන්ට (හෝ උනන්දුවත් විදේශිකයන්ට) විධායක අධ්‍යක්ෂවරුන් හෝ තමන්ගේ ආණ්ඩු ජා. මූ. අ. හෝ ලෝක බැංකුව තුළ අනුගමනය කරන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වග උත්තර සැපයීමට බැඳ තබන්ට නො හැකි වී ඇත" යි *මානව සංවර්ධන වාර්තාව* නිගමනය කළේ ය.[1]

4. ප්‍රථම විධිමත් බ. පා. සං. බැංකු තොරතුරු හා අනාවරණය කිරීමේ ප්‍රතිපත්ති - 1990 ගණන් ආරම්භයේ වර්ධනය කරන ලදි - ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධ වැඩි වැඩියෙන් තොරතුරු මහජනයා වෙත නිකුත් කිරීම දිරි ගැන්වී ය. කෙසේ වෙතත්, තොරතුරු නිකුත් කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු සීමා හා තහංචි පවතී. එමතු නො ව, ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශ තුළ ජීවත් වන ජනතාවට ව්‍යාපෘති සැලසුම හා එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අර්ථවත් සම්ප්‍රදානයන් කිරීමට හැකි කර වීම සඳහා යෝජිත ක්‍රියාකාරකම් ගැන තොරතුරු සපයනු ලබන බවට ප්‍රතිපත්ති මඟින් කවර හෝ සහතිකයක් නො සපයයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, බ. පා. සං. බැංකුවල අනාවරණය කිරීමේ ප්‍රතිපත්ති සවිමත් කිරීමට කෙරෙන ප්‍රසිද්ධ ඇරයුම් එකී ප්‍රතිපත්ති තෝරා ගනු ලැබූ වහා ම අසන්ට ලැබිණි. මෑත වර්ෂවල මේ ඇරයුම් වැඩි වී ඇති අතර සමහර ආණ්ඩු විසින් එය ප්‍රතිරාව නංවන ලදි.

5. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලු ම බ. පා. සං. බැංකු තමන්ගේ තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්ති සමාලෝචනය ද විස්තාරණය ද කර තිබේ; නැත හොත්, සක්‍රිය ව එසේ කරමින් සිටියි. මේ නව ප්‍රතිපත්ති බොහෝ පොදු ගුණාංග හා ලක්ෂණ බෙදා හදා ගනියි. යෝජිත මෙන් ම සම්මත කර ගැනුණු සියලු ම නව ප්‍රතිපත්ති මෙහෙයුම් සම්බන්ධ හා වෙනත් තොරතුරු සම්පාදනයෙහි ලා වඩාත් ප්‍රගාමී වෙයි. ඒවා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලබන තොරතුරුවල විෂය සීමාව හා මාදිලිය ප්‍රසාරණය කරන අතර සාමාන්‍යයෙන්, තොරතුරු පතුරුවා හැරීමේ වැදගත් වාහකයන් ලෙස නිල වෙබ් අඩවි ඉස්මතු කර දක්වයි. සමහර තොරතුරු මහජනයාට ලබා ගැනීමට සැලැස්වීමේ දී ඒවාට ඒ සමාන ම සීමා කිරීම්වලට මුහුණ පෑමට සිදු වේ. නීතිමය උපදෙස්, වෙනත් පාර්ශ්වයක් විසින් සපයනු ලබන තොරතුරු, රහසිගත ව්‍යාපාරික තොරතුරු, හා බ. පා. සං. බැංකුවක් හා සාමාජික රටවල ආණ්ඩු අතර සම්බන්ධතාවන්ට නිශේධාත්මක ව බල පෑ හැකි තොරතුරු බඳු වරප්‍රසාදිත තොරතුරු මීට ඇතුළත් වේ.

6. එක් තනි බ. පා. සං. බැංකුවක ප්‍රතිපත්තිවල තෝරා ගැනුණු ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් වේ.

### 1. අප්‍රිකානු සංවර්ධන බැංකුව

7. 1997 දෙසැම්බරයේ අප්‍රිකානු සංවර්ධන බැංකුව *තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්ති පත්‍රිකාවක්* අනුමත කළේ ය. 2003 දී ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනයක් ආරම්භ කළ අප්‍රිකානු සංවර්ධන බැංකුව 2004 මාර්තු මාසයේ දී වඩා පුළුල් පාරදෘශ්‍යතාවක් අන්තර්ගත කර ගත් නව ප්‍රතිපත්තියක් සම්මත කර ගත්තේ ය.

8. උදාහරණයක් වශයෙන්, 2004 ප්‍රතිපත්තිය, කෙටුම්පත් කරන ලද මෙහෙයුම් ප්‍රතිපත්ති ලේඛන හා කෙටුම්පත් කරන ලද රාජ්‍ය මූලෝපාය පිළිබඳ ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කිරීමට අඩු තරමින් දින 50කට කලින් අනාවරණය කරනු ලබන්නේ ය. ඒ උපදේශනය හා පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපෘතිය අනුමත කිරීමෙන් පසු ව්‍යාපෘතියක ඇති කරනු ලබන කවර හෝ සැලකිය යුතු වෙනස්කම් පිළිබඳ සංක්ෂේපිත ලේඛනගත කිරීමක් සමඟ රාජ්‍ය ක්‍රියාකාරිත්ව ඇගයීම් අනාවරණය කරනු ලැබේ.

9. නව ප්‍රතිපත්තිය වාර්ෂික රැස්වීම්වල ලුහුඬු වාර්තා අනාවරණය කිරීමට ප්‍රතිපාදන සපයන අතර උනන්දුවත් පාර්ශ්වයන් විසින් ඉල්ලුම් කරන ලද විටෙක ව්‍යාපෘතියක් ගැන තාක්ෂණික තොරතුරු සැපයීමට රටේ අධ්‍යක්ෂවරුන්ට හා ක්ෂේත්‍ර දෙපාර්තමේන්තුවලට බලය ලබා දෙයි.

10. ප්‍රතිශෝධිත තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය අනුමත කිරීමේ දී සමාන ආයතනයන්හි ඉහළ ම භාවිතයන් සංයුක්ත කර ගැනීමට හැකි වන පරිද්දෙන්

ප්‍රතිපත්තිය යාවත්කාල කළ යුතු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය නියම කළේ ය. විශේෂයෙන් ම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා අනාවරණය කිරීම සම්බන්ධයෙන් ඒ සමාන ම ආයතන තුළ වර්ධනයන් අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කළේ ය.

### 2. ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වන යුරෝපීය බැංකුව

11. ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වන යුරෝපීය බැංකුව (ප්‍ර. සං. යු. බැං.) 2000 ජූනි මාසයේ දී *මහජන තොරතුරු ප්‍රතිපත්තියක්* අනුමත කළේ ය. ඊ ළඟ වසරේ දී, ප්‍ර. සං. යු. බැං. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූලික සමාලෝචනයක් මෙහෙය වී ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය පූර්ණ පරිමාණ සමාලෝචනයක් පවත්වන ලෙස ඉල්ලා සිටියේ ය. 2003 අප්‍රේල් 29 වැනි දින සංශෝධිත ප්‍රතිපත්තියක් සම්මත කර ගැනීමෙන් සමාලෝචනය කූටප්‍රාප්ත විය.

12. ව්‍යාපෘති ආකෘති (ව්‍යාපෘති පිළිබඳ සංක්ෂේපිත ලේඛන) - පුද්ගලික අංශයේ ව්‍යාපෘති සඳහා - අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීමට දින 30කට කලින් ද - රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සඳහා - අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීමට දින 60කට කලින් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතියෙන් පසු ව්‍යාපෘති ආකෘති වෙබ් අඩවි තුළ යාවත්කාල කර තබනු ලැබේ. පුද්ගලික අංශයේ මෙහෙයුම් පිළිබඳ ඇගයීම් ද වෙබ් අඩවි තුළ ඇතුළත් කරනු ලැබේ.

13. නව ප්‍රතිපත්තිය යටතේ රාෂ්ට්‍රීය මූලෝපායන් සූදානම් කිරීම සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මහජනයාට ආරාධනා කරනු ලැබේ. එසේ කිරීමට අඩු තරමින් සති 8ක් දෙනු ලැබේ. ලැබුණු අදහස් සාරාංශගත කෙරුණු ඇබැඳියක් (addendum) හා එකී අදහස්වලට රට තුළ ක්‍රියාත්මක වන කණ්ඩායමෙන් ලද ප්‍රතිචාර අදාළ රටේ මූලෝපාය පිළිබඳ වැඩමුලුව තුළ සලකා බැලීමට පෙරාතුව අධ්‍යක්ෂවරුන්ට මෙන් ම විධායක කමිටුවට සැපයිය යුතු ව තිබේ. රාෂ්ට්‍රීය මූලෝපායට අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලැබීමෙන් පසු ඇබැඳිය ප්‍ර. සං. යු. බැංකු වෙබ් අඩවිය තුළට ඇතුළත් කරනු ලබන්නේ ය. ප්‍රතිපත්තිය ක්ෂේත්‍ර (section) ප්‍රතිපත්ති කෙටුම්පත මහජන අදහස් ලබා ගැනීම සඳහා බැංකු වෙබ් අඩවියට ඇතුළත් කරනු ලබන බව ද නිශ්චය කොට දක්වයි. එසේ සිදු කරනු ලබන්නේ පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවෙන් අඩු තරමින් දින 45කට පසු අධ්‍යක්ෂවරුන් විසිනි.

14. 2003 වර්ෂය සඳහා නිකුත් කර තිබෙන ප්‍රතිපත්තිය ද නියාමක පදනමක් මත අනාගතයේ අනුමත කරනු ලබන රාෂ්ට්‍රීය මූලෝපායන් දේශීය භාෂාවන්ට පරිවර්තනය කරන ලෙස ඉල්ලා සිටියි. ඊට අතිරේක ව, බැංකුව ප්‍රධාන බැංකු ප්‍රතිපත්ති තුනක් (අනාවරණය කිරීම්, විමර්ශන හා පරිසරය පිළිබඳ) පරිවර්තනය කරන බව සඳහන් කරයි.

15. ප්‍ර. සං. යු. බැං. වූ කලී සිය අනාවරණ කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාවක් තමන්ගේ වෙබ් අඩවිය තුළට ඇතුළත් කරන එක ම බ. පා. සං. බැං. වේ.

### 3. යුරෝපීය ආයෝජන බැංකුව

16. 2002 ඔක්තෝබර් මාසයේ යුරෝපීය ආයෝජන බැංකුව (යු. ආ. බැං.) ලුහුඬු තොරතුරු ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නිකුත් කළේ ය. මේ සමඟ අනාවරණය කරන ලද ප්‍රධාන තොරතුරු විස්තර කර දක්වන විස්තර පත්‍රිකාවක් (*යු. ආ. බැං. සන්නිවේදනය කරන්නේ කෙසේ ද - පොදු සමාලෝචනයක් How EIB. Communicates - An Overview*) හා මූලික වශයෙන් පෙරවදනකින් ද විෂය පථය හා වදන් කෝෂය පිළිබඳ අර්ථ දැක්වීමකින් ද අනාවරණය කිරීම්වලට අදාළ

ව්‍යාතිරේකයකින් ද සමන්විත මහජනයාට *ලේඛන ලබා ගැනීම සම්බන්ධ නීති* - *Rules on Public Access to Document* සංග්‍රහයක් ද නිකුත් කෙරිණි.

17. යු. ආ. බැං. "අනාවරණය කිරීම පිළිබඳ පූර්වානුමිතිය" නම් වූ වගන්තිය සම්මත කර නො මැති නමුදු *නීති* "එය සක්‍රිය තොරතුරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට කැප වන අතර මහජනයාට එහි මූලෝපාය, ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් හා භාවිතයන් පිළිබඳ තොරතුරු සැපයීමෙහි ලා එහි ප්‍රයත්නයන් දිගට ම පවත්වා ගෙන යාමට හා ශක්තිමත් කිරීමට ක්‍රියා කරනු ඇත" යි සඳහන් කරයි. යු. ආ. බැං. "යෝග්‍ය තන්හි හා යෝග්‍ය තාක් දුරට එහි සම ගිවිසුම් පාර්ශ්වයන් සමඟ ඇති කර ගන්නා එකඟත්වයක් තුළින් නිම කරන ලද තනි මෙහෙයුම් පිළිබඳ මූලික තොරතුරු නිකුත් කිරීම අඛණ්ඩ ව සිදු කරනු ඇත" යි ද එකී *නීති* නිශ්චය කොට දක්වයි. යුරෝපීය සංගමයේ මූල්‍ය සම්පාදන ආයතනය ලෙස යු. ආ. බැං. එහි තොරතුරු ප්‍රතිපත්තිය "පාරදෘශ්‍යතාව හා තොරතුරු ප්‍රසිද්ධියේ අනාවරණය කිරීම හා වෙනත් නීති සම්බන්ධ අදාළ යුරෝපීය සංගම් ප්‍රතිපත්ති" මත පදනම් කරන බව *තොරතුරු ප්‍රතිපත්ති ප්‍රකාශනය* තව දුරටත් සඳහන් කරයි.

18. ව්‍යවස්ථායීය ලේඛන යුරෝපීය සංගමයේ සියලු ම රාජ්‍ය භාෂාවන්ගෙන් ලබා ගත හැකි අතර යුරෝපීය සංගමයේ භාෂාවන්ගෙන් හා/හෝ යුරෝපීය සංගමයට අයත් නො වන භාෂාවන්ගෙන් ලියැවී ඇති ප්‍රකාශන ලබා ගැනීමට ඇති හැකියාව බැංකුවේ මෙහෙයුම් අරමුණු මඟින් නිර්ණය කරනු ලබන බව *තොරතුරු ප්‍රතිපත්ති ප්‍රකාශනය* පෙන්වා දෙයි. වෙබ් අඩවි ඉංග්‍රීසි, ප්‍රංශ හා ජර්මන් භාෂාවලින් දිස් වෙයි.

19. ඓතිහාසික ලේඛන සැකසීම සම්බන්ධයෙන් *නීති* නිශ්චය කර දක්වන්නේ ලේඛනවල රහස්‍ය භාවය සාමාන්‍යයෙන් වසර 30කට පසු අවසන් වන බව ය.

20. යුරෝපා සංගමය සම්බන්ධ ප්‍රඥප්තියට අනුකූල ව මහජනයාට තොරතුරු අනාවරණය කිරීම ගැන සිය පැමිණිලි යුරෝපා ඔම්බුඩ්ස්මාන්වරයා (දුක් ගන්නාරාල) වෙත ඉදිරිපත් කළ හැකි බව *තොරතුරු ප්‍රතිපත්ති ප්‍රකාශනය* ඉතා පැහැදිලි ව පිළිගනියි.

21. 2004 ජූනි මාසයේ දී යු. ආ. බැං. *තොරතුරු ප්‍රතිපත්ති ප්‍රකාශය* විධිමත් ව ප්‍රතිශෝධනය කිරීමකින් තොර ව ආයතනයේ අනාවරණය කිරීම් පිළිබඳ භාවිතයන් තුළ ඇති කළ නිශ්චිත වෙනස්කම් කීපයක් අනුමත කළේ ය. උදාහරණයක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා විගණන කමිටුවේ පාරිතෝෂික හා සාමූහික වගකීම පිළිබඳ වාර්තාවක් පරිදි ම සංවේදී තනතුරුවලට අදාළ විනය නීති සංග්‍රහය ද දැන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වා තිබේ.

### 4. අන්තර් - ඇමෙරිකානු සංවර්ධන බැංකුව

22. 1994 ඔක්තෝබර් මාසයේ දී අ. ඇ. සං. බැං. එහි ප්‍රථම තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය අනුමත කර 1994 නොවැම්බර් මාසයේ දී අ. ඇ. සං. බැංකුවේ මෙහෙයුම් ප්‍රතිපත්ති අත්පොතට ( OP-102) අන්තර්ගත කළේ ය. ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වන ලද ලේඛනවලට එක් කරනු ලබමින් තිබුණු ලේඛන පිළිබිඹු කිරීමට එය 1998 පෙබරවාරි මාසයේ දී හා නැවතත් 2001 අප්‍රේල් මාසයේ දී සංශෝධනය කරන ලදි. 2002 දී අ. ඇ. සං. බැං. ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනයක් ආරම්භ කළේ ය. එය කූටප්‍රාප්තියට පත් වූයේ 2003 නොවැම්බර් මාසයේ දී ප්‍රතිශෝධිත හා යාවත්කාල කෙරුණු ලේඛනයක් එළි දැක්වීම හැටියට ය.

23. නව ප්‍රතිපත්තිය බැංකු ලේඛන රක්ෂාගාරයට වඩා ක්‍රමානුකූල හා කඩිනම් ප්‍රවේශ මාර්ගයක් හඳුන්වා දෙයි. ඓතිහාසික තොරතුරු ඒවා නිකුත් කිරීමෙන් වසර 20ක් ගත වූ කල්හි ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලැබේ. නිකුත් කරන අවස්ථාවේ දී

ප්‍රසිද්ධියේ ලබා ගැනීමට නො තිබුණු එහෙත් ප්‍රතිපත්තිය යටතේ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ව තිබුණු ඓතිහාසික තොරතුරු ව්‍යාපෘතිය/වැඩසටහන සමාප්ත කරනු ලැබ තිබෙන හා රජය එහි අනුමතිය දෙනු ලැබ තිබෙන කල්හි නිකුතුවෙන් පසු ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ව තිබේ.

24. ඊට අතිරේක ව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික හා තෙමස් වැඩසටහන දැන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලැබේ. මෙහෙයුම් හා ක්ෂේත්‍ර ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා සාකච්ඡාවන් ගැන අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ සභාපතිවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන වාර්තා ද ක්ෂේත්‍ර මූලෝපායන් ද අ. ඇ. සං. බැංකුවේ රාෂ්ට්‍රීය මූලෝපායන් ද බරපතළ ලෙස ණයගැති ව සිටින දුගී රටවල් සම්බන්ධ ලේඛන ද දිළිඳුකම පහත හෙළීමේ මූලෝපාය පිළිබඳ පත්‍රිකා හා අන්තර් කාලීන දුගීකම පහත හෙළීමේ මූලෝපාය පිළිබඳ පත්‍රිකා ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලැබේ. ප්‍රතිපත්තිය අ. ඇ. සං. බැංකුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා (අනුමත කරනු ලැබීමෙන් දින 60ක් ඇතුළත) නිකුත් කිරීමට බැඳී සිටින ප්‍රථම බ. පා. සං. බැංකුව බවට පත් කරයි.

25. අ. ඇ. සං. බැංකුව එහි ප්‍රතිපත්තිය තුළ ඇතුළත් ව නො මැති වුව ද සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලේඛන ඉංග්‍රීසි හා ස්පාඤ්ඤ යන භාෂා දෙකින් ම ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වයි. විධායක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන ලේඛන අ. ඇ. සං. බැංකුවේ නිල භාෂා හතර වන ඉංග්‍රීසි, ප්‍රන්ස, පෘතුගීසි හා ස්පාඤ්ඤ යන සෑම බසකින් ම ප්‍රසිද්ධියේ ලබා ගත හැකි විය යුතු ය.

### 5. ලෝක බැංකු කණ්ඩායම

#### (අ) ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව

26. 1994 ජූලි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (ජා. මූ. සං.) එහි ප්‍රථම අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය සම්මත කළේ ය. ප්‍රතිශෝධිත ප්‍රතිපත්තිය 1996 ජූලි මාසයේ දී ක්‍රියාත්මක භාවයට පත් වූ අතර 1998 ජූලි මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිශෝධිත අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක් තුළ වැඩි දුර පැහැදිලි කිරීම් හා ප්‍රතිශෝධන අනුමත කළේ ය. වෙනත් මූල්‍ය ආයතනවල ප්‍රතිපත්ති මෙන් ම එය ආරම්භ කරන ලද්දේ "අනාවරණය කිරීම්වලට පක්ෂපාතී පූර්වානුමිතියක්" මත ය. තව ද එය ඒ සමාන ම අත්හිටුවන ක්‍රියා පටිපාටීන් (Caveats) ද අන්තර්ගත කර ගනියි.

27. පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල ආකෘති (ලුහුඬු ව්‍යාපෘති තොරතුරු ලේඛන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලැබීමට අඩු තරමින් දින 30කට කලින් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලැබෙන තෙක් ඒවා වෙබ් අඩවිය තුළ යාවත්කාල කර තබනු ලැබේ. ව්‍යාපෘතියේ බලපෑම් පිළිබඳ පාරිසරික හා සමාජීය තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය ලැබීමට අවම වශයෙන් දින 30කට හෝ 60කට මත්තෙන් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වනු ලැබේ. මෙය ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජීය අවදානම පිළිබඳ නිරූපාධිකය (category) මත රඳා පවතියි.

28. ජා. මූ. සං. එය පුද්ගලික අංශය තුළ සිදු කරන මෙහෙයුම් සම්බන්ධ ඇගයීම් ලේඛන බොහෝ සංඛ්‍යාවක් ප්‍රසිද්ධියට පත් කරයි. ජා. මූ. සං. අතීතයේ කළ ආයෝජනවලින් උගත් පාඩම් (ක්ෂේත්‍රය, විෂය හා රට අනුව කාණ්ඩගත කර ඇත) ද මීට ඇතුළත් වෙයි. ජා. මූ. සං. විශේෂ ඇගයුම් අධ්‍යයනයන් ද විශේෂ අධ්‍යයනයන්ගේ සාරාංශයන් හා වාර්ෂික සමාලෝචනයන් ද ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වයි.

29. 2004 දී ජා. මූ. සං. එහි අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනයක් ආරම්භ කළේ ය. ආරම්භයක් වශයෙන්, වෙබ් අඩවි පදනම් කර ගැනුණු

උපදේශනයන් හා සේවා දායක සමීක්ෂණ වටයක් පැවැත්වීමෙන් පසු දැන් එය 2004 අගෝස්තු 16 වැනි දින ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වන ලද උපදේශන පත්‍රිකාවක් සම්බන්ධයෙන් ආදානයන් කැඳවා ඇත. ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ප්‍රතිශෝධිත කෙටුම්පතක් 2004 නොවැම්බර් මාසයේ දී ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්වී ය.

30. ප්‍රතිපත්ති රාමුව පිළිබඳ කෙටුම්පත ජා. මූ. සංස්ථාවේ සේවාදායකයන් ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වූ ජනයා වෙත ඇති කෙරෙන පාරිසරික හා සමාජීය බලපෑම් හැකි තරම් කල් ඇති ව අනාවරණය කළ යුතු යැයි ද ඔවුන් ව්‍යාපෘතිවල සමාජීය හා පාරිසරික බලපෑම් ශමනය කිරීමේ ක්‍රියාමාර්ගික සැලසුම් ගැන අධීක්ෂණය කොට ප්‍රසිද්ධියේ වාර්තා කළ යුතු යැයි ද යෝජනා කරයි. ජා. මූ. සං. මේ සැලසුම් එහි අනාවරණය කිරීමේ මාර්ග තුළින් ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ද සලස්වනු ඇත. යෝජිත ව්‍යාපෘතිවලින් අපේක්ෂිත සංවර්ධන බලපෑම් සම්බන්ධයෙන් හා පශ්චාත් සමාහාර (ex-post aggregate) පදනමක් මත ක්‍රමානුකූල, සර්වග්‍රාහී හා සංසන්දනාත්මක ආකාරයකින් ජා. මූ. සංස්ථාවේ ආයෝජනවල වාර්ෂික සංවර්ධන බලපෑම් සම්බන්ධයෙන් ජා. මූ. සං. ප්‍රසිද්ධියේ වාර්තා කළ යුතු යැයි ද කෙටුම්පත යෝජනා කරයි.

31. ප්‍රසිද්ධියේ අනාවරණය කිරීමට නො හැකි තරම් සංවේදී තොරතුරු සංස්කරණය කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සැලැස්විය යුතු ව ඇතැයි ද ප්‍රතිපත්ති රාමුව පිළිබඳ කෙටුම්පත යෝජනා කරයි.

32. 2005 තුන් වැනි කාර්තුව අතර තුර කාල පරිච්ඡේදයේ දී නව ප්‍රතිපත්තියක් ජා. මූ. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ය.

### (ආ) බහු පාර්ශ්වික ආයෝජන ආරක්ෂණ ඒජන්සිය

33. බහු පාර්ශ්වික ආයෝජන ආරක්ෂණ ඒජන්සිය (බ. ආ. ආ. ඒ) තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යයි. එය එහි අනෙක් කාර්යන් අතර ආරක්ෂණය කරන ලද ව්‍යාපෘති පිළිබඳ ලුහුඬු විස්තර සටහනක් සපයන ත්‍රෛමාසික වාර්තා (මෙයට ආයෝජකයාගේ නම හා රට, සත්කාරක රටේ අනන්‍යතාව, ආයෝජනය කරනු ලබන මුදල් ප්‍රමාණය හා ආරක්ෂණයේ වටිනාකම හා ආවරණිත වපසරිය බඳු විස්තර ඇතුළත් වෙයි) ප්‍රසිද්ධ කිරීම අවශ්‍ය ය.

34. බ. ආ. ආ. ඒජන්සියේ ආරක්ෂණය පිළිබඳ සම්මත ගිවිසුම් (මේවා ව්‍යාපෘති - විශේෂිත ගිවිසුම් කෙටුම්පත් කිරීම සඳහා පදනම ලෙස භාවිත කරනු ලැබේ) ඉල්ලුම්කරුවන්ට හා පොදු මහජනතාවට ලබා ගත හැකි ය. තව ද, යෝජිත ආයෝජනයක් සඳහා වාරික පිරිවැය ඇස්තමේන්තු කිරීමට විභවාත්මක (potential) ඉල්ලුම්කරුවන්ට සහාය වීම සඳහා බ. ආ. ආ. ඒ. මූලික වාරික මිල ගණන් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

35. බ. ආ. ආ. ඒජන්සිය ජා. මූ. සංස්ථාවේ අනාවරණ ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනය සමීප ව අධීක්ෂණය කරමින් සිටියි. තව ද, එය ජා. මූ. සං. එහි ක්‍රියාදාමය (2005 දී) සමාප්ත කළ කල්හි තමන්ගේ ම ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

### (ඇ) ලෝක බැංකුව

36. ලෝක බැංකුව එහි මෙහෙයුම් පිළිබඳ තොරතුරු කරා මහජනයාට ළඟා වීමට ඇති අවස්ථා වැඩි කිරීමට අඛණ්ඩ ව ක්‍රියා කරයි: එය තෝරා ගත් රටවල්වල ලබා ගත හැකි ලේඛනවල වපසරිය පුළුල් කිරීමට නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර මහජන තොරතුරු මධ්‍යස්ථාන සම්බන්ධ කෙරෙන ගෝලීය ජාලයක් ගොඩ නැඟීමට සැලකිය යුතු මුදලක් වෙන් කර තිබේ. ඊට අමතර ව, එය පරිවර්තන

කටයුතු වැඩි කිරීමට සහාය දීම් වස් පාදක ව්‍යුහයක් සම්මත කර තිබෙන අතර තොරතුරු අනාවරණය ගැන ලැබෙන මහජන පැමිණිලිවලට ආමන්ත්‍රණය කිරීමට යන්ත්‍රණයක් පිහිටුවීමට සාකච්ඡා ආරම්භ කර තිබේ.

37. 1993 අගෝස්තු මාසයේ දී ලෝක බැංකුව තොරතුරු අනාවරණය සම්බන්ධ ප්‍රතිපත්තියක් අනුමත කළ ප්‍රථම බ. පා. සං. බැං. බවට පත් විය. 1995 හා 1997 සිදු කෙරුණු කාර්ය මණ්ඩල සමාලෝචනයන්ගෙන් පසු ව හා ඊ ළඟට එළඹි වසරවල් තුළ දී ප්‍රසිද්ධියේ ලබා ගැනීමට සලස්වන ලද ලේඛන ලැයිස්තුවට අතිරේක ලේඛන ඇතුළත් කෙරිණි. 2000 හා 2001 අතර තුර කාලයේ දී පවත්වනු ලැබූ සර්වග්‍රාහී (comprehensive) සමාලෝචනයක් 2001 සැප්තැම්බර් මාසයේ දී ප්‍රසාරිත අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කිරීමට මඟ පෑදී ය. ලෝක බැංකුවේ අනාවරණ ප්‍රතිපත්තිය 2002 දී ක්‍රියාත්මක වන්ට පටන් ගත්තේ ය.

38. අනෙක් ඒවා අතර, නව ප්‍රතිපත්තිය පිළිසැකසුම් ණය දීමේ මෙහෙයුම්වලට හා රාෂ්ට්‍රීය ආධාර මූලෝපායන් හා ක්ෂේත්‍ර මූලෝපායන් පිළිබඳ පත්‍රිකා අළලා කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවන් ගැන සභාපතිවරයාගේ සමාප්ත සටහන්වලට සම්බන්ධිත ලේඛන අනාවරණය හඳුන්වා දුනි. නව ප්‍රතිපත්තිය බැංකු ලේඛන රක්ෂාගාරය කරා ප්‍රවේශ වීමේ ක්‍රමානුකූල හා කඩිනම් ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක කළේ ය. එහි ප්‍රතිපත්තිය තුළ සඳහන් කර නො මැති නමුදු, ලෝක බැංකුව අපලේඛනගත ව්‍යාපාරික ආයතනවල නම් ප්‍රසිද්ධියට පත් කරයි.

39. ලෝක බැංකුව පාරිසරික ඇගයීම්, ස්වදේශික ජනතාවන් සඳහා වන සැලසුම් හා පාදක ව්‍යුහයන් ද යළි පදිංචි කර වීමේ සැලසුම් ද ව්‍යාපෘතිවල බලපෑමට පාත්‍ර වූ ජනයා වෙත ඔවුන්ට වටහා ගත හැකි රූපාකාරයකින්, විලාසයකින් හා භාෂාවකින් ලබා ගැනීමට සැලැස්වීම අවශ්‍ය ය. සියලු ම ණය දීමේ මෙහෙයුම් සඳහා සූදානම් කරනු ලබන ව්‍යාපෘති තොරතුරු ලේඛනය ව්‍යාපෘති සූදානම් කිරීමට පිටුබල සපයන තථ්‍ය තාක්ෂණික ලේඛන ලැයිස්තුගත කිරීම අවශ්‍ය ය.

40. 2001 දී ප්‍රතිපත්තිය අනුමත කිරීමත් සමඟ ලෝක බැංකුව බලපෑමට පාත්‍ර වූ ජනයා වෙත එහි සමාජීය කැප වීම තිර කිරීමට පරිවර්තන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා විකල්ප මාර්ග සෙවීමට ද මහජන තොරතුරු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීමට හා ප්‍රතිපත්තිය ව්‍යාප්ත කිරීමෙහි හා එහි සමාජීය කැප වීමට අදාළ මූලිකාංග සම්බන්ධයෙන් සන්නිවේදන විශේෂඥයන් වඩාත් පලදායී ව සහභාගී කරවා ගැනීමට ද තව දුරටත් කටයුතු කිරීමට අනුමතිය ලබා දුන්නේ ය. 2001 වසරේ සිට ලෝක බැංකුව එය සතු ව තිබෙන මහජන තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ඒවායේ ධාරිතාව වැඩි කර තිබෙන අතර රාෂ්ට්‍රීය ආධාර මූලෝපායන් ද දිළිඳුකම පහත හෙළීමේ මූලෝපාය පිළිබඳ පත්‍රිකා හා ව්‍යාපෘති ද සැකසීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අතිරේක තොරතුරු සැපයීමේ මාර්ග ගවේෂණය කිරීමට උනන්දුවත් සාමාජික රටවල් සමඟ නියාමක වැඩසටහනක් දියත් කර තිබේ.

41. 2003 ජූලි මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය මහජන තොරතුරු මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමට අනුමතිය දුන් අතර ඒ කාර්යය සඳහා ඩොලර් මිලියන ගණනක මුදල් ප්‍රතිපාදන සපයමින් සිටී. ලෝක බැංකුව දැන් රාෂ්ට්‍රීය කාර්යාල මහජන තොරතුරු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය, අනාවරණය කිරීම් සම්බන්ධ අභ්‍යන්තර විශේෂඥයන් ලෙස සේවය කිරීමටත් දේශීය භාෂාවන්ගෙන් ලේඛන සම්පාදනය දියුණු කිරීමටත් පරිවර්තන කටයුතු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලවලට උපදෙස් දීමටත් මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත්කම වර්ධනය කිරීමට හා ආයතනය ඇතුළත හා පිටත හවුල් ව්‍යාපාර ව්‍යාප්ත කිරීම සඳහා පහසුකම් සැලසීමටත් පුහුණු කරමින් සිටියි.

42. තව ද, ලෝක බැංකුව 2003 ජූලි මාසයේ දී ලේඛන පරිවර්තනය කිරීමේ පාදක ව්‍යුහයක් සම්මත කළේ ය. පරිවර්තන කටයුතු පිළිබඳ තීරණ ගැනීම සම්බන්ධ වගකීම ලේඛනය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් ("ව්‍යාපාරික අනුග්‍රාහකයන්") වෙත පැවරී තිබේ. ව්‍යාපාරික අවශ්‍යතා මත රැඳෙමින් ඔවුහු

පළල් ම, අදාළ ප්‍රේක්ෂක පිරිස් වෙත තමන්ට ළඟා වීමට ඉඩ සැලසෙන භාෂා ප්‍රවේශයක් තෝරා ගනු ඇත්තාහ.

43. තොරතුරු ලබා ගැනීමේ මාර්ග අහිමි කරනු ලැබ තිබෙන පුද්ගලයන්ට උපයෝජන යන්ත්‍රණයක් නිර්මාණය කිරීමට ලෝක බැංකුවේ මහජන තොරතුරු මධ්‍යස්ථාන ඒකකයට බලය පවරා තිබේ. මහජන තොරතුරු මධ්‍යස්ථාන ඒකකය නුදුරු අනාගතයේ දී මේ ගැටලුව ගැන ගවේෂණය කිරීමට ලෝක බැංකු දෙපාර්තමේන්තු හා රාජ්‍ය නො වන සංවිධාන එක්තැන් කිරීමට අභිප්‍රා කරයි.

44. 2004 දී නිස්සාරක (extractive) කර්මාන්ත ඇගයීම හා සමාලෝචනය රජයේ ගිවිසුම් හා ප්‍රධාන නිස්සාරක කර්මාන්ත ව්‍යාපෘති සඳහා ආණ්ඩුවලට ගෙවනු ලබන ආදායම් ගැන වාර්තා කිරීමේ වැදගත්කම හඳුනා ගත්තේ ය. මේ ගෙවීම් සිදු කරනුයේ රාජ්‍ය පාලනය ප්‍රවර්ධනය කිරීම, දූෂණය පහත හෙළීම හා එබඳු ආදායම් උචිත අයුරින් පාවිච්චි කිරීම පහසු කිරීම සඳහා ය. මේ සමාලෝචනයට ප්‍රතිචාර වශයෙන් ලෝක බැංකු පාලක මණ්ඩලය විශාල ව්‍යාපෘති වෙනුවෙන් ආණ්ඩුවලට කරන ගෙවීම් සම්බන්ධයෙන් පාරදෘශ්‍යතාව පවත්වා ගන්නා ලෙසත් මේ ගිවිසුම් මහජනයාට අදාළත්වයක් දරණ ඕනෑ ම අවස්ථාවක ප්‍රධාන ගිවිසුම්වල අදාළ කොන්දේසි අනාවරණය කරන ලෙසත් ඉල්ලා සිටියි.[2]

45. ලෝක බැංකුවේ පාලක මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩලය අනාවරණය කිරීම් ව්‍යාප්ත කිරීමට පවත්නා ශක්‍යතාවන් පිළිබඳ ව අඛණ්ඩ ව සාකච්ඡා කරයි. 2005 මාර්තු මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය *World Bank Disclosure Policy: Additional Issues, Follow-Up Consolidated Report (Revised) - ලෝක බැංකු අනාවරණය කිරීම් ප්‍රතිපත්තිය : අතිරේක ගැටලු, පසු විපරම් සම්පිණ්ඩිත වාර්තාව (ප්‍රතිශෝධිත)* නමැති මාතෘකාවෙන් යුත් පත්‍රිකාවක් අනුමත කළේ ය. මෙහි අන්තර්ගත වූ නව අනාවරණ විෂයන් 16ක් අනුමත කරන ලදි. මේවාට ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුවේ සාමාජික රටවල් සඳහා සකසන ලද රාෂ්ට්‍රීය ආධාර මූලෝපායන් පිළිබඳ ආකාරගත අනාවරණය කිරීම්; කෙටුම්පත් කරන ලද මෙහෙයුම් ප්‍රතිපත්ති නිල නො වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ බෙදා හැරි විටෙක නියාමක පදනමක් මත ඒවා නිකුත් කිරීම; හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, අයවැය ලේඛනය,කාර්ය මණ්ඩල වන්දි ලේඛනය හා කාර්ය මණ්ඩල අත්පොත යනාදිය අනාවරණය කිරීම ඇතුළත් විය.

## පාදීය සටහන්

[1] එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, *Human Development Report 2002: Deepening Democracy in a fragmented World,* නිව්යෝර්ක් : 115. http://www.undp.org/hdr2002/chapterfive.pdf වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

[2] ලෝක බැංකුව 2004, සැප්තැම්බර් 17, *World Bank Group Management Response to the Extractive Industries Review,* http://www.worldbank.org/servlet/WDS-Ibank-Servlet? pcont=details&eid000160016-2004092 1111523

## 2 වැනි උප ග්‍රන්ථය
## ක්‍රියාකාරීත්ව ඇගයීම් ආකෘතිය

| සැලසුම් සංක්ෂේපණ | දර්ශක / ඉලක්ක | අධීක්ෂණ යන්ත්‍රණ | අධීක්ෂණ යොමු ලක්ෂ්‍ය |
|---|---|---|---|
| **බලපෑම** | | | |
| ● ප්‍රවර්ධිත සංවර්ධන කාර්ය සාධකත්වය | ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍ර ප්‍රගති වාර්තා මඟින් අධීක්ෂණය කරනු ලැබේ. | | |
| **ප්‍රතිඵලය** | | | |
| ● පාර්ශ්වකරුවන් ආ. සං. බැං. කෙරෙහි තබා ඇති විශ්වාසය හා එය සමඟ කාර්ය නියුක්ත වීමට ඔවුන් සතු හැකියාව ප්‍රවර්ධනය කෙරිණි. | ● ආ. සං. බැං. පිළිබඳ ව පාර්ශ්වකරුවන් තුළ පවත්නා අවබෝධය ද ආ. සං. බැංකුවේ විවෘත භාවය, වග උත්තර සැපයීමට බැඳී සිටීම හා සහභාගිකත්වය පිළිබඳ ඔවුන්ගේ තක්සේරුව තුළ සිදු ව ඇති ප්‍රවර්ධනයන්. | ● වසර 5කට පසු ප්‍රතිපත්තිය පිළිබඳ ව සිදු කරනු ලබන සර්වග්‍රාහී සමාලෝචනය.<br><br>● මත පළ කරන නායකයන්ගේ හැඳින ගැනීමේ සමීක්ෂණ (සෑම වසර 3කට වරක්)<br><br>● සේවාදායකයන්ගේ හා හවුල්කාරිත්වයන්ගේ සමීක්ෂණ හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ ඇගයීම්. | ● බා. ස. කා. (OER)<br><br>● බා. ස. කා. (OER)<br><br>● SPD |
| **ප්‍රතිදාන (Outputs)** | | | |
| 1. ආ. සං. බැංකුවේ ප්‍රගාමී බාහිර සබඳතා | ● කළමනාකරණය විසින් ආධාර දෙන රටවලට ව්‍යාප්ත කරනු ලබන දූත මණ්ඩල සංඛ්‍යාව ඉහළ යාම<br><br>● කළමනාකරණය විසින් මාධ්‍යවලට දෙනු ලබන සම්මුඛ සාකච්ඡා සහ ව්‍යාප්ත කරනු ලැබූ ක්‍රියාකාරකම්වල 5%ක වාර්ෂික වැඩි වීමක්<br><br>● ඉහළ පෙළේ මුද්‍රිත මාධ්‍ය තුළ නිරන්තර ප්‍රකාශයට පත් වීම (එනම්, අඩු තරමින් මත පළ කරන කතුවැකි හයක් *Asian Wall Street Journal, Financial Times හා International Herald Tribune* යන පුවත්පත්වල ප්‍රසිද්ධ කෙරිණි. | ● මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව<br><br>● මාධ්‍ය අධීක්ෂණය | ● බා. ස. කා. (OER) |
| 2. ආ. සං. බැංකුවේ මෙහෙයුම් ගැන තොරතුරු ලබා ගැනීමට ඇති මාර්ග වැඩි දියුණු කිරීම. | ● රාෂ්ට්‍රීය මූලෝපාය හා වැඩසටහන සඳහාත් කලාපීය සහයෝගිතාව පිළිබඳ මූලෝපාය හා වැඩසටහන් යාවත්කාල කිරීම සඳහාත් වන මෙහෙයුම් මඟින් වර්ධනය කරන ලද සන්නිවේදන සැලසුම් සංඛ්‍යාවෙහි වාර්ෂික වැඩි වීම<br><br>● දෙවැනි වසරේ දී ආරම්භ වී ප්‍රතිපත්තියෙහි ආවරණය කිරීමේ අවශ්‍යතා නිසි පරිදි ක්‍රියාත්මක වී නො තිබිය දී පැමිණිලිවල වාර්ෂික අඩු වීමක් | ● තොරතුරු ඒකකයේ වාර්තා හා මහජන සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳ වාර්ෂික වාර්තාව<br><br>● මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටු වාර්තා හා මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව<br><br>● තොරතුරු ඒකකයේ වාර්තා හා මහජන සන්නිවේදන ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාව | ● බා. ස. කා. (OER)<br><br>● බා. ස. කා. (OER)<br><br>● බා. ස. කා. (OER) |

| සැලසුම් සංක්ෂේපණ | දර්ශක / ඉලක්ක | අධීක්ෂණ යන්ත්‍රණ | අධීක්ෂණ යොමු ලක්ෂ්‍ය |
|---|---|---|---|
| | • 1 වැනි වසර අවසානයේ ව්‍යාපෘතිවලින් 50%ක් සඳහා ද 2 වැනි වසර අවසන් වන විට ව්‍යාපෘතිවලින් 100%ක් සඳහා ද ව්‍යාපෘති / වැඩසටහන් තොරතුරු ලේඛන නිර්මාණය කෙරිණි. | | |
| | • නේවාසික දූත මණ්ඩලවලට හා නියෝජිත කාර්යාලවලට ඉදිරිපත් කරනු ලබන විවේචනාත්මක මත දැක්වෙන කාඩ් පත්වල සඳහන් වන පරිදි මහජන තෘප්තිය ප්‍රවර්ධනය කිරීම.<br>• කැලැන්ඩර දින 30ක් ඇතුළත සපුරාලන ලද තොරතුරු සඳහා වූ ඉල්ලීම්වල ප්‍රතිශතය<br>• අනාවරණය කිරීමේ අවශ්‍යතාවන් සමඟ 100%ක අනුකූලතාවක් | • විවේචනාත්මක මත දැක්වෙන කාඩ්පත් සමීක්ෂණය<br>• තොරතුරු ඒකකයේ වාර්තා හා මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව<br>• තොරතුරු ඒකකය හා මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තා මඟින් නියැදි ලබා ගැනීම | • RMs, ROs සහ OER |
| **ක්‍රියාකාරකම්** | | | |
| 1.1 බාහිර සබඳතා සඳහා වන ප්‍රතිපත්තියෙහි දැක්වෙන මූලෝපාය සඳහා ක්‍රියාමාර්ගික සැලැස්මක් සූදානම් කිරීම | • ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස 3ක් ඇතුළත | • ක්‍රියාමාර්ගික සැලැස්ම හා ප්‍රගති වාර්තාව | • බා. ස. කා. (OER) |
| 1.2 සංවිධානමය ව්‍යුහය නැවත පෙළ ගැස්වීම හා බාහිර සබඳතා පිළිබඳ ව නව මූලෝපායික මඟ පෙන්වීම්වලට සහාය වීමට නිපුණතා මුසුව පෙළ ගැස්වීම | • ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස 3ක් ඇතුළත | • පිරිපහදු කරන ලද විධිවිධාන සඳහා කළමනාකරණයෙහි අනුමතිය | • BPMSD බා. ස. කා. (OER) |
| 1.3 මාධ්‍ය මෙහෙයුම් ප්‍රතිපත්ති යාවත්කාල කිරීම | • ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස 4ක් ඇතුළත කාර්ය මණ්ඩලයට බෙදා හැරීම | • මෙහෙයුම් ප්‍රතිපත්ති නිකුත් කිරීම | • බා. ස. කා. (OER) |
| 2.1 තොරතුරු ඒකකය ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම | • ප්‍රතිපත්තිය අනුමත කිරීමෙන් මාස 3ක් ඇතුළත | • මහජන සන්නිවේදන ප්‍රතිපත්තියේ වාර්ෂික වාර්තාව | • බා. ස. කා. (OER) |
| 2.2 මහජන අනාවරණය කිරීම් පිළිබඳ උපදේශක කමිටුව ස්ථාපනය කිරීම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දිනය වන විට | • මහජන සන්නිවේදන ප්‍රතිපත්තියේ වාර්ෂික වාර්තාව | • බා. ස. කා. (OER) |
| 2.3 ප්‍රතිපත්තිය පිළිබඳ කාර්ය මණ්ඩල අත්පොත සකස් කර බෙදා හැරීම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දිනය වන විට කාර්ය මණ්ඩලයට බෙදා හැරීම | • අත්පොත නිකුත් කිරීම | • බා. ස. කා. (OER) |
| 2.4 ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ලියන ලද ණය ගැනුම්කරු හා අනුග්‍රාහක අත්පොත සකස් කර බෙදා හැරීම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දිනයේ සිට මාස 6ක් ඇතුළත | • අත්පොත නිකුත් කිරීම | • බා. ස. කා. (OER) |
| 2.5 අනාවරණය කිරීම් පිළිබඳ අවශ්‍යතා සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යාම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දින පටන් එක් වසරක් ඇතුළත සියලු ම දූත මණ්ඩල නායකයන්ට හා ව්‍යාපෘති විශ්ලේෂකයන්ට | • තොරතුරු ඒකකයේ අධීක්ෂණ වාර්තා<br>• මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව | • බා. ස. කා. (OER) |
| 2.6 සංචිත පුස්තකාල වැඩසටහන සමාලෝචනය කිරීම හා සාමාජික රටවල් තුළ මහජන තොර-තුරු මධ්‍යස්ථාන උසස් මට්ටමකට පත් කිරීම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දින පටන් එක් වසරක් ඇතුළත | • සමාලෝචන පත්‍රිකාව<br>• මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව | • බා. ස. කා. (OER) |

| **සැලසුම් සංක්ෂේපණ** | **දර්ශක / ඉලක්ක** | **අධීක්ෂණ යන්ත්‍රණ** | **අධීක්ෂණ යොමු ලක්ෂ්‍ය** |
|---|---|---|---|
| 2.7 ඉහත දැක්වෙන සමාලෝචනය පදනම් කර ගෙන සාමාජික රටවල් තුළ මහජන තොරතුරු මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම/උසස් මට්ටමකට පත් කිරීම | • ප්‍රතිපත්තිය බලාත්මක වන දින පටන් වසර 2ක් ඇතුළත | • මහජන සන්නිවේදන ප්‍රතිපත්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව | • බා. ස. කා. (OER) |

ආ. සං. බැං = ආසියානු සංවර්ධන බැංකුව, BPMSD = අයවැය, පිරිස් හා කළමනාකරණ පද්ධති දෙපාර්තමේන්තුව, බා. ස. කා (OER) = බාහිර සබඳතා කාර්යාලය, SPD = මූලෝපාය හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, RM = නේවාසික දූත මණ්ඩල, RO = නියෝජිත කාර්යාල